

# ශ්‍රී ලංකා ජනරජයේ
# යෝජිත
# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නාගානන්ද කොඩිතුවක්කු

9 වන සංස්කරණය

# ශ්‍රී ලංකා ජනරජයේ

# යෝජිත

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නාගානන්ද කොඩිතුවක්කු

9 වන සංස්කරණය

# ශ්‍රී ලංකා ජනරජයේ

# යෝජිත

# ජනරජ ව්‍යවස්ථාව

---

ජනතාවගේ පරම අධිකාරී බලය

ක්‍රියාත්මක කරමින්

ජනතා සහභාගීත්වයෙන් සම්පාදනය

කර ජනතාව වෙනුවෙන්, එම ජනතාව

විසින්ම සම්මත කිරීම සඳහා මෙසේ

පිළිගැන්වේ.

# ශ්‍රී ලංකා ජනරජයේ
# යෝජිත ජනරජ ව්‍යවස්ථාව

නාගානන්ද කොඩිතුවක්කු

9 වන සංස්කරණය

2022 ජනවාරි මස 01 වන දින.


**සම්පාදනය:**

**නාගානන්ද කොඩිතුවක්කු**
**99, සුභද්‍රාරාම පාර,**
**නුගේගොඩ**
**10250**



මුද්‍රණය:

අනගි පොත් ප්‍රකාශකයෝ
ෆර්න් ලංකා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 28A, දෙහිවල පාර, බොරලැස්ගමුව.
දුරකථන - 0112 198 196

# හැඳින්වීම

නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, ප්‍රබල සිවිල් සමාජයක පැවැත්ම සහතික කරන බලවත්ම සාධකය වන්නේය. එය පිළිනොගන්නා රටක ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයක් නැත. නීතිය යටපත් වූ රටක 'නීතිය හමුවේ සියල්ලන් සමාන වන්නේය - සැමට නීතියේ රැකවරණය සමානව ලැබෙන්නේය' යන්න හුදෙක් වචන මාත්‍රයක් පමණක් වන්නේය.

වසර 1948 දී බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ පාලනය ස්වදේශිකයන්ට භාර දීමෙන් පසුව, ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය සහ ජනතාව සතු පරම අධිකාරි බලය යන සංකල්ප හුදෙක් වචනයට පමණක් සීමා විය. වත්මන් යුගය වන විට ආයතන ගත දූෂණය පිළිකාවක් මෙන් උඩු දුවා ඇත. පීඩිත ජනයා සූරාකෑම මේ වන විට තව තවත් වේගවත් වෙමින් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ වන විට හුදෙක් කඩදාසි කැබැල්ලකට පමණක් සීමා වී ඇත. ව්‍යවස්ථා සංශෝධන බහුතරයක් සිදු වී ඇත්තේ සමාජ ප්‍රගමනයට හෝ පොදු යහපතට නොව දූෂිත පාලකයන්ගේ පුද්ගලික ලාභ අපේක්ෂා සාක්ෂාත් කරගැනීම වෙනුවෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර නීතියේ අධිපත්‍යය ආරක්ෂා කිරීම පැවරී ඇත්තේ මේ රටේ අධිකරණයට හා රාජ්‍ය පාලන යාන්ත්‍රණය වෙතය. ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ආයතන, බලතල බෙදීමේ සිද්ධාන්තය ගරු නොකරන කල්හි අධිකරණයේ ස්වාධීනත්වය යටපත් වී අධිකරණය ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ ග්‍රහණයට පත්වීම සාමාන්‍ය දෙයකි. එවිට සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය බිඳවැටී ජනතාව සතු සම්පත් දූෂිත රාජ්‍ය පාලකයින් විසින් නිදහසේ මංකොල්ල කෑම තීව්‍ර වේ. ප්‍රෞඪ අතීතයකට හිමිකම් කියූ රටක යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය දේශපාලනීකරණය වීමේ ප්‍රතිවිපාක අද සමස්ථ ජනතාව භුක්ති විඳිමින් සිටී. රටේ ප්‍රගමනයට ගැලපෙන ප්‍රබල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීම කාලින අවශ්‍යතාවයක් වී ඇත්තේ එහෙයිනි.

ඕනෑම රටක එවැනි දූෂිත රාජ්‍ය පාලනයන්ට එරෙහිව පළමුවෙන්ම නැගී සිටින්නේ තරුණ පරපුරයි. එය තාරුණ්‍යයේ ස්වභාවයයි. 1971 දී සහ 1989 දී එසේ තම අයිතීන් දිනාගැනීමට නැගී සිටි දකුණේ තරුණයින් ලක්ෂයක පමණ පිරිසක් ඝාතනය කරනු ලැබිණ. අසාධාරණයට එරෙහිව නැගී සිටි උතුරේ අවිගත් දස දහස් ගණනක තරුණ ජීවිත වලට ද අත්වූයේද එම ඉරණම මය. එම කැරලි මර්දනය කිරීමට යොදවන ලද රාජ්‍ය ආරක්ෂක හමුදාවල තරුණ සොල්දාදුවන්ගේ ජීවිතද දහස් ගණනකගේ ජීවිත ද ඒ අයුරින්ම රටට අහිමි විය. ප්‍රශස්ත දැක්මකින් තොර පාලකයන්ගේ වරදින් මුළු මහත් තරුණ පරම්පරාවක් මවුබිමට අහිමි වීම පරාජිත රටක් හැටියට කම්පා විය යුතු මොහොතක් මිස, ආඩම්බරයෙන් සැමරිය හැකි අවස්ථාවක් නොවන්නේය.

රාජ්‍ය පාලන ක්‍රමවේදයන් ගැන දැනුමක්, අවබෝධයක් නොමැති ජනතාවක් දූෂිත පාලකයින්ට මහත් අස්වැසිල්ලක් හා ආශිර්වාදයක් වන්නේය. අගනා සම්පත් වලින් අනූන දිවයිනක් වූ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තවදුරටත් තීව්‍ර වී ඇත. බහුතර ජනතාව අද, නිද්‍රාශීලී තත්වයට පත් වී ඇත. දැනට සිදුවෙමින් පවතින්නේ උතුරේත්, දකුණේත්, නැගෙනහිරත්, බටහිරත් අසරණ වූ ජනතාව විවිධ පිල් වලට බෙදෙමින්, දූෂණය අඩු යැයි ඔවුන් පිළිගන්නා දේශපාලන පක්ෂ වෙත ඇදීයාමයි. එසේ නොමැති නම් ඔවුහු බලහත්කාරයෙන් විවිධ දේශපාලන කඳවුරු වෙත නිරායාසයෙන් යොමු කෙරේ. වසර 72 ක් පුරා සමස්ත රාජ්‍ය තුළ නොකඩවා සිදුවෙමින් පවතින්නේ එයයි.

මෙම අතිශයින් දූෂිත ක්‍රමවේදය පෝෂණය කරමින්, මහජන විශ්වාසය කඩ කරමින්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයට අරක්ගෙන සිටි සහ අරක් ගත් සියලුම අපරාධකරුවන්ට එරෙහිව, රටේ නීතිය ක්‍රියාත්මක කරනු වස් නීතිඥ නාගානන්ද 2009 වසරේ සිට, නියත ජීවිත අවදානම පසෙක ලා දැඩි අධිෂ්ඨානශීලී සටනක් දියත් කළේ කිසියම් හෝ වෙනසක් ඒ තුළින් දැකිය හැකි වෙතැයි යන ඒකායන විශ්වාසයෙනි. එහෙත් පවතින ක්‍රමවේදය කෙතරම් දූෂිත වන්නේද යත් එමගින් ජනතාවට යුක්තියක් ඉටු වෙතැයි සිතීම පවා දුෂ්කර බව ඔහු අත්දුටුවේය. රාජ්‍ය සේවයේ සහ නීතිඥ වෘත්තියේදී මුහුණ දුන් කටුක අත්දැකීම් මත,

මාතෘ භූමිය මෙම භේදවාචකයෙන් මුදවා ගැනීමට වෙන විකල්ප ක්‍රමවේදයක් ගැන සිත් යොමු කිරීමට ඔහුට සිදුවුයේ ඉන් පසුවය.

දැනට පවතින පාර්ලිමේන්තු ක්‍රමවේදය තුළ  නීතියේ ආධිපත්‍යය හා  අධිකරණයේ ස්වාධීනත්වය ස්ථාපිත කෙරෙන, විනිවිද භාවය, වගවීම එනයින්ම සහතික කෙරෙන නව ව්‍යවස්ථාවක් සම්පාදනය කොට සම්මත කරනු ඇතැයි කිසිදා අපේක්ෂා කළ නොහැකි බව ප්‍රඥාවන්ත ජනතාව විසින් පසක්  කළයුතු වේ. ඒ අනුව එම උතුම් අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන්නේ ජනතා පරමාධිපත්‍යය, නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය සහ සියලුම ජන වර්ග අතර ලේ වැගිරීමකින් තොරව සමානාත්මතාව තහවුරු කෙරෙන ප්‍රවේශයක් හඳුන්වාදීමය. ඒ හැර මාතෘ භූමිය ගලවා ගැනීමට වෙනත් කිසිදු ක්‍රමවේදයක් නැත.

විද්වත් මණ්ඩලයක් විසින් ජනතා අදහස් විමසා, සම්පාදනය කරන ලද, ජනතාව විසින්ම ආඩම්බරයෙන් හා ගෞරවයෙන් පිළිගෙන සම්මත කිරීම සඳහා යෝජනා කර ඇති මෙම ජන සම්මත ව්‍යවස්ථාව එවැනි  සාමුහික ව්‍යායාමයක අවසාන ප්‍රතිඵලය වන්නේය.

මෙම ජන සම්මත ජනරජ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී දැනට ශ්‍රී ලංකාව තුළ  ක්‍රියාත්මක වන සහ ක්‍රියාත්මක වූ සියලුම ව්‍යවස්ථා සහ විවිධ රටවල විද්වත් දේශපාලන  විද්‍යා විශාරදයන් විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥාප්තියේ මුලධර්ම හා සංකල්ප ගුරුකොට ගනිමින් හඳුන්වා දී ඇති සියලුම ප්‍රගතිශීලී ව්‍යවස්ථාවන් අධ්‍යනය කෙරිණ. එමෙන්ම ජනතාව විසින් ඉදිරිපත් කරන යෝජනා මේ වන තුරු ඉතා විවෘතව, ඉතා පුළුල් අන්දමින් දායක කරගනු ලැබිණ. ඒ අනුව සියලුම ජන වර්ග වලට සමානව සැලකීම, ජනතාව විසින් තම පරම අධිකාරී බලය පවරා ඇති සියලුම තැනැත්තන් සහ ආයතන, නීති ප්‍රකාරව, විනිවිද භාවය ආරක්ශා කරමින්, ජනතාව සතු පරම අධිකාරි බලය ගරු කරමින් ඉටු කරන බවට වග බලාගැනීම සඳහා වගකීම පැවරෙන සියලුම ප්‍රතිපාදන නව යෝජිත


ජනරජ ව්‍යවස්ථාවට ඇතුලත් කර ඇත. සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාව එකම රටක, එකම නීතියකට යටත්, එකම ජාතියක් ලෙස සැලකෙන යෝජිත ජන සම්මත ජනරජ ව්‍යවස්ථාවේ නමවන සංස්කරණය මෙසේ ජනතාව වෙත ඉදිරිපත් කෙරෙයි.

මෙම උත්තරීතර කාර්යයෙහි ලා නන් අයුරින් ආධාර උපකාර කළ පිරිස් බොහෝය. ඒ සියලුදෙනා මෙහිදී සිහිපත් කෙරෙන අතර ඒ සැමට නාගානන්දගේ ගෞරවය නිතැතින්ම පුද කෙරේ. එමෙන්ම අවශ්‍ය සෑම අවස්ථාවකදීම නිසි මග පෙන්වා දුන් නීති විද්‍යාලයේ හිටපු විදුහල්පති ආචාර්ය ජෝ සිල්වා, ව්‍යවස්ථා නීතිය සහ පරිපාලන නීතිය පිළිබඳ විශාරද ආචාර්ය සුනිල් කුරේ, හිටපු අග්‍රාමාත්‍ය ලේකම් වී. කේ. නානායක්කාර සහ ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස් යන මහත්වරුන්ට ද විශේෂ කෘතඥතාව හිමිවේ.

අනේකවිධ දුෂ්කරතා රැසක් මධ්‍යයේ, බලවත් උපේක්ෂාවකින් මා දිරිමත් කල මාගේ දයාබර බිරිඳ ශ්‍යාමලී කොඩිතුවක්කු මහත්මියට ද ස්තුතිය මෙයින් හිමි වේ.



නාගානන්ද කොඩිතුවක්කු
2022 ජනවාරි මස 01 වන දින දිය.



# පූර්විකාව

ශ්‍රී ලංකා ජනරජයේ පරම අධිකාරිය වන අපි
අපගේ ඒකායන අභිප්‍රාය වූ, එකම නීතියක් මත පදනම් වූ
නොබිඳිය හැකි එකම රටක් එකම ජාතියක් වශයෙන් නැගී
සිටීමේ අභිලාශය සාක්ෂාත් කරන

අප සතු පරම අධිකාරී බලය, නීතියේ ආධිපත්‍ය, අධිකරණයේ
ස්වාධීනත්වය සහ සහජීවනය තහවුරු කරන

සමාජ සාධාරණත්වය, මානව හිමිකම් සහ නන් වැදෑරුම්
නිදහස භුක්ති විඳීමට අපට ඇති අයිතිය බලගන්වන
සහ ප්‍රවර්ධනය කරන

ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අපේ ව්‍යවස්ථාදායක
බලය සෘජුව ක්‍රියාත්මක කරමින් ජනරජයේ උත්තරීතර නීතිය
ලෙස ආඩම්බරයෙන් සහ ගෞරවයෙන් පිළිගෙන මෙසේ
සම්මත කරමු.

# පටුන


| | | | |
|---|---|---|---|
| I | පරිච්ඡේදය - | ජනතා පරමාධිපත්‍ය හා ජනරජය | 10 |
| II | පරිච්ඡේදය - | මූලික අයිතිවාසිකම් | 12 |
| III | පරිච්ඡේදය - | රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම | 20 |
| IV | පරිච්ඡේදය - | භාෂාව | 25 |
| V | පරිච්ඡේදය - | පුරවැසිභාවය | 28 |
| VI | පරිච්ඡේදය - | ව්‍යවස්ථාදායකය | 29 |
| VII | පරිච්ඡේදය - | විධායකය | 44 |
| VIII | පරිච්ඡේදය - | අධිකරණය | 69 |
| IX | පරිච්ඡේදය - | රාජ්‍ය මූල්‍ය | 93 |
| X | පරිච්ඡේදය - | විගණකාධිපති | 99 |
| XI | පරිච්ඡේදය - | මහජන ආරක්ෂාව | 104 |
| XII | පරිච්ඡේදය - | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 107 |
| XIII | පරිච්ඡේදය - | ඡන්ද බලය හා මැතිවරණය | 109 |
| XIV | පරිච්ඡේදය - | ජනමත විචාරණය | 130 |
| XV | පරිච්ඡේදය - | නීතිපති | 133 |
| XVI | පරිච්ඡේදය - | ස්වාධීන පොලිස් කොමිෂන් සභාව | 135 |
| XVII | පරිච්ඡේදය - | ස්වාධීන ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 139 |
| XVIII | පරිච්ඡේදය - | පොදු විධිවිධාන | 144 |
| XIX | පරිච්ඡේදය - | අන්තර්කාලීන විධිවිධාන | 148 |
| XX | පරිච්ඡේදය - | අර්ථ නිරූපනය | 153 |
| I වන උපලේඛනය | - | පරිපාලන දිස්ත්‍රික්කවල නාම ලේඛනය | 155 |
| II වන උපලේඛනය | - | ජාතික කොඩිය | 156 |
| III වන උපලේඛනය | - | ජාතික ගීය | 157 |
| IV වන උපලේඛනය | - | දිවුරුම් ප්‍රකාශය | 158 |
| V වන උපලේඛනය | - | ශ්‍රී ලංකාවේ පළාත් දහය | 159 |

## I වන පරිච්ඡේදය

## ජනතා පරමාධිපත්‍ය හා ජනරජය

1. ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන ජනරජයකි. නොබෙදිය හැකි ඒකීය රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව **ශ්‍රී ලංකා ජනරජය** වශයෙන් හඳුන්වනු ලබන්නේය. ජනරජයේ රාජ්‍ය පාලනය බෞද්ධ දර්ශනය මත පදනම් වේ.

2. ශ්‍රී ලංකා ජනරජයේ **පරමාධිපත්‍ය බලය** ජනතාව සතු වන්නේය. එය කිසිවකුට උදුරා ගත නොහැක්කේය. ජනතා පරමාධිපත්‍ය බලයට ව්‍යවස්ථාදායක බලය, විධායක බලය, අධිකරණ බලය, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුලත් වන්නේය. ජනතා පරමාධිපත්‍ය බලය බලගැන්වීමේදී සෑම ආයතනයක්ම බලතල බෙදීමේ සිද්ධාන්තය ගරුකළ යුත්තේය.

3. ජනතාව සතුවන නීති පැනවීමේ **ව්‍යවස්ථාදායක බලය**, ජනතාව විසින් සෘජුවමද නීතියෙන් පනවා ඇති සීමා වලට යටත්ව, ජනතාව ඡන්දයෙන් පමණක් පත්කරන ලද මහජන මන්ත්‍රීන්ගෙන් සැදුම් ලත් පාර්ලිමේන්තුව විසින්ද, ක්‍රියාත්මක කරනු ලබන්නේය.

4. ජනතාව සතුවන **විධායක බලය**, නීතියෙන් පනවා ඇති සීමා වලට යටත්ව, ජනතාව තෝරා පත්කරන අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේය.

5. ජනතාව සතුවන **අධිකරණ බලය**, නීතියෙන් පනවා ඇති සීමා වලට යටත්ව, ජනතාව සතුවන උදුරාගත නොහැකි පරමාධිකාරී බලයට ගරු කිරීමට යටත්ව අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේය.

6. ජනතාව සතුවන **මුලික අයිතිවාසිකම්** පිළිගෙන ගරු කිරීමටත්, ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය. එම වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ගරු කරමින් ඉටු කරන බවට වග බලා ගැනීම සියලුම **විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල** වගකීම වන්නේය.

7. වයස අවුරුදු 18 සම්පූර්ණ කර ඇති ඡන්දහිමි නාම ලේඛනයේ නම ලියාපදිංචි වී ඇති සෑම පුරවැසියකුටම **ඡන්ද බලය** ක්‍රියාත්මක කල හැක්කේය.

8. **ශ්‍රී ලංකා ජනරජය** පළමු උපලේඛනයෙහි දැක්වෙන පරිපාලන දිස්ත්‍රික් විසි පහෙන් සහ දේශීය ජල තීරයෙන් සමන්විත වන්නේය.

9. ශ්‍රී ලංකා ජනරජයේ **ජාතික කොඩිය** දෙවැනි උපලේඛනයේ දැක්වෙන පරිදි වන්නේය.

10. ශ්‍රී ලංකා ජනරජයේ **ජාතික ගීය** තුන්වැනි උපලේඛනයේ දැක්වෙන පරිදි වන්නේය.

11. **ශ්‍රී ලංකා ජනරජයේ ජාතික දිනය** ජන සම්මතවාදය පදනම් වූ රාජ්‍ය පාලනයක් ස්ථාපිත කරමින් ශ්‍රී ලාංකික ජනතාව විසින් තම ව්‍යවස්ථාදායක බලය සෘජුවම ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජන සම්මත ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් අනතුරුව අග්‍රාමාත්‍යවරයා විසින් එය බලගැන්වූ මස දින වන්නේය.

## II වන පරිච්ඡේදය

## මූලික අයිතිවාසිකම්

12. සෑම තැනැත්තෙකුටම තම ජීවිතයට, ආත්ම ගෞරවයට සහ ආත්ම අභිමානයට, නිදහසට සහ ආරක්ෂාවට අයිතිය ඇත්තේය.

13. (අ) සෑම තැනැත්තෙකුටම සිතීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස, තමන් කැමති ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ඇත්තේය.

(ආ). සෑම තැනැත්තෙකුටම රාජ්‍ය ආරක්ෂාවට අවදානමක් වන බව ප්‍රකාශිතව සඳහන් නොවන රජය සතු ඕනෑම තොරතුරක් ලබාගැනීම සඳහා විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කල දින සිට දින 14 ක් තුල එම තොරතුරු ලබා ගැනීමට අයිතිය ඇත්තේය.

14. සෑම පුරවැසියකුටම සාමකාමීව රැස්වීමේ සහ සමාගමයේ නිදහස ඇති අතර යම් සංගමයකට එක්වීම සඳහා කිසිම තැනැත්තෙකුට බල කල නොහැක්කේය.

15. නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය. පුරවැසියන් දෙදෙනෙක් අසමාන සැලකීමකට භාජනය කල නොහැක්කේය.

16. කිසිම තැනැත්තෙකු නීතියේ විධිවිධාන සලසා ඇති ආකාරයට මිස අත් අඩංගුවට නොගත යුත්තේය. එසේ අත් අඩංගුවට පත් වන සෑම තැනැත්තෙකුටම තමන් අත්අඩංගුවට ගැනීමට හේතුව ලිඛිතව සහ විධිමත්ව දැක්විය යුත්තේය.

17. යම් තැනැත්තෙකුගේ පුද්ගලික නිදහස අවහිර කරමින් ඔහුව අත් අඩංගුවට ගනු ලැබීමට නීතියෙන් බලය පවරා ඇති බලධරයකුගේ අත් අඩංගුවට පත්වන සෑම තැනැත්තෙකුටම අත් අඩංගුවේ පසුවන කාලය තුල කිසිදු ප්‍රකාශයක් නොකිරීමට මෙන්ම නීතිඥ සහාය ලබාගැනීමට අයිතිය ඇත්තේය. එසේ අත් අඩංගුවේ පසුවන කාලය තුල කිසිම සැකකරුවකුගෙන් වරද පිළිගැනීමේ පාපොච්චාරණයක් ලබාගැනීම ලබා ගැනීම සඳහා කිසිම කෘෘර හෝ අමානුෂික වද හිංසාවකට භාජනය නොකළ යුත්තේය. චූදිතයකුගෙන් ලබාගත් පාපොච්චාරණයක් නීතිය හමුවේ ඔහුට එරෙහිව වලංගු සාක්ෂියක් ලෙස පාවිච්චි කල නොහැක්කේය.

18. අත්අඩංගුවට ගනු ලබන සෑම සැකකරුවකුම අත් අඩංගුවට ගැනීමෙන් පැය 24 ක් තුල නීතියෙන් බලය පවරා ඇති බලධරයකු හමුවට පැමිණවිය යුත්තේය. සැකකරුව පරීක්ෂාවට ලක්කිරීමත්, සැකකරුට ප්‍රකාශයක් ලබාදීමට අවස්ථාවක් ලබාදීමත්, සැකකරු කෘෘර හෝ අමානුෂික වද හිංසාවකට භාජනය නොකර ඇති බවට පරීක්ෂාකර සෑහීමකට පත්වීමත්, බලධරයාගේ වගකීම වන්නේය.

19. නීතියේ විධිවිධාන පනවා ඇති ආකාරයකට මිස කිසිම සැකකරුවකු රිමාන්ඩ් භාරයට පත් නොකිරීම බලධරයාගේ වගකීම වන්නේය.

20. දින 14 ක් ඇතුලත අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ වෙනත් නීතියක් යටතේ විධිමත්ව නඩු පැවරීමකින් තොරව රිමාන්ඩ් භාරයට පත් කරන ලද සැකකරුවකු තව දුරටත් රිමාන්ඩ් භාරයට පත් නොකළ යුත්තේය. අපරාධ නඩුවක් පවරනු ලබන සැකකරුවක්ට එරෙහිව නඩු විභාග කර වසරක් ඇතුලත තීන්දු ප්‍රකාශ කිරීම අධිකරණයේ අත්හල නොහැකි වගකීම වන්නේය.

21. වරදකරු යැයි ඔප්පු කරන තෙක් සෑම තැනැත්තෙකුටම නිර්දෝශිභාවයේ පූර්ව නිගමනයට හිමිකම ඇත්තේය.

22. කිසිම තැනැත්තෙකු වරද පිළිගැනීමට පෙළඹවීම සඳහා කිසිදු ආකාරයක තර්ජනයක් හෝ පොරොන්දුවක් දීම නොකළ යුතුය.

23. අපරාධ චෝදනා මත නඩු පවරා ඇති සෑම චූදිතයටම පුද්ගලිකව හෝ නීතිඥයකු මගින් නෛතික බලය ලත් අධිකාරියක් හමුවේ කරුණු දැක්වීමට සහ සාධාරණ නඩු විභාගයක් සඳහා අයිතිය ඇත්තේය.

24. අපරාධ චෝදනා මත නඩු පවරන ලද යම් චූදිතයෙකුට එරෙහිව නඩු විභාග කර නීතියෙන් පනවා ඇති දඬුවම් පැමිණවීමට බලය පවරන ලද බලධරයකු නොවන කිසිම තැනැත්තෙකු විසින් යම් තැනැත්තෙකුට දඬුවම් නොපැමිණවිය යුත්තේය.

25. යම් ක්‍රියාවක් කරන අවස්ථාවක් එය අපරාධ වරදක් නොවන්නේ නම් එම ක්‍රියාව අපරාධ වරදක් ලෙස නීතිගත කරමින් අතීතයට ක්‍රියාත්මක වන ලෙස නීති පැනවිය නොහැක්කේය. එසේ වුවද යම් ක්‍රියාවක් ජාත්‍යන්තර සම්මුතියෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම වලට අනුව සාපරාධී වරදක් වන්නේ නම් ඒ ක්‍රියාව සම්බන්ධයෙන් නීති පැනවීම සහ නඩු විභාග කොට දඬුවම් කිරීම මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝණය කිරීමක් නොවන්නේය.

26. කිසිම තැනැත්තෙකුගේ පුද්ගලික හෝ පවුල් ජීවිතය සම්බන්ධව, ඔහු හා පිටස්තර පුද්ගලයන් අතර පැවති විද්‍යුත්, මුද්‍රිත හෝ වෙනත් මාධ්‍යයක සන්නිවේදන සහ යම් තැනැත්තෙකුට ඇති සමාජයේ පිළිගැනීමට හානි පමුණුවන ආකාරයේ කිසිදු මැදිහත්වීමක් නොකළ යුත්තේය.

27. වයෝප්‍රාප්තභාවයට පත් ගැහැනියකුට හා පිරිමියකුට ජාති, ආගම් කුල කිසිවක් නොසලකා විවාහ වීමට සහ පවුල් සංස්ථාවක් පවත්වාගන යාමට අයිතිය ඇත්තේය. විවාහයට පාර්ශවකරුවන් දෙදෙනාගේ එකඟතාවය අත්‍යවශ්‍ය වන්නේය. පවුල් සංස්ථාව සමාජයේ මූලික පදනම වන්නේය. එහෙයින් එය ආරක්ෂා කිරීමට සිවිල් සමාජයේ වගකීම වන්නේය. කිසිම පුරවැසියකු සමලිංගිකත්වය මත වෙන්කොට සැලකීමකට හෝ අශක්නුතාවයකට භාජනය නොකළ යුත්තේය. සමාජයේ පදනම වන පවුල් සංස්ථාව ආරක්ෂා කිරීමට රජය බැඳී සිටින්නේය.

28. සෑම පුරවැසියකුටම පෙරළා දිවයිනට පැමිණීමේ අයිතිය ඇත්තේය. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක දේපළ අයිතිය පුද්ගලිකව හෝ සාමූහිකව කිසිදු බාධාවකින් හෝ සීමාවකින් තොරව දැරීමේ අයිතිය සෑම පුරවැසියකුටම ඇත්තේය.

29. කිසිම තැනැත්තෙකු එකම වරදකට දෙවරක් දණ්ඩනයකට යටත් නොවිය යුත්තේය.

30. කිසිම තැනැත්තෙකු ජන වර්ගය, ආගම, කුලය, ලිංගිකත්වය මත හෝ වෙනත් කරුණක් මත කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලකට හෝ දණ්ඩනයකට යටත් නොකළ යුත්තේය. සෑම තැනැත්තෙකුටම ජීවිතය රැකගැනීම සඳහා ඇති අයිතිය පිළිගෙන ගරු කිරීම රජයේ වගකීම වන්නේය.

31. රජයක් පවත්වාගන යාමේ පදනම ජනතාව රජය කෙරෙහි දක්වන ප්‍රසාදයයි. ඒ සඳහා ජනරජයේ ජනතාවගේ ජනමතය නිදහස්ව හා සාධාරණව ප්‍රකාශ කිරීම සඳහා මැතිවරණ නීති ප්‍රකාරව, නිසි කලට මැතිවරණ පැවැත්වීම ජනරජයේ වගකීම වන්නේය.

32. සෑම පුරවැසියෙකුටම තම ආත්ම ගෞරවය සහ පෞරුෂයේ වර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා සමාජ සුභසාධන පහසුකම් වලට ආර්ථික සාමාජික හා සංස්කෘතික අයිතිවාසිකම් වලට අයිතිය ඇත්තේය.

33. සෑම පුරවැසියකුටම සේවා නියුක්ති සුරක්ෂිතතාවය සහ සාධාරණ වෘත්තීය අයිතිවාසිකම් තහවුරු කෙරෙන, නිදහසේ තෝරාගත් වෘත්තියක යෙදීමේ අයිතිය ඇත්තේය. කිසිදු වෙනසකට භාජනය නොවී ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන වැටුපක් ලැබීමට සෑම පුරවැසියකුටම අයිතිය ඇත්තේය. සතුටින්, යහපත් ජීවිතයක්, පවුල් සංස්ථාවක් පවත්වාගන යාම සඳහා ප්‍රමාණවත් සාධාරණ වේතනයක් හා සමාජ සුභසාධන පහසුකම් ලැබීමේ අයිතිය ඇත්තේය.

34. සෑම තැනැත්තෙකුටම තම වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා වෘත්තීය සමිති පිහිටුවීමට සහ වෘත්තීය සමිති වලට බැඳීමට අයිතිය ඇත්තේය.

35. වැඩ කරන කාලය සාධාරණ විය යුතු අතර එයට ප්‍රමාණවත් විවේක කාලයක් සහ වැටුප් සහිත නිවාඩු ඇතුලත් විය යුත්තේය.

36. සෑම පුරවැසියකුටම ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් ඇතුළුව නිවාස, ආහාර, ඇඳුම්, සමාජ සුබසාධන පහසුකම්, සේවා වියුක්ති සහන දීමනා, තමන්ට පාලනය කල නොහැකි හේතු මත අකර්මන්‍යතාවයකට පත්වන අවස්ථාවල හිමිවන දීමනා, වැන්දඹු දීමනා සහ වයෝවෘද්ධ දීමනා ලැබීමට හිමිකම ඇත්තේය. මාතෘත්වය, සහ ළදරු විය සමාජ සුබසාධන පහසුකම් ලැබීමට හිමිකම ඇත්තේය. නෛතික වලංගු විවාහයකින් පිට උපත ලබන දරුවන්ටද එම සියලුම රැකවරණයන් සඳහා සමාන අයිතියක් ඇත්තේය.

37. සෑම තැනැත්තෙකුටම හොඳ ජීවන තත්වයක් තහවුරු කරමින් ප්‍රමාණවත් වාතය, ජලය හා ආහාර නිවාස ඇතුලත් සමාජ සුබසාධන පහසුකම් සැලසීම රජයේ වගකීම වන්නේය. එම අයිතිය කිසිවකුට උල්ලංඝනය කල නොහැකි අයිතිවාසිකමක් වන්නේය.

38. සෑම පුරවැසියකුම නිදහස් අධ්‍යාපනයට හිමිකම ලබන්නේය. සෑම පුරවැසියෙකුම ප්‍රථමික අධ්‍යාපනය ලැබීම සහ ජාතික භාෂා දෙකෙන්ම කුසලතාවය සහ ලබාගැනීම අනිවාර්ය වන අතර එම කුසලතා මත උසස් අධ්‍යාපනයට හිමිකම් ලබන්නේය. රජය සියලුම සිසුන්ගේ උසස් අධ්‍යාපන වියදම් හා යැපුම් වියදම් සාධාරණ ආපසු අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් මත දරනු ලබන්නේය. අධ්‍යාපනයේ පදනම සමාජයට යහපත් පුරවැසියකු බිහිකිරීම වන අතර සෑම පුරවැසියකුගේම මුලික මිනිස් අයිතිවාසිකම් සහ නිදහස තහවුරු කිරීම රජයේ වගකීම වන්නේය. සියලුම ජනවර්ග අතර එකමුතුකම වර්ධනය කිරීම සඳහා සෑම ජනවර්ගයකම සංස්කෘතික අයිතීන් පිළිගැනීම ගරුකිරීම සහ වර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුගේම වගකීම වන්නේය. අධ්‍යාපනය සඳහා දරුවන් යොමුකරන මාධ්‍ය තෝරාගැනීමට දෙමාපියන්ට ඇති අයිතියට රජය මැදිහත් නොවිය යුත්තේය.

39. රජයේ අනුග්‍රහයෙන් ලබාදෙන ප්‍රවාහන පහසුකම් සහ සෞඛ්‍ය පහසුකම් ඇතුළුව වයස අවුරුදු 65 සම්පුර්ණ වූ සියලුම පුරවැසියන්ගේ ආරක්ෂාව හා සමාජ සුභසාධනය සුරක්ෂිත කිරීම රජයේ වගකීම වන්නේය.

40. නවීන විද්‍යාත්මක සොයාගැනීම්වල නිසි ඵල ප්‍රයෝජන ලැබීම ඇතුලත්ව සමාජ සංස්කෘතික වැඩ සටහන් වලට සහභාගී වීමට සෑම පුරවැසියකුටම සමාන අයිතියක්

ඇත්තේය. එසේම විද්‍යාත්මක හා සංස්කෘතික නව නිර්මාණ සඳහා ආරක්ෂාව ලැබීමට සෑම පුරවැසියකුටම හිමිකමක් ඇත්තේය.

41. මූලික අයිතිවාසිකම් සහ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම් මූලධර්ම වලින් පිළිගෙන ඇති සියලුම අයිතිවාසිකම් ව්‍යවස්ථාදායකයේ, විධායකයේ හෝ අධිකරණයේ ඕනෑම නිලයක් දරන අයකු විසින් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න අවස්ථාවක ඊට එරෙහිව මාස තුනක් ඇතුලත ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පැවරීමට ඕනෑම පුද්ගලයකුට හිමිකම ඇත්තේය.

42. වහාම බල ගැන්වීමට යටත් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පිළිබඳ නඩුවක් සහ ජන සම්මත ව්‍යවස්ථාව බලගැන්වීමේ වසර 5 කට පසුව බලගැන්වීමට යටත් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම උල්ලංඝණය කිරීම සම්බන්ධ පවරා ඇති නඩුවක නීතිඥ ගාස්තු අධිකරණයේ ගොනු කරනු ලබන පෙරකලාසියේ සඳහන් විය යුත්තේය. එවැනි නඩුවක අයකළ හැකි නීතිඥ ගාස්තුව අධිකරණය විසින් ප්‍රධානය කරනු ලබන වන්දි දීමනාවෙන් 20% ක උපරිමයකට යටත්විය යුත්තේය. එවැනි නඩු කටයුත්තකදී අධිකරණය සුදුසු යැයි සලකනු ලබන ඕනෑම සහනයක් සැලසීමේ බලය අධිකරණය සතු වන්නේය. එවැනි නඩුකරයක් නඩු පැවරූ දින සිට මාස 6 ක් තුල විභාග කොට තීන්දු ප්‍රකාශ කිරීමට අධිකරණය නීතියෙන් අත් හල නොහැකි වගකීමකට බැඳී සිටින්නේය.

43. (1). මුලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නීතියෙන් පනවන සීමා බල පැවැත්වීම ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීමකින් තොරව දින 90 ක උපරිම කාලයකට යටත් වන්නේය.

(2). ඒ සඳහා පැවැත්වෙන ජනමත විචාරණයකදී සහ වෙනත් ඕනෑම ජාතික වැදගත් කමක් ඇති කරුණක් සම්බන්ධයෙන් රජය ජනමතය මතය විචාරණ අවස්ථාවකදී ජනතාවට තම මතය ජනතාව විසින් පත්කරුනු ලබන නියෝජිතයින් මගින් ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදයක් (Liquid democracy concept) සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධ රෙගුලාසි පැනවීම මැතිවරණ කොමිසමේ වගකීම වන්නේය.

## III වන පරිච්ඡේදය

## රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම

44. රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම දස රාජ ධර්මය (දන් දීම, සිත කය හා වචනයේ සංවරය, පරිත්‍යාගය, ඍජු බව, මුදු බව, දැඩි විනය ගරුක බව, ක්‍රෝධ නොකිරීම, අවිහිංසාව, ඉවසීම, යුක්ති ගරුක බව) මත පදනම් වන්නේය. බෞද්ධ දර්ශනය හා බැඳුනු ඓතිහාසික උරුමය සහ අනෙකුත් ආගම්වල ඓතිහාසික උරුමයන් ආරක්ෂා කොට පෝෂණය කිරීමට රජය බැඳී සිටියි. සෑම ශ්‍රී ලාංකිකයෙකුටම තමන් පිළිගන්නා ආගමක් හෝ ලබ්ධියක් ඇදහීමට ඇති අයිතිය සහ ඔවුන්ගේ සංස්කෘතිය කිසිදු බාධාවකින් තොරව අනුගමනය කිරීමට සහ පෝෂණය කිරීමට ඇති අයිතිය රජය පිළිගන්නේය. තවද සභ්‍යත්වය, සංයමය, හැදියාව, හා ආචාර ධර්ම මත පදනම් වූ ප්‍රෞඪ 'ශ්‍රී ලාංකික' ජාතියක් වශයෙන් නැගී සිටීම සහතික කිරීම සඳහා ජාතික අභිමානය සහ ජාතික සමගිය ඔද වැඩීමට රුකුල් දෙන මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ඛාව ප්‍රගුණ කිරීම ශ්‍රී ලාංකිකයකුගෙන්ම අපේක්ෂා කෙරෙන්නේය.

45. තමා තෝරාගත් වෘත්තියක හෘද සාක්ෂිය ගරු කරමින් යෙදීම සෑම පුරවැසියකුගේම වගකීම වන්නේය. රාජ්‍ය දේපල අවභාවිත කිරීමට එරෙහිව නැගී සිටීම නීතියේ ආධිපත්‍ය සහ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීම සෑම පුරවැසියකුගේම වගකීම වන්නේය.

46. විවිධ ආගම් හා ජාතීන් නියෝජනය කරන සියලුම ශ්‍රී ලාංකිකයින් අතර අන්‍යෝන්‍ය සබඳතාව හා එකමුතුකම තහවුරු කරමින් එකම ජාතියක් වශයෙන් නැගී සිටීම තහවුරු කිරීම සඳහා සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂාවන්

හැදෑරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලසීම රජයේ වගකීම වන්නේය. සෑම පුරවැසියකුම ජාතික භාෂා දෙකම සහ පොදු භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ලබා සිටීම අනිවාර්ය වන්නේය.

47. ජනතාව පමණක් සතුවන ජනරජයේ පරම අධිකාරී බලය, මූලික අයිතිවාසිකම්, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම, බලතල බෙදීමේ සිද්ධාන්තය, විශ්වාසවන්තභාවය පිළිබඳ සිද්ධාන්තය, වගවීම සහ පරිදෘශ්‍යභාවය, නීතියේ ආධිපත්‍ය සහ අධිකරණයේ ස්වාධීනත්වය පිළිගෙන ගරු කිරීම ජනරජයේ වගකීම වන්නේය.

48. ළමුන්ගේ සහ යෞවනයින්ගේ මානසික සහ ශාරීරික සෞඛ්‍ය, ආගමික සහ සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කිරීම සහ දරුවන්ගේ ශ්‍රමය සූරාකෑමට සහ කිසිදු ආකාරයක වෙනසකට භාජනය නොකළ යුත්තේය. ඊට එරෙහිව විශේෂ නීතිමය රැකවරණය සැලසීම රජයේ වගකීම වන්නේය.

49. (1). ආර්ථික හා සාමාජික වරප්‍රසාදයන් කේන්ද්‍රගත වීම වැලක්වීමට පියවර ගැනීම, සමාජ විෂමතාවයන් සහ ශ්‍රම සූරාකෑම පිටුදැකීමට පියවර ගැනීම රජයේ වගකීම වන්නේය.

(2). රාජ්‍ය බදු ප්‍රතිපත්තිය පිළිගෙන ගරු කිරීම සෑම පුරවැසියකුගේම යුතුකම හා වගකීම වන්නේය. රාජ්‍ය බදු ප්‍රතිපත්තිය බලගැන්වීමට එරෙහිව ඕනෑම ආකාරයක මැදිහත්වීමක් කරන අයකු වසර 3 දක්වා සිර දඬුවම් නියම කෙරෙන බරපතළ වරදකට වරදකරු වන්නේය.

(3). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට පටහැනිව විධායකයේ, ව්‍යවස්ථාදායකයේ හෝ අධිකරණයේ යම් තැනැත්තෙකු විසින් තමන් දරන ධූරය අවභාවිතා කරන්නේ නම්, ඒ පිළිබඳව වහාම ජනතාව දැනුවත් කිරීමට රාජ්‍ය සේවයේ සෑම නිළධාරියෙකුටම අත්හල නොහැකි අයිතියක් හා වගකීමක් පැවරෙන්නේය.

50. පොදු යහපතට හානිකරන නිෂ්පාදන සම්පත් එක්තැන්වීම වැලක්වීමට පියවර ගැනීම රජයේ වගකීම වන්නේය.

51. සෑම පුරවැසියකුටම තම ආත්ම ගරුත්වය, ආත්ම අභිමානය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිදහස සහතික කිරීම රජයේ වගකීම වන්නේය. සෑම පුරවැසියකුටම සමාජ සුභ සාධන සේවා සහ පහසුකම් සැපයීම සහ දුගී බව තුරන් කිරීම රජයේ වගකීම වන්නේය.

52 (1). විදේශ රාජ්‍යයන් සමග ඇතිකර ගන්නා සියලු විදේශ ගිවිසුම් සහ එම ගිවිසුම් වල අන්තර්ගතය සහ ජනරජයේ වගකීම් පිළිබඳව නොවලහා ජනතාව දැනුවත් කිරීම රජයේ වගකීම වන්නේය. පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීන්ද ඇතුළුව තුනෙන් දෙකක බහුතරයක් විසින් පිළිගෙන සම්මත නොකර රජය විසින් එළඹෙන කිසිදු ජාත්‍යන්තර ගිවිසුමක් බලාත්මක නොවන්නේය.

(2). පොදු යහපතට අහිතකර එවැනි ඕනෑම ගිවිසුමක් පුරවැසියකුට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කල හැක්කේය.

53 (1). මතු හා වර්තමාන පරපුරේ උරුමය සේ සැලකෙන සොබාදහම සහ පරිසරය ආරක්ෂා කිරීම රජයේ වගකීම වන්නේය.

(2). නීති විරෝධීව අත්පත්කර ගෙන ඇති සියලුම රජයේ දේපල (රක්ෂිත වනය හා අවශේෂ කැලෑ ඇතුලත්ව) නීතිය ක්‍රියාත්මක වීමෙන් රාජසන්තක වන්නේය. එවැනි දේපළ නැවත අත්පත් කරගැනීමට පියවර ගැනීම සහ රජයේ දේපළට සිදුකර ඇති හානියට වගකිව යුතු තැනැත්තන්ගෙන් නොපමාව වන්දි අයකර ගැනීමට පියවර ගැනීම ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ වගකීම වන්නේය.

54. සියලුම වන සතුන් සහ හීළෑ කල සතුන්ට හිංසා පීඩා කිරීම වැලක්වීමට පියවර ගැනීම සහ සතුන් කෲර අමානුෂික වදහිංසා වලට ලක්කිරීම වැලක්වීමට පියවර ගැනීම රජයේ වගකීම වන්නේය.

55. (1). ජනරජයේ සහ ජනරජයේ ජනතාවගේ පොදු යහපතට සහ සුභ සිද්ධියට අයහපත් කොන්දේසි වලට යටත්ව ජනතාවගේ දැනුමෙන් තොරව එළඹි සියලුම ජාත්‍යන්තර ගිවිසුම් අවලංගු කිරීමට පියවර ගැනීම රජයේ වගකීම වන්නේය.

(2). 2002 ජුලි 02 වන දින සිට බලාත්මක වන එක්සත් ජාතීන්ගේ රෝම ප්‍රඥාප්තිය වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව තුල අනාගතයට බලපාන ලෙස ක්‍රියාත්මක වන්නේය.

(3). නීති විරෝධීව අත්පත්කරගෙන ඇති රජයේ දේපල (රක්ෂිත වනය සහ අවශේෂ කැලෑ ඇතුලත්ව) නීතිය ක්‍රියාත්මක වීමෙන් රාජසන්තක වන්නේය. එම දේපළ නැවත අත්පත් කරගන්නා අවස්ථාව වන විට එකී දේපළට සිදුකර ඇති හානිය පූර්ණය කිරීමට වන්දි අයකරගැනීමට යටත්ව එම දේපළ කඩිනමින් අත්පත්

කරගැනීමට පියවර ගැනීම ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ වගකීම වන්නේය.

56. ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගේ පොදු යහපතට වැදගත්වන සියලුම ජාත්‍යන්තර ගිවිසුම් පිළිගෙන අනාගතයට බලපාන ලෙස බලාත්මක කිරීමට පියවර ගැනීම රජයේ වගකීම වන්නේය.

## VI වන පරිච්ඡේදය

## භාෂාව

57. සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාවේ නිල හා ජාතික භාෂා වන අතර ඉංග්‍රීසි භාෂාව පොදු භාෂාව (link) වන්නේය. මෙම පරිච්ඡේදයේ භාෂාව සම්බන්ධ දක්වා ඇති විධිවිධාන බලාත්මක කිරීමට පාර්ලිමේන්තුව, විධායකය සහ අධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

58. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට, පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකුට ඕනෑම ජාතික භාෂාවෙන් කටයුතු කල හැක්කේය.

59. (1) ඕනෑම අයකුට තමන් අභිමත ජාතික හෝ නිල භාෂාවකින් හෝ පොදු ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීමට අයිතිය ඇත්තේය. සෑම පුරවැසියෙකුම ජාතික භාෂා දෙන සහ පොදු භාෂාව පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබා තිබිය යුත්තේය.

(2) විශ්ව විද්‍යාලයක හෝ අධ්‍යාපන ආයතනයක අධ්‍යාපන අකටයුතු ජාතික භාෂා දෙකෙන්ම සහ පොදු ඉංග්‍රීසි පැවැත්විය යුත්තේය. යම් පාඨමාලාවක් ඉගැන්වීමේ මාධ්‍ය ඉංග්‍රීසි පමණක් වන්නේ නම් සෑම ශිෂ්‍යයකුටම පොදු භාෂාව ප්‍රගුණ කිරීමේ විශේෂ පහසුකම් පාඨමාලාව ආරම්භයේ සිටම සැලසිය යුත්තේය.

60. (1) ශ්‍රී ලංකාව පුරා සිංහල හා දෙමළ පරිපාලන භාෂාව විය යුත්තේය. උතුර ඊසාන දිග මධ්‍යම සහ නැගෙනහිර පළාත් වල පරිපාලන භාෂාව සිංහලද අනෙකුත් පළාත් වල දෙමළ ද විය යුත්තේය. යම් පළාතක සිංහල හා දෙමළ භාෂා දෙකම පොදුවේ භාවිතා වන්නේ නම අවස්ථාවෝචිත පරිදි භාෂා දෙකෙන්ම පරිපාලන කටයුතු සිදුවිය යුත්තේය.

(2) ජාතික භාෂා දෙකෙන් හෝ පොදු භාෂාවෙන් රජය සමග ලිපි ගනුදෙනු කිරීමට සෑම පුරවැසියෙකුටම අයිතිය ඇත්තේය.

(3) යම් තැනැත්තෙකුට යම් වාර්තාවක්, ලේඛනයක් ප්‍රකාශනයක් පරීක්ෂා කිරීමට අයිතිය අවස්ථාවක ඔහුගේ මනාපය පරිදි එහි පිටපතක් කවර හෝ ජාතික භාෂාවකින් ලබාගැනීමට ඔහුට අයිතිය ඇත්තේය.

(4) රජයේ සියලුම ප්‍රකාශන භාෂා තුනෙන්ම ප්‍රසිද්ධ කලයුත්තේය.

(5) රජයේ සේවයට, අධිකරණ සේවයට සහ පළාත් පාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විභාග භාෂා තුනෙන්ම පැවැත්විය යුත්තේය. එසේ වුවද යම් වෘත්තියක් සඳහා ජාතික භාෂා දෙකෙන් එකක හෝ පොදු භාෂාව සම්බන්ධව විශේෂ කුසලතාවයක් අවශ්‍ය වන්නේ නම් එම භාෂාව සඳහා එවැනි විශේෂ කුසලතාවයක් ලබා තිබීම අවශ්‍ය වන්නේ යයි නියම කල හැක්කේය. එසේම යම් තනතුරකට බඳවා ගැනීමෙන් පසුව සාධාරණ කාලයක් අතුළත යම් භාෂාවක් සම්බන්ධව විශේෂ

කුසලතාවයක් ලබාගත යුතු බව සුදුසුකමක් සේ නියම කල හැක්කේය.

61. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන සියලුම නීති භාෂා තුනෙන්ම පලකල යුත්තේය. නීති හෝ අනු නීති ප්‍රකාශයට පත් කරන ලද මාධ්‍ය අතර අපැහැදිළිතාවයක් ඇත්තේ නම් සෑම විටම පොදු භාෂාවෙන් පල කරන ලද මුද්‍රණය ප්‍රමුඛත්වය ගනු ලබන්නේය.

## අධිකරණ භාෂාව

62. (1) ශ්‍රී ලංකාව පුරා අධිකරණ කටයුතු සඳහා භාවිතා කෙරෙන භාෂාව 60 (1) ව්‍යවස්ථාව ප්‍රකාර විය යුත්තේය.

(2) ඕනෑම නඩු කටයුත්තක හෝ විනිශ්චය අධිකාරියක නඩු කටයුත්තක පාර්ශවකරුවකුට තමන් අභිමත භාෂාවෙන් නඩු කටයුතු මෙහෙයවන ලෙස ඉල්ලා සිටීමට අයිතිය ඇත්තේය. එවැනි ඉල්ලීමක් කල අවස්ථාවක ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුත්තේය. එසේම කී නඩුවක් සම්බන්ධ වාර්තා වල පිටපත් තමන් අභිමත භාෂාවෙන් නියමිත ගාස්තුවට යටත්ව ලබා ගැනීමට පාර්ශවකරුවකුට මෙන්ම වෙනත් ඕනෑම තැනැත්තෙකුට හිමිකම ඇත්තේය.

63. මේ පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි නිල හා ජාතික භාෂා වන සිංහල සහ දෙමළ මෙන්ම පොදු භාෂාව වන ඉංග්‍රීසි භාෂාව දිවයින පුරා ප්‍රචලිත කිරීම රජයේ වගකීම වන්නේය.

## V වන පරිච්ඡේදය

## පුරවැසිභාවය

64. (1) ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුම ශ්‍රී ලංකා පුරවැසියකු" වශයෙන් පමණක් පිළිගනු ලබන්නේය.

(2) යම් තැනැත්තෙකුට ශ්‍රී ලංකා පුරවැසිභාවය හිමි වුයේ පරම්පරාවෙන්ද නැතහොත් පුරවැසිභාවය පිළිබඳ නීතියට අනුකූලව ලියාපදිංචි වීමෙන්ද යන්න අදාළ නොවන්නේය.

(3) කවර හෝ කාර්යයක් සඳහා පුරවැසිභාවය අත් කර ගනු ලැබූ ආකාරය මත ශ්‍රී ලංකාවේ පුරවැසියකු වෙන්කොට නොදැක්විය යුත්තේය.

(4) නීතියෙන් නියම කර ඇති ආකාරයට මිස කිසිම පුරවැසියකුගේ පුරවැසිභාවය අහිමි නොකළ යුත්තේය.

(5) ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනතාව විසින් පිළිගෙන බලාත්මක කරන අවස්ථාව වන විට ශ්‍රී ලාංකික පුරවැසියකු වන සෑම තැනැත්තෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන අතර පුරවැසියකුට හිමිවන සෑම අයිතිවාසිකමකටම ඔහු හෝ ඇය හිමිකම් ලබන්නේය.

(6) ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය තීරණය කිරීම පිළිබඳව පනවා ඇති සියලුම නීති මෙම ව්‍යවස්ථාවට යටත්ව තේරුම් ගත යුත්තේය.

## VI වන පරිච්ඡේදය

## ව්‍යවස්ථාදායකය

65. V පස් වන උපලේඛනය ප්‍රකාර සීමාවෙන් කෙරෙන පළාත් 10 කින් සමන්විත ඒ ඒ පළාතේ ජනගහනය මත පදනම් වූ මැතිවරණ කොට්ඨාශ 60 ක් සඳහා මහජන නියෝජිතයින් ඡන්දයෙන් පත් කෙරෙන්නේය. එම මහජන නියෝජිතයින් තමන් නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ ජනතාවට සෘජුවම වගකිවයුතු වන්නේය.

66. පාර්ලිමේන්තු මැතිවරණය මැතිවරණ කොට්ඨාශ මට්ටමින් පැවැත්වෙන්නේය. ලබාගන්නා වැඩි ඡන්ද ප්‍රමාණය මත ජනතාව තම නියෝජිතයා වශයෙන් තෝරාගන්නා මන්ත්‍රීවරයා තීරණය වන්නේය. පාර්ලිමේන්තුවේ කාලය වසර 5 කට සීමා වන අතර ඉන් අනතුරුව නීතිය ක්‍රියාත්මක වීමෙන් පාර්ලිමේන්තුව විසිර යන්නේය. ජනතාව ඡන්දයෙන් පත් කරන කිසිදු මන්ත්‍රීවරයෙකු දෙවරකට වඩා මහජන මන්ත්‍රී ධුරයක් දැරීමට නුසුදුසු වන්නේය.

67. පාර්ලිමේන්තු සංයුතිය ජනතාව විසින් ඡන්දයෙන් පත් කරන මන්ත්‍රීන් 60 දෙනාගෙන් සහ ජනතාව අනුමත කරනු ලබන 20 දෙනෙකුගෙන් සමන්විත අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලයෙන් සමන්විත වන්නේය. එසේ වුවද අග්‍රාමාත්‍යවරයාට සහ අමාත්‍ය මණ්ඩලයට පාර්ලිමේන්තුව තුල කුමන කරුණක් මත හෝ ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරමින් ඡන්දය ප්‍රකාශ කිරීමට බලය නොමැත්තේය.

68. රාජ්‍ය සමග යම් ආකාරයක ව්‍යාපාර කටයුත්තකට සම්බන්ධ කිසිවකු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයකට හෝ අමාත්‍ය ධුරයකට හෝ අග්‍රාමාත්‍ය ධූරයකට තෝරා පත් කිරීමට නුසුදුසු වන්නේය.

69. පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන සෑම අපේක්ෂකයකුම ලියාපදිංචි ඡන්ද හිමියකු අමතරව නිකැළැල්, පිරිසිඳු චරිතයක්, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම අනිවාර්ය වන්නේය.

70. පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජනතාව විසින් පත් කරන නියෝජිතයකුට කිසිම හේතුවකට තමන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් කල පක්ෂය මාරුකළ නොහැක්කේය. එවැනි ක්‍රියාවක් සෘජුවම මන්ත්‍රීවරයකු පත් කල ජනතාව මන්ත්‍රීවරයා කෙරෙහි තබා ඇති විශ්වාසය කඩ කිරීමක් වන හෙයින් එය මන්ත්‍රී ධූරයෙන් නෙරපා හැරීමට ප්‍රමාණවත් වරදක් වන්නේය. එවැනි අවස්ථාවක අදාල මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් පැවැත්විය යුත්තේය. එසේ වුවද පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකුට තම හෘද සාක්ෂියේ නිදහස ඇති අතර ඕනෑම අවස්ථාවක තමන් නියෝජනය කරන පක්ෂයේ මතය විරුද්ධ මතයක් දැරීමට සහ තම මතය ප්‍රකාශ කිරීමට පූර්ණ නිදහස ඇත්තේය.

71. ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව විසින් තම ව්‍යවස්ථාපිත බලය සෘජුව ක්‍රියාත්මක කරමින් සම්මත කරන ලද ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්චින්න කිරීමට පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක බලය නොමැත්තේය.

ව්‍යවස්ථාවේ හරය වන ජනතා පරමාධිපත්‍ය බලයට එමෙන්ම එහි 1වන 11වන සහ 111වන පරිච්ඡේද වලට අදාළ සංශෝධන කිසිවක් ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගේ අනුමැතිය ජන මත විචාරණයකදී ප්‍රකාශිතව නොලබා පාර්ලිමේන්තුවට සම්මත කල නොහැක්කේය. එසේ නොවන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධ සාමාන්‍ය සංශෝධනයක් පාර්ලිමේන්තුවට සම්මත කිරීමට ව්‍යවස්ථා දායක බලය ඇත්තේය. එසේ වුවද එවැනි සංශෝධනයක් සම්මත කිරීම සඳහා නොපැමිණි මන්ත්‍රීන්ද ඇතුළුව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකක් එවැනි සංශෝධනයකට පක්ෂව ඡන්දය ප්‍රකාශ කල යුත්තේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ඕනෑම නීතියක් හෝ සංශෝධනයක් හෝ පනත් කෙටුම්පතක් ඕනෑම අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කිරීමේ බලය ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවට සතු වන්නේය.

72. පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට පැවරෙන එකම වගකීම ව්‍යවස්ථාදායක කටයුතු වලට සහභාගී වීම පමණක් වන්නේය. රජයේ වෙනත් විධායක හෝ පරිපාලන කටයුත්තකට ඍජුවම හෝ අන්‍යාකාරයෙන් මැදිහත් වීම විනය පරීක්ෂණයට යටත්ව වහාම වැඩ තහනම් කිරීමටත් වරදට වරදකරු වූ වහා මන්ත්‍රී ධුරයෙන් නෙරපා හැරීමට ප්‍රමාණවත් වරදක් වන්නේය. එසේ වුවද තම මැතිවරණ කොට්ඨාශයේ පදිංචි අයකුට අදාළ කරුණක් සම්බන්ධව ඒ ඒ අමාත්‍යංශයට අනුබද්ධව පාර්ලිමේන්තු සම්බන්ධීකරණ කාර්යාලය අමතා ලිඛිතව කරුණු විමසීම මන්ත්‍රී ධුරය අවභාවිතා කිරීමක් නොවන්නේය.

73. (1) පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ අපරාධ චෝදනාවක් එල්ල වී ඇති අවස්ථාවක හෝ වෙනත් අපරාධ වරදක් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අත් අඩංගුවට ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක ඔහුට හෝ ඇයට පාර්ලිමේන්තු වරප්‍රසාද වල පිහිට පැතිය නොහැක්කේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා මත හෝ වෙනත් මූල්‍ය අපරාධ චෝදනා සම්බන්ධව අධි චෝදනා මත මහාධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක වහාම ක්‍රියාත්මක වන පරිදී නීතිය ක්‍රියාත්මක වීමෙන් ඔහුගේ වැඩ තහනම් වන්නේය. එවැනි චූදිතයකු චෝදනා වලට වරදකරු වූ වහාම ධූරයෙන් නෙරපා හැරීමටත්, දේපල රාජසන්තක කිරීමටත්, වරදේ ස්වභාවය අනුව ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබීමට හෝ මරණ දණ්ඩනයට යටත් වන්නේය.

(2) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මන්ත්‍රීධූරය අවභාවිතා කිරීමේ චෝදනා මත ආපසු කැඳවීමේ අනන්‍ය බලය ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව සතු වන්නේය. මන්ත්‍රීවරයෙකු නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද දායකයින්ගෙන් 2% කට නොඅඩු සංඛ්‍යාවකට එවැනි පෙත්සමක් චෝදනා තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන සාක්ෂි සමඟ ත්‍රිපුද්ගල මහාධිකරණය වෙත ඉදිරිපත් කල හැක්කේය.

(3) මන්ත්‍රීවරයෙකු නෙරපා හැරීම සඳහා ඉදිරිපත් කරන එවැනි පෙත්සමක් ප්‍රසිද්ධියේ විභාග කර මාස 03 ක් ඇතුළත තීන්දු ප්‍රකාශ කිරීමට ත්‍රිපුද්ගල මහාධිකරණය නීතියෙක් බැඳී සිටින්නේය. චෝදනාවලට වරදකරු වන චූදිතයෙකු වහාම ක්‍රියාත්මක වන පරිදි මන්ත්‍රීධූරයෙන්

ඉවත් කෙරෙන අතර, එතැන් සිය මාස 03 ක් ඇතුළත අදාල මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් පැවැත්වීම මැතිවරණ කොමිසමේ වගකීම වන්නේය.

(4) එවැනි නඩු තීන්දුවකට එරෙහිව වරදට වරදකරු වූ චූදිතයාට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දින 14 ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හිමිකම ඇත්තේය. එවැනි අභියාචනයක් ඉදිරිපත් කිරීම ඔහුට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුව බලාත්මක නොකිරීමට හේතුවක් නොවන්නේය.

(5) ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කෙරෙන එවැනි අභියාචනයක් මාස 03 ක් ඇතුළත විභාග කර තීන්දුව ප්‍රකාශයට පත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ වගකීම වන්නේය.

74. මන්ත්‍රී ධුරයකට ජනතාව විසින් විශ්වාසය මත පත්කරන ලද සෑම මන්ත්‍රීවරයෙකුම ජනතාව සතුවන පරමාධිපත්‍ය බලය, නීතියේ අධිපත්‍ය සහ අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කිරීමට බැඳී සිටින්නේය. කථානායකවරයා පත්කිරීමේ ඡන්ද විමසීමේදී හැර ජනරජ ව්‍යවස්ථාවේ iv උපලේඛනය ප්‍රකාර තම හෘද සාක්ෂියට එකඟව, අවංකව, විශ්වාසවන්තභාවයේ සිද්ධාන්තය ගරු කරමින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන පිළිපදින බවට සෑම මන්ත්‍රීවරයෙකුම ප්‍රතිඥාවක් දිය යුතු වන්නේය.

75. අභිනව පාර්ලිමේන්තුව කැඳවූ වහාම එහි ප්‍රථම සභා රැස්වීමේදී කථානායක සහ නියෝජ්‍ය කථානායකවරයා පත්කළ යුත්තේය.

76. අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ මහා ලේකම්වරයා පත්කළ යුත්තේය. ඔහු විසින් තම කාර්ය මණ්ඩලය කථානායකවරයාගේ අනුමැතිය ඇතිව පත් කල යුතු වන්නේය. ඔවුන්ගේ වැටුප් හා දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. පාර්ලිමේන්තුවේ මහා ලේකම්වරයාගේ ධුර කාලය වයස අවුරුදු 65 දී අවසන් වන්නේය.

77. පාර්ලිමේන්තු මහා ලේකම්වරයාට තම ධුරයේ කාර්ය කර්තව්‍ය ඉටුකළ නොහැකි අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් එම ධුරය සඳහා සුදුසු අයකු පත්කළ යුත්තේය.

78. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිසිදු වේතනයකට, විශ්‍රාම වැටුපකට හෝ වෙනත් වරප්‍රසාදයකට අතීතයට බලපාන සේ හිමිකම් නොලබන්නේය. අමාත්‍ය මණ්ඩල ලේකම්වරයෙකු සඳහා නීතියෙන් නියම කර ඇති වැටුපට සමාන දීමනාවක් පමණක් ලැබීමට ඔවුන් හිමිකම ලබන්නේය. යම් දේශපාලන පක්ෂයක් එම දීමනාවේ යම් වෙනසක් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ බව තම පාර්ලිමේන්තු මතිවරණ පොරොන්දු ප්‍රකාශනයට ඇතුලත් කර ඒ සඳහා ජනතාවගේ අනුමැතිය ලබා ගත යුත්තේය.

මන්ත්‍රීවරයෙකු නොකඩවා මාස තුනක් පාර්ලිමේන්තු රැස්වීම් වලට සහභාගී වීමට අපොහොසත් වුවහොත් මන්ත්‍රී ධුරය අහිමි වන්නේය.

80. පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් හිස්ව තිබුනද පාර්ලිමේන්තුවට ක්‍රියාකිරීමට බලය ඇත්තේය. පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ ඡන්දය පාවිච්චි කිරීමට හෝ වෙනත් අයුරකින් එහි කටයුතු වලට සහභාගී වීමට හෝ හිමිකමක් නොමැති තැනැත්තෙකු පාර්ලිමේන්තුවේ අසුන් ගත් බවක් හෝ

පාර්ලිමේන්තුවේ යම්කිසි රැස්වීමකදී ඡන්දය පාවිච්චි කල බවක් හෝ වෙනත් අයුරකින් පාර්ලිමේන්තුවේ කටයුතු වලට සහභාගී වූ බවක් පසුව සනාථ වූ අවස්ථාවක එයින් පාර්ලිමේන්තුවේ කටයුතු වල නීත්‍යානුකූල භාවයට හානියක් නොවන්නේය.

81. (1) මහා මැතිවරණයකින් පසුව පැවැත්වෙන පළමු පාර්ලිමේන්තු රැස්වීමේදී කථානායක, නියෝජ්‍ය කථානායක, කාරක සභාපති, නියෝජ්‍ය කාරක සභාපති යන තනතුරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පත්කළ යුත්තේය.

(2) කථානායක, නියෝජ්‍ය කථානායක , කාරක සභාපති , නියෝජ්‍ය කාරක සභාපති යන තනතුරු දරන මන්ත්‍රීවරයෙක් අග්‍රාමාත්‍යවරයා වෙත ස්වකීය අත්සන යටතේ වූ ලිපියක් මගින් ධුරයෙන් ඉවත් වුවහොත් හෝ මන්ත්‍රී ධුරය අහෝසි වුවහොත් මිස තමන් දරන ධුරය අවසන් නොවන්නේය.

(3) පාර්ලිමේන්තුව විසිරුවා හැරීමක් සිදුනොවන අවස්ථාවක කථානායක, නියෝජ්‍ය කථානායක, කාරක සභාපති, නියෝජ්‍ය කාරක සභාපති යන ධුරයන් අතුරින් කවර හෝ ධුරයක් පුරප්පාඩු වූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසින් එම ධුරය සඳහා වෙනත් මන්ත්‍රී වරයෙකු පත් කල යුත්තේය.

(4) පාර්ලිමේන්තුව විසිරුවා හැරීමෙන් පසුව 84 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව නැවත රැස්කරනු ලැබුවහොත් පාර්ලිමේන්තුවේ කටයුතු හා සංයුතිය පාර්ලිමේන්තුව නැවත විසිරුවා හරින තුරු පෙර පරිදිම සිදුවිය යුත්තේය.

(5) කථානායක සෑම අවස්ථාවකදීම පාර්ලිමේන්තුවේ මූලසුන දරන්නේය. කථානායකවරයා නොපැමිණි අවස්ථාවක, නියෝජ්‍ය කථානායකවරයාද, ඔහු නොපැමිණි අවස්ථාවක කාරක සභාපතිවරයාද, ඔහුද නොපැමිණි අවස්ථාවක නියෝජ්‍ය කාරක සභාපතිවරයාද ඔහුද නොපැමිණි අවස්ථාවක පාර්ලිමේන්තුව විසින් වෙනත් මන්ත්‍රීවරයෙකුද පාර්ලිමේන්තුවේ මූලසුන දැරීම සඳහා පත්කළ යුත්තේය.

82. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ධුරය

(1) මිය යාමෙන්

(2) නොකඩවා මාස තුනක් පාර්ලිමේන්තු රැස්වීම් වලට සහභාගී නොවීමෙන්,

(3) තම අත්සනින් පාර්ලිමේන්තුවේ මහා ලේකම්වරයා වෙත තනතුරින් ඉල්ලා අස්වීමේ ලිපියක් භාරදීමෙන්,

(4) අධි චෝදනාවක් මත මහාධිකරණයේ පවරන ලද අපරාධ නඩුවක වරදකට වරදකරු වීමෙන් හෝ වෙනත් ආකාරයකින් මන්ත්‍රීධුරයක් දැරීමට නුසුදුසු වීමෙන්,

(5) රජයේ සේවයට පත්වුවකු හෝ රාජ්‍ය සංස්ථාවක සේවයට පත් වූවකු එම තනතුරෙන් විධිමත්ව ඉල්ලා අස්නොවී හෝ ඒ බව වසන් කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත්වී පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමෙන්,

(6) තත් කාලයේ පවත්නා වෙනත් නීතියක් යටතේ ධුරය නිශ්ප්‍රභා වීමෙන්,

(7) පාර්ලිමේන්තුව විසිරුවා හැරීමෙන්

(8) ව්‍යවස්ථාව ප්‍රකාර මන්ත්‍රී ධුරයෙන් නෙරපා හැරීම සඳහා යෝජනාවක් සම්මත වීමෙන්,

(9) ද්විත්ව පුරවැසියකු බව අනාවරණය වීමෙන්,

(10) ධූරය අවභාවිතා කිරීමේ චෝදනාවකට වරදට වරදකරු වීමෙන් අහෝසි වන්නේය.

ද්විත්ව පුරවැසියකු වීමේ හේතුව මත මන්ත්‍රී ධුරය අවසන් වූ අවස්ථාවක තමන් විසින් දරන ලද මන්ත්‍රී ධුරය වෙනුවෙන් ලබාගත් සියලුම වරප්‍රසාද, පහසුකම් ඇතුළු සියලුම දීමනා ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටින්නේය. එවැනි අවස්ථාවක යම් තැනැත්තෙකු එම වගකීම පැහැරහරින්නේ නම් එය අය කරගැනීම සඳහා ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පැවරීමට යටත්ව රිමාන්ඩ් බන්ධනාගාර ගතකල යුත්තේය. එවැනි චූදිතයෙකුට ඇප ලබා දීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලය නැත්තේය.

83. පාර්ලිමේන්තු මන්ත්‍රී බලතල හා වරප්‍රසාද පනත යටතේ ලැබෙන වරප්‍රසාද අධිකරණයට අපහාස වන වරදක් කිරීම සඳහා සහ ජාතීන් අතර අසමගිය හා ආරවුල් ඇති කිරීමට හේතු වන ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා අවභාවිතා කල නොහැක්කේය. එවැනි වරදක් කරන සෑම මන්ත්‍රීවරයෙකු නීතියේ ආධිපත්‍යට යටත් වන්නේය.

84. (1) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාර ජනාධිපතිවරයා විසින් 103 වන ව්‍යවස්ථාව ප්‍රකාරව නිකුත් කරන ලද ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුවේ වාර අවසන් කරන ලද අවස්ථාවක ඊළඟ වාරය පටන් ගැනීම සඳහා දින නියම කල යුත්තේය. එම දිනයේ පාර්ලිමේන්තුව වාර අවසන් කරන ප්‍රකාශනයේ දින

සිට මාස තුනක් නොඉක්ම විය යුත්තේය. එසේ වුවද වාර අවසන් කර ඇති පාර්ලිමේන්තුව නියමිත දිනට ප්‍රථම කැඳවීමට අග්‍රාමාත්‍යවරයා තීරණය කල අවස්ථාවක ජනාධිපතිවරයා විසින් එසේ පාර්ලිමේන්තුව නැවත රැස්කළ යුත්තේය.

(2) නැවත කැඳවන ලද පාර්ලිමේන්තුවට වාර අවසන් කිරීමට ප්‍රථම කටයුතු නිම නොවූ කාරනා සම්බන්ධව ක්‍රියා කිරීමට බලය ඇත්තේය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසිරුවා හැරීමේ ප්‍රකාශනයක් නිකුත් කරන ලද අවස්ථාවකදී අභිනව පාර්ලිමේන්තුව කැඳවීමේ දිනය එමගින් නියම කල යුත්තේය. පාර්ලිමේන්තුව විසිරුවා හැරීමේ ප්‍රකාශනය පසුව සංශෝධනය කල හැක්කේය. එසේ වුවද අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේ දිනය පාර්ලිමේන්තුව විසිරුවා හැරීමේ දින සිට මාස තුන නොඉක්මවිය යුත්තේය.

(4) පාර්ලිමේන්තුව විසිරුවා හැරීමෙන් පසුව හදිසි අවස්ථාවනුගත හේතුවක් මත පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුතු යයි අග්‍රාමාත්‍යවරයා හෝ අධිකරණය තීරණය කරන්නේ නම් ඒ සඳහා ප්‍රකාශයට පත් කරන ප්‍රකාශනයක් මගින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව නැවත කැඳවිය ඇත්තේය.

හදිසි අවස්ථානුගත හේතුවක් මත එසේ කැඳවන ලද පාර්ලිමේන්තුවට තීරණ ගැනීමට බලය පැවරෙන්නේ එම හදිසි අවස්ථාව සම්බන්ධ තීරණ ගැනීමට පමණක්

වන්නේය. එම හදිසි අවස්ථාව ඉක්මවීමත් සමගම අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුව විසිර යන්නේය.

85. නීති ප්‍රකාර පාර්ලිමේන්තුවේ වාර අවසාන වන අවස්ථාවක් එළඹෙන තුරු හෝ පාර්ලිමේන්තුව විසිරුවා හරින තුරු හෝ යෝජනා සම්මතයක් මගින් හෝ ස්ථාවර නියෝග වලට යටත්ව පාර්ලිමේන්තු රැස්වීම් කල් තැබිය හැක්කේය.

86. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්‍යාකාර විධිවිධාන සලසා ඇති අවස්ථාවක හැර යම් කරුණක් සම්බන්ධව පාර්ලිමේන්තුවේ තීරණය පැමිණ සිටින මන්ත්‍රීවරුන්ගේ බහුතර තීරණය වන්නේය.

(2) යම් කරුණක් සම්බන්ධව ඡන්දය විමසීමේදී රැස්වීමේ මූලාසන දරන තැනැත්තා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුත්තේය. එසේ වුවද මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක මූලාසන දරන තැනැත්තාට තම ඡන්දය ප්‍රකාශ කල හැක්කේය.

87. පාර්ලිමේන්තු රැස්වීමත් පැවැත්වෙන කවර වූ අවස්ථාවක සභා ගර්භයේ සිටින මන්ත්‍රී වරුන්ගේ සංඛ්‍යාව විස්සකට අඩු වන බව මූලාසන වෙත වාර්තා කරනු ලැබුවහොත් මූලාසන දරන තැනැත්තා විසින් පාර්ලිමේන්තුවේ කටයුතු වහාම කල් තැබිය යුත්තේය.

88. **(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව;**

(i) කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, කාරක සභාපතිවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා පත්කිරීම හා ධූරයෙන් ඉවත්කිරීම පිළිබඳව ද,

(ii) පාර්ලිමේන්තුවේ කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා ද, මන්ත්‍රීවරුන්ගේ විනය ආරක්ෂා කිරීම පිළිබඳවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇත්තාවූ හෝ ව්‍යවස්ථාවෙන් බලතල පවරා ඇත්තා වූ වෙනත් කාරණා සම්බන්ධව ද යෝජනා සම්මතයක් මගින් හෝ ස්ථාවර නියෝග මගින් හෝ විධිවිධාන සැලසීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේය.

(2) නීතියෙන් හෝ යෝජනා සම්මතයෙන් විධිවිධාන සලසන තුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බල පැවැත්වූ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග, අවශ්‍ය සංශෝධන වලට යටත්ව පාර්ලිමේන්තු ස්ථාවර නියෝග වශයෙන් තවදුරටත් බලාත්මක වන්නේය.

89. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පනවා ඇති විධිවිධාන වලට යටත්ව සහ පිළිගත් ජාත්‍යන්තර සම්මුති වලට යටත්ව ඉදිරියට බලපාන්නා වූ නීති මෙන්ම අතීතයට බලපාන්නා වූ නීති පැනවීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේය.

90. (1) පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාදායක බලය අත්හල නොහැක්කේය. අන්සතු නොකළ යුත්තේය. ව්‍යවස්ථාදායක බලය පැවරෙන වෙනත් කිසිම අධිකාරියක් පාර්ලිමේන්තුව විසින් නොපිහිට විය යුත්තේය.

(2) මහජන ආරක්ෂාවට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන හදිසි අවස්ථා රෙගුලාසි පැනවීමට අග්‍රාමාත්‍යවරයා වෙත පැවරී ඇති බලයට මෙම ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් බාධාවක් නොවන්නේය.

(3) නීති ප්‍රකාරව යම්කිසි තැනැත්තෙකුට හෝ කිසියම් අධිකාරියකට අනු නීති පැනවීමට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් බලය පවරා ඇති අවස්ථාවක එවැනි අනු නීති පැනවීම මෙම ව්‍යවස්ථාවේ (1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් නොවන්නේය.

91. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන සෑම පනත් කෙටුම්පතකම පහත දැක්වෙන ආකෘතියේ දැක්වෙන පරිදි කථානායකවරයා විසින් ස්වකීය අත්සන යොදා සහතික කල යුත්තේය. (පනතේ ලුහුඬු නාමය මෙහි සඳහන් කල යුතුය) පාර්ලිමේන්තුව විසින් විධිමත්ව සම්මත කල බව මෙයින් සහතික කරමි.

92. (1) කථානායකවරයා විසින් විධිමත්ව සහතික කරන ලද සෑම පනත් කෙටුම්පතක්ම සහ ඕනෑම නීතියක් සමාලෝචනය කිරීමේ අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන්නේය.

(2) අග්‍රාමාත්‍යවරයා විසින් සෘජුවම ජනතාව වෙත ඉදිරිපත් කර සම්මත කලයුතු යයි තීරණය කරන ලද පනත් කෙටුම්පතක් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේය. එවැනි පනත් කෙටුම්පතක් ජනතාව විසින් පිළිගෙන සම්මත කරන ලද අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් මෙම ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පහත දැක්වෙන ආකෘතියේ පරිදි එය ජනතාව විසින් සෘජුවම පිළිගෙන සම්මත කලබව ස්වකීය අත්සන යොදා සහතික කල යුත්තේය. එතැන් සිට එය රටේ නීතිය ලෙස බලාත්මක වන්නේය. (පනතේ ලුහුඬු නාමය මෙහි සඳහන් කල යුතුය) විධිමත්ව ජනතාව විසින් සම්මත කල බව මෙයින් සහතික කරමි.

(3) ජනමත විචාරණයක වලංගු භාවය එහි ප්‍රතිඵල ප්‍රකාශ කල සිට දින තුනක් ඇතුලත (නිවාඩු දින හැර) ඕනෑම පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝග කල හැක්කේය. එවැනි අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ප්‍රකාශයට පත්කරන තෙක් අග්‍රාමාත්‍යවරයා විසින් එම පනත් කෙටුම්පත සහතික නොකළ යුත්තේය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කරන එවැනි පනත් කෙටුම්පතක් එය අභියෝග කල දින සිට දින 7 ක් තුල විභාග කර තීන්දු ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

93. (1) අග්‍රාමාත්‍යවරයා විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන කරුණක් සම්බන්ධව විභාග කර වසරකට නොවැඩි කාලයක් තුළ තීන්දු ප්‍රකාශ කිරීම සඳහා ත්‍රිපුද්ගල අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවක් පත් කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේය.

(2) අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන එවැනි කොමිෂන් සභාවකට එම කොමිෂන් සභාව හමුවේ විභාග වන වරදක් සම්බන්ධව වරදකරු වන තැනැත්තෙකුට එරෙහිව එම තැනැත්තා විසින් සිදු කරන ලද වරදේ ස්වභාවය අනුව;

(i) එම තැනැත්තාගේ දේපල රාජසන්තක කිරීමට,

(ii) එම තැනැත්තාට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කිරීමට හෝ ඔහුගේ දේපළ රාජසන්තක කිරීමට සහ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කිරීමට යන දණ්ඩන නියමයන් දෙකම නියම කිරීමට, අධිකරණ බලය ඇත්තේය.

(iii) එවැනි පරීක්ෂණ කොමිෂන් සභාවක අවසාන නිගමනයට එරෙහිව පරීක්ෂණ කොමිෂන් සභාවේ තීන්දුව ප්‍රකාශ කල දින සිට 30 ක් ඇතුලත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේය.

එසේ වුවද, අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ තීන්දුවකට එරෙහිව අභියාචනාවක් ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ තීන්දුව අත්හිටුවීමට හේතුවක් නොවන්නේය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එවැනි අභියාචනාවක් මාස 03 ක් ඇතුලත විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

# VII වන පරිච්ඡේදය

## විධායකය

94. ජනතාව විසින් තෝරාපත්කර ගන්නා ලද අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය නායකයා වන්නේය. ඔහු ජනරජයේ ප්‍රධානියාද, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාද, සන්නද්ධ සේවාවන්හි ප්‍රධානියාද වන්නේය. අග්‍රාමාත්‍යවරයා විසින් ත්‍රිවිධ හමුදාවන්හි ප්‍රධානීන් පත්කරනු ලබන්නේය.

95. 1) ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව විසින් අනුමත කරනු ලබන අග්‍රාමාත්‍යවරයා ඇතුලු අමාත්‍ය මණ්ඩලය 20 දෙනෙකුගෙන් සමන්විත වන්නේය. අග්‍රාමාත්‍යවරයා සහ ඔහු විසින් පත් කරන අමාත්‍ය මණ්ඩලය සාමූහිකව රටේ නීතියට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව තමන් වෙත පැවරෙන කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම සම්බන්ධව ජනරජයේ ජනතාව විසින් ඡන්දයෙන් පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවට වගකිව යුත්තේය.

2) අග්‍රාමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරයෙකු ලබන වැටුප මෙන් දෙගුණයක දීමනාවකට හිමිකම ලබන්නේය. විශ්‍රාම වැටුප් සහ වෙනත් වරප්‍රසාද කිසිවකට හිමිකම් නොලබන්නේය.

96. 1) ජනරජයේ අග්‍රාමාත්‍යවරයාද අමාත්‍ය මණ්ඩලයද ජනතාව විසින් පත් කරනු ලබන්නේය. ඔවුන්ගේ ධුර කාලය වසර පහක් වන්නේය. අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය ජනතාව විසින් ජනතාව සතු වන පරමාධිපත්‍ය බලයට සහ නීතියේ ආධිපත්‍යට

ගරුකිරීමට බැඳී සිටින්නේය. ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv උපලේඛනය ප්‍රකාර හෘද සාක්ෂියට එකඟව, අවංකව, විශ්වාසවන්ත භාවයේ සිද්ධාන්තය ගරුකරමින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන පිළිපදින බවට ඔවුන් සියලුදෙනා ප්‍රතිඥාවක් දියයුතු වන්නේය. අග්‍රාමාත්‍යවරයා ජනාධිපතිවරයා ඉදිරිපිට දී ද, අමාත්‍ය මණ්ඩලය අග්‍රාමාත්‍යවරයා ඉදිරිපිටදී ද දිවුරුම් දිය යුත්තේය.

2) ජනතාව විසින් පත් කරනු ලබන අග්‍රාමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලය දෙවරකට වඩා වාර ගණනක් ධූරය දැරීමට සුදුසුකම් නොලබන්නේය.

97. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන ලද අග්‍රාමාත්‍ය ලේකම්වරයෙක් වන්නේය. අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් හා නීතියේ ආධිපත්‍යයට යටත්ව අග්‍රාමාත්‍ය ලේකම්වරයා තම ධුරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කල යුත්තේය.

98. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන අමාත්‍ය මණ්ඩල ලේකම්වරයෙක් වන්නේය. අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා තම ධුරයේ කාර්ය හා කර්තව්‍ය අග්‍රාමාත්‍ය වරයාගේ උපදෙස් ප්‍රකාර ඉටුකළ යුත්තේය.

99. 1) අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ජනාධිපතිවරයෙක් වන්නේය. ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර හයක් වන්නේය. තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන්, පූර්නාධිකාරී රාජ්‍ය දූතයන් වෙනත් තානාපති නියෝජිතයන් පත් කිරීම හා ඔවුන්ට බලතල පැවරීම, ඔවුන් පිළිගැනීම සහ

විනිශ්චයකාරවරුන් හැර ව්‍යවස්ථාදායක සභාව විසින් අනුමත කරන ලද වෙනත් ධූරයන් සඳහා සියලුම පත්කිරීම් සඳහා දිවුරුම්දීම ජනාධිපතිවරයා හමුවේ සිදුවන්නේය.

2) අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ජනාධිපතිවරයා ධූරය අවභාවිතා කිරීමේ චෝදනා මත අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයාට ඉවත් කල හැක්කේය.

100. අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනය මත පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ මුලසුන දැරීම ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබන්නේය.

101. (1) අග්‍රාමාත්‍යවරයාට එරෙහිව ධූරය අවභාවිත කිරීමේ හෝ ව්‍යවස්ථාව චේතනාන්විතව උල්ලංඝනය කිරීම පිළිබද චෝදනා ඕනෑම පුරවැසියකුට එම චෝදනාවට අදාළ ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් මාස තුනක් ඇතුලත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කල හැක්කේය. එවැනි පැමිණිල්ලක් සම්බන්ධව අධිකරණයේ අවසන් නිගමනය මසක් ඇතුලත කථානායවරයාට පිටපතක් සහිතව ජනතාවගේ දැනගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කල යුත්තේය. අග්‍රාමාත්‍යවරයා ධූරයෙන් ඉවත් කිරීම සඳහා අධිකරණයේ නිගමනය පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව 2/3 ක බහුතරයෙන් සම්මත විය යුත්තේය.

(2) මරණය, ඉල්ලා අස්වීම, ව්‍යවස්ථාව චේතනාන්විතව උල්ලංඝනය කිරීම, විෂමාචාරය හෝ ධූරය අවභාවිතා කිරීමේ චෝදනා මත අග්‍රාමාත්‍යවරයා ධූරයෙන් ඉවත්

කිරීම සිදු වූ අවස්ථාවක හෝ අග්‍රාමාත්‍යවරයාට ධුරයේ කාර්ය කර්තව්‍ය ඉටු කල නොහැකි අවස්තාවක අමාත්‍ය මණ්ඩලයේ සමාජිකයකු අග්‍රාමාත්‍ය ධුරයේ ඉතිරි කාලය දැරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ සාමුහික එකඟත්නයෙන් නම් කල යුතු අතර, ජනාධිපතිවරයා විසින් ඔහු පුරප්පාඩු වූ අග්‍රාමාත්‍යධූරය සඳහා පත්කළ යුත්තේය.

102. අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු අග්‍රාමාත්‍ය ධුරය පුරප්පාඩු වීමෙන් අග්‍රාමාත්‍ය ධුරයට පත් කරන ලද අවස්ථාවක හෝ මරණය, ඉල්ලා අස්වීම හෝ විෂමාචාරය මත ධුරයෙන් ඉවත් කිරීම සිදු වූ අවස්ථාවක හෝ අමාත්‍ය ධුරයේ කාර්ය කර්තව්‍ය ඉටුකළ නොහැකි අවස්ථාවක ජනතාව විසින් පාර්ලිමේන්තු මැතිවරණයේදී අමාත්‍ය මණ්ඩලය සඳහා පත් කිරීම සඳහා පිලිගෙන සම්මත කරන ලද ලැයිස්තුවෙන් අයකු අදාළ අමාත්‍ය ධුරයේ ඉතිරි කාලය දැරීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් පත්කළ යුත්තේය.

103. ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිතව පැවරෙන බලතල වලට අමතරව අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනය හා අනුමැතිය ඇතිව මෙම ව්‍යවස්ථාවේ සඳහන් බලතල ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කල යුත්තේය.

(i) පාර්ලිමේන්තුවේ එක් එක් සැසි වාරය ආරම්භයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

(ii) පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම සහ විසිරුවා හැරීම.

(iii) රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීම සහ රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කල යුතු සෑම ලේඛනයකම රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීම.

(iv) අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකරනු ලබන පත්කිරීම් අධිකාරී පත්‍ර වල රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීම.

(v) දරිද්‍රතාවයෙන් පෙලෙන ඉඩම් අයිතිය අහිමි පවුල් වලට පමණක් රජය සතු ඉඩම් සහ අනෙකුත් නිශ්චල දේපළ ප්‍රධානය කිරීම. මෙම බලතල යම් විශේෂ තැනැත්තෙකුට වාසියක් හෝ ලාභයක් ලබා දීම සඳහා අවභාවිතා කිරීමට ජනාධිපතිවරයාට බලයක් නැත්තේය.

(vi) ජනමත විචාරනයකින් ලබා ගන්නා ජනතාවගේ අනුමැතියට යටත්ව රජය සතු ඉඩම් සහ අනෙකුත් නිශ්චල දේපළ අමාත්‍ය මණ්ඩලය විසින් යෝජනා කරන ව්‍යාපෘතියකට ප්‍රධානය කිරීම.

(vii) යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.

(viii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ වෙනත් ලිඛිත නීතියකට පටහැනි නොවන ක්‍රියා ඉටු කිරීම.

104. රාජ්‍ය මූල්‍ය සම්බන්ධව පූර්ණ බලධරයා වන පාර්ලිමේන්තුව සතු වන මූල්‍ය බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ මුදල් අමාත්‍යවරයාට පැවරෙන සීමිත බලය පාර්ලිමේන්තුවේ අධීක්ෂනයට යටත් වන්නේය. බදු අත්හැරීම් සහ බදු සහන ප්‍රධානයක් ඇතුළුව මුදල් අමාත්‍යවරයා වෙත නීතියෙන් පැවරෙන බලතල ක්‍රියාත්මක

කිරීම හෝ අනුමත කිරීම නියෝජිතයකුට පැවරිය නොහැක්කේය. රාජ්‍ය මූල්‍ය පිළිබඳ ගන්නා තීරණ සම්බන්ධව මුදල් අමාත්‍යවරයා පෞද්ගලිකවම පාර්ලිමේන්තුවට සහ ජනතාවට වගකිවයුතු වන්නේය.

105. අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළුව විධායක ධුරයක් දරන අයකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා මත හෝ වෙනත් මූල්‍ය අපරාධ චෝදනා සම්බන්ධව අධිචෝදනා මත අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක වහාම ක්‍රියාත්මක වන පරිදි නීතිය ක්‍රියාත්මක වීමෙන් ඔහුගේ වැඩ තහනම් වන්නේය. එවැනි චූදිතයකු චෝදනා වලට වරදකරු වූ වහාම ධුරයෙන් නෙරපා හැරීමටත්, දේපල රාජසන්තක කිරීමටත්, වරදේ ස්වභාවය අනුව ජීවිතාන්තය දක්වා සිර දඩුවම් ලැබීමටත් හෝ මරණ දණ්ඩනයට යටත් වන්නේය.

106. ඒ ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය සඳහා පැවරෙන විෂයයන් තීරණය කිරීම සහ විෂයයන් සංශෝධනය කිරීමේ බලය අග්‍රාමාත්‍යවරයා සතු වන්නේය. අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ විෂයන් සම්බන්ධව සිදුකරන සංශෝධන වලින් අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට ඇති වගකීමට කිසිදු ආකාරයක වෙනසක් හෝ බලපෑමක් සිදු නොවිය යුත්තේය.

107. (1) පාර්ලිමේන්තුව විසිරුවා හැර ඇති අවස්ථාවක එසේ විසිරුවා හැරීමට ප්‍රථම ක්‍රියාත්මක වූ ජනතාව විසින් පත් කරන ලද අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව විසිරුවා හැරීම නොතකා මහා මැතිවරණයෙන් පසුව ජනතාව විසින් අභිනව අමාත්‍ය මණ්ඩලය පත් කරන තුරු තවදුරටත් ක්‍රියාත්මක වන්නේය. මැතිවරණයක්

පැවැත්වීම අතර කාලය තුල මැතිවරණ කොමිසමේ නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියා කිරීමත්, පාර්ලිමේන්තු මැතිවරණය සඳහා කිසිදු ආකාරයක මැදිහත්වීමක් හෝ බලපෑමක් නොකිරීමත් අමාත්‍ය මණ්ඩලයේ වගකීම වන්නේය.

(2) පාර්ලිමේන්තුව විසිරුවාහැරීම සහ මහ මැතිවරණය අවසන්වීම අතර කාලය තුල අග්‍රාමාත්‍යවරයාගේ හෝ වෙනත් අමාත්‍යවරයෙකුගේ මරණය, ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුරයෙන් ඉල්ලා අස්වීම සිදුවුවහොත් එම කාල පරාසය තුල අමාත්‍ය මණ්ඩලය තවදුරටත් ක්‍රියාත්මක වන්නේය. අග්‍රාමාත්‍ය ධුරය හෝ අමාත්‍ය ධුරයක් එම කාල පරාසය තුල පුරප්පාඩු වුවහොත් එම කාලය සඳහා අමාත්‍යවරයෙක් එම තනතුරෙහි වැඩ බැලීමට පත්කළ යුත්තේය.

108. පාර්ලිමේන්තුව විසින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සහ විසර්ජන කෙටුම්පත ප්‍රතික්ෂේප වූ අවස්ථාවක හෝ රජයට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසිර යා යුත්තේය.

109. රජයේ සෑම අමාත්‍යාංශයක් සඳහාම ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන ස්ථිර ලේකම්වරයෙක් වන්නේය. ඒ ඒ අමාත්‍යාංශ භාර ස්ථිර ලේකම්වරයා නීති ප්‍රකාරව අමාත්‍යාංශය යටතේ වන සියලුම දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන වල කාර්ය අධීක්ෂණය කල යුත්තේය.

110. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් ධුරයේ වැඩ භාර ගැනීමට ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv උපලේඛන ප්‍රකාර හෘද සාක්ෂියට එකඟව, අවංකව,

විශ්වාසවන්ත භාවයේ සිද්ධාන්තය ගරු කරමින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන පිළිපදින බවට ප්‍රතිඥාවක් දිය යුතු වන්නේය.

111. (1) අග්‍රාමාත්‍යවරයා රාජ්‍ය ආරක්ෂාව ඇතුලත්ව ව්‍යවස්ථාවෙන් සහ වෙනත් ඕනෑම නීතියකින් අග්‍රාමාත්‍ය ධූරය වෙත නීතියෙන් පැවරී ඇති කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටුකිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවට වග කිවයුතු වන්නේය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ කාර්ය හා කර්තව්‍ය යථා පරිදී ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ නිලධාරීන් ඒ ඒ ධූරයට නියමිත නියමයන් හා කොන්දේසි වලට යටත්ව පත් කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේය.

(3) එසේ පත් කරන සෑම රාජ්‍ය නිලධාරියකුම රාජ්‍ය සේවා කොමිසමේ පාලනයට යටත් වන්නේය.

112. (1) අමාත්‍ය මණ්ඩලය තනි තනිවද සාමුහිකව ද අග්‍රාමාත්‍යවරයාට සහ පාර්ලිමේන්තුවට වගකීමට සහ පිළිතුරු දීමට බැඳී සිටින්නේය.

(2) අග්‍රාමාත්‍යවරයා නීතියේ ආධිපත්‍යයට යටත් වන්නේය.

113. (1) අග්‍රාමාත්‍යවරයා විසින් ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව විසින් ඒ ඒ විෂයන්ට අදාලව අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩලය පත් කල යුතු වන්නේය.

(2) අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය තමන් දරන ධූරයන් හි කාර්ය හා කර්තව්‍ය මහජන විශ්වාසය ගරු කරමින් දැරිය යුත්තේය.

(3) අග්‍රාමාත්‍යවරයා තම අත්සනින් ජනාධිපතිවරයා වෙත යවන ලිපියකින් ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේය.

(4) අග්‍රාමාත්‍ය ධුරය පුරප්පාඩු වූ අවස්ථාවක සහ පාර්ලිමේන්තුව විසිරී ගිය අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය අභිනව පාර්ලිමේන්තුවක් කැඳවීමට මැතිවරණයක් පවත්වා අවසන් වන තුරු තවදුරටත් අමාත්‍ය ධුර දරන්නේය.

(5) ධුරයේ කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීමට අසමත් වීම මත අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය ධුරයෙන් ඉවත් කරනු නොලැබුවහොත් මණ්ඩලයේ අමාත්‍යවරුන් තමන් දරන ධුරයන්හි කාර්ය හා කර්තව්‍ය නියමිත කාල පරිච්ඡේදය සඳහා දරනු ලබන්නේය.

(6) තම අත්සනින් අග්‍රාමාත්‍යවරයා වෙත යවන ලිපියකින් අමාත්‍යවරයෙකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේය.

(7). අමාත්‍යවරයෙකුට තමන් දරන ධුරය කාර්ය හා කර්තව්‍ය තාවකාලිකව දින 30 කට වැඩි කාලයක් සඳහා ඉටු කිරීමට නොහැකි අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් එම අමාත්‍යවරයා දරන ලද ධුරයේ වැඩ බැලීම සඳහා ජනතාව විසින් සම්මත කරන ලද ලේඛනයේ නම් සඳහන් තැනැත්තෙකු එම ධුරයේ වැඩ බැලීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් පත් කල යුත්තේය. එම කාලසීමාව දින 30 කට නොවැඩි වන විට වෙනත් අග්‍රාමාත්‍යවරයෙකු වැඩ බැලීම සඳහා පත් කල යුත්තේය.

114. මෙම පරිච්ඡේදය යටතේ ධුරයක් දැරීම සඳහා පත් කරන සෑම තැනැත්තෙකුම තමන් පත් කරන ලද ධුරයේ වැඩ භාර ගැනීමට ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv උපලේඛනය ප්‍රකාර හෘදය සාක්ෂියට එකඟව, අවංකව, විශ්වාසවන්ත භාවයේ සිධාන්තය ගරු කරමින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන පිළිපදින බවට ප්‍රතිඥාවක් දිය යුත්තේය.

<u>ව්‍යවස්ථාදායක සභාව</u>

115. (1) ජනතාව විසින් පාර්ලිමේන්තු මැතිවරණයේදී අනුමට කරන ලද සාමාජිකයින්ගෙන් 10 දෙනෙකුගෙන් සමන්විත ව්‍යවස්ථාදායක සභාව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කල යුත්තේය. එහි සභාපතිවරයා ව්‍යාවස්ථාදායක සභාව විසින්ම පත් කල යුත්තේය.

(2). අග්‍රාමාත්‍යවරයා අමතා ධුරයෙන් ඉල්ලා අස් වූ අවස්ථාවක හැර ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකුගේ ධුර කාලය වසර 5 ක් වන්නේය. ශාරීරික හෝ මානසික දුබලතාවයක් හේතුවෙන් ධුරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කල නොහැකි අවස්ථාවක හෝ යම් නීතියක් යටතේ චරිත දූෂණය සම්බන්ධ වරදකට වරදකරු වූ අවස්ථාවක ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකුගේ ධුරය අහිමි වන්නේය.

(3) ව්‍යවස්ථාදායක සභාවේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දින 14 ක් ඇතුලත අග්‍රාමාත්‍යවරයා විසින් විසින් ජනතාව විසින් පාර්ලිමේන්තු මැතිවරණයේදී අනුමත කල ලේඛනයෙන් එම පුරප්පාඩුව සඳහා සාමාජිකයෙකු ඉතිරි කාලය සඳහා පත්කළ යුත්තේය.

(4) තම ධුර කාලය සම්පූර්ණ කල ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු නැවත පත් කිරීමට සුදුසුකම් නොලබන්නේය.

116\. (1) මෙම ව්‍යවස්ථාවේ ඇතුලත් වන උපලේඛනයේ සඳහන් වන සියලුම ධුර වලට ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව සුදුසු පුද්ගලයන් අග්‍රාමාත්‍යවරයා විසින් පත් කල යුත්තේය. එම ධුර වලට පත් කිරීමේදී ලිංගික වර්ගීකරණය ඇතුළුව සියලුම ජන වර්ග නියෝජනය වන පරිදි පුද්ගලයන් තෝරා ගැනීම අග්‍රාමාත්‍යවරයාගේ වගකීම වන්නේය. එම ධුර වලට ව්‍යවස්ථාදායක සභාව විසින් අනුමත කල තැනැත්තන් පත් කිරීම අග්‍රාමාත්‍යවරයාගේ වගකීම වන අතර ව්‍යවස්ථාදායක සභාව විසින් අනුමතකල තැනැත්තන් එසේ අනුමත කල දින සිට දින 07 ක් ඇතුලත පත් කිරීමට අග්‍රාමාත්‍යවරයා අපොහොසත් වුවහොත් ව්‍යවස්ථාදායක සභාව විසින් අදාල ධුරයන් සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද තැනැත්තන්ගේ නම් අනුමත කල දින සිට නීතිය ක්‍රියාත්මක වීමෙන් ඔවුන් එම ධුර දැරීම ක්‍රියාත්මක වන්නේය. ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද නම් සහ ඒ සම්බන්ධ ව්‍යවස්ථාදායක සභාවේ තීරණය අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කිරීමත් සමගම ජනතාවගේ අවධානය සඳහා එම නම් ව්‍යවස්ථාදායක සභාවේ වෙබ් අඩවියේ නොපමාව පල කල කිරීමටත් ව්‍යවස්ථාදායක සභාව බැඳී සිටින්නේය.

(2) මැතිවරණ කොමිසම හැරුණු විට ව්‍යවස්ථාදායක සභාව විසින් පත් කරනු ලබන සියලුම ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයින් නීතියේ අධිපත්‍යයට

යටත් වන්නේය. මැතිවරණ කොමිසම ඇතුළුව ඒ ඒ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි වලට යටත්ව අවශ්‍ය අනෙකුත් නිලධාරීන් ඒ ඒ කොමිෂන් සභාව විසින් පත් කළ යුත්තේය. සියලුම කොමිෂන් සභා වල පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වය බරක් වන්නේය.

උපලේඛන

1. මැතිවරණ කොමිසමේ සාමාජිකයන්
2. රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයන්
3. ස්වාධීන පොලිස් කොමිසමේ සාමාජිකයන්
4. විගණන කොමිසමේ සාමාජිකයන්
5. මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන්
6. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ සාමාජිකයන්
7. සීමා නිර්ණය කොමිසමේ සාමාජිකයන්
8. මුදල් කොමිසමේ සාමාජිකයන්
9. මහබැංකුවේ අධිපති හා මුල්‍ය මණ්ඩලයේ සාමාජිකයින්
10. ස්වාධීන ප්‍රසම්පාදන කොමිසමේ සාමාජිකයන්
11. තොරතුරු කොමිෂන් සභාවේ සාමාජිකයින්
12. මහජන උපයෝගිතා කොමිෂන් සභාව
13. රක්ෂණ නියාමන කොමිසමේ සාමාජිකයින්
14. පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ සාමාජිකයින්

15. අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ සියලුම විනිසුරන්

16. අභියාචනාධිකරණයේ සභාපතිවරයා ඇතුළු අභියාචනාධිකරණයේ සියලුම විනිසුරන්

17. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්

18. සියලුම අමාත්‍යාංශවල ස්ථිර ලේකම්වරු

19. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස්

20. පාර්ලිමේන්තුවේ මහා ලේකම්වරයා

21. නීතිපති

22. පොලිස්පති

23. විගණකාධිපති

24. රේගු අධ්‍යක්ෂ ජනරාල්

25. ආදායම් බදු කොමසාරිස් ජනරාල්

26. සුරාබදු කොමසාරිස් ජනරාල්

27. රූපවාහිනී සංස්ථාවේ හා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා

117. (1) අග්‍රාමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත පත් කරන ලද ඕනෑම තැනැත්තෙකුට එරෙහිව එම තැනැත්තා ධුරය දරන අවස්ථාවේදී ධුරය අවභාවිතා කිරීම සම්බන්ධව බැලූ බැල්මටම පිළිගත හැකි චෝදනාවක් ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගෙන් එල්ල වී ඇති අවස්ථාවක, එම චෝදනා සම්බන්ධව විධිමත් ස්වාධීන පරීක්ෂණයක් ව්‍යවස්ථාදායක සභාව විසින්

පැවැත්විය යුත්තේය. එවැනි චෝදනාවක් සම්බන්ධව ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිවරයා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ සභාවක් හමුවේ, ජනතාවට විවෘත විධිමත් පරීක්ෂණයක්, දින හතක ඇතුලත පවත්වා අවසන් නිගමනය ප්‍රකාශ කල යුත්තේය. එම නිගමනය ව්‍යවස්ථාදායක සභාවේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කල යුත්තේය. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය චෝදනා ලබන තැනැත්තා ධුරයෙන් ඉවත් කිරීම වන්නේ නම් අග්‍රාමාත්‍යවරයා විසින් වහාම ඔහු ධරණ ධුරයෙන් ඉවත් කල යුත්තේය.

(2) ඒ පරිච්ඡේදය යටතේ ව්‍යවස්ථාදායක සභාව විසින් ප්‍රකාශයට පත කරන ලද නිගමනයට එරෙහිව එම නිගමනය බලපැවැත්වීමට යටත්ව, එම නිගමනයෙන් අතෘප්තියට පත් තැනැත්තාට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේය. එවැනි අභියාචනයක් මාස 03 ක් ඇතුලත විභාග කර තීන්දු ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය බැඳී සිටින්නේය.

118. (1) ව්‍යවස්ථාදායක සභාව විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු වන්නේය. ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසුව නැවත පත්කිරීමට සුදුසුකම් ලබන්නේය.

(2) ව්‍යවස්ථාදායක සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි වලට යටත්ව ව්‍යවස්ථාදායක සභාවට පැවරෙන කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් පත් කිරීමේ බලය ව්‍යවස්ථාදායක සභාව සතු වන්නේය.

119. (1) මෙම පරිච්ඡේදයෙන් ව්‍යවස්ථාදායක සභාව වෙත පැවරී ඇති කාර්ය ඉටු කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාව අවම

වශයෙන් මසකට දෙවරක්වත් සභාපති වරයාගේ උපදෙස් පරිදී එහි ලේකම්වරයා විසින් කැඳවිය යුත්තේය.

(2) සභාවේ සියලුම රැස්වීම් වල මුලසුන ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිවරයා විසින් හෙබවිය යුත්තේය. සභාපතිවරායා නොමැති අවස්ථා වල ධූරයේ කටයුතු කිරීම සඳහා වැඩ බලන සභාපතිවරයකු පත්කළ යුත්තේය.

(3) ව්‍යවස්ථාදායක සභාවේ පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ගන්න ලද තීරණ වලංගු වන්නේය.

(4) ඡන්දය විමසන අවස්ථාවක ප්‍රකාශිත ඡන්දය සමාන වන අවස්ථාවක් පමණක් සභාපතිවරයා ඡන්දය ප්‍රකාශ කල හැක්කේය.

(5) ව්‍යවස්ථාදායක සභාවේ රැස්වීම් සම්බන්ධ කාර්ය පටිපාටිය ව්‍යවස්ථාදායක සභාව විසින් තීරණය කල යුත්තේය.

(6) ව්‍යවස්ථාදායක සභාවේ යම්කිසි සාමාජිකයකු සභාපතිවරයාගේ පූර්ව අවසරය නොලබා අනුක්‍රමික රැස්වීම් වාර තුනකට නොපැමිණි අවස්ථාවක එම සාමාජිකයාගේ ධූරය අහෝසි වන්නේය.

(7) ව්‍යවස්ථාදායක සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවූ අවස්ථාවකදී සහ එහි සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුනද ඒ බව නොසලකා ක්‍රියා කිරීමට ව්‍යවස්ථාදායක සභාවට බලය ඇත්තේය. එවැනි හේතුවක් මත සභාවේ යම් තීරණයක් හෝ ක්‍රියාවක් අවලංගු නොවන්නේය.

120. සභාවේ සාමාජිකයන්ගේ හෝ සාමාජිකයන්ගේ ධූර කාලය ඉකුත් වී ඇති අවස්ථාවක අවස්ථාවෝචිත පරිදී සභාවට නව

සාමාජිකයන් පත් කර ධුරයේ වැඩ භාර ගන්නා තෙක් එහි සාමාජිකයන් තවදුරටත් ධුරය දරන්නේය.

121. (1) ව්‍යවස්ථාදායක සභාව විසින් එහි කටයුතු පිළිබඳව මාස තුනකට වරක් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කල යුත්තේය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් ව්‍යවස්ථාදායක සභාව වෙත පැවරෙන කාර්ය හා කර්තව්‍යය එම සභාව විසින් ක්‍රියාත්මක කල යුත්තේය.

(3) ව්‍යවස්ථාදායක සභාව වෙත පැවරෙන කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීම සහ ඉටුකිරීමට අදාළ රීති ව්‍යවස්ථාදායක සභාව විසින් සම්පාදනය කලයුතු වන්නේය. එම රීති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කල යුත්තේය.

122. ව්‍යවස්ථාදායක සභාවේ වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

123. මූලික අයිතිවාසිකම් පිළිබඳව අධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලයට යටත්ව ව්‍යවස්ථාදායක සභාව විසින් එළඹෙන තීරණ හෝ සභාවේ නිර්දේශ විභාග කිරීමට ඒ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට කවර හේතුවක් මත කිසිදු අධිකරණයකට අධිකරණ බලය නැත්තේය.

124. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත පත් කරනු ලබන තැනැත්තන් වයස අවුරුදු 65 දක්වා ධුර දරන්නේය.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

125. (1) ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මින් අනතුරුව සභාව නමින් හඳුන්වන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් වන්නේය. එහි සාමාජිකයන් අතුරින් සාමාජිකයන් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රාජ්‍ය සේවයේ වසර 20 කට නොඅඩු පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තේය. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් එහි සභාපතිවරයා පත්කළ යුත්තේය.

(2) එහි සාමාජිකයන් අතුරින් යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජියෙකු වන්නේ නම් එම තැනැත්තා තවදුරටත් එහි සාමාජිකයකු ලෙස කටයුතු නොකල යුත්තේය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කිරීමට පෙර රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ නිලධාරියෙකු වූ තැනැත්තෙකු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමෙන් අනතුරුව රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ නිලධාරියෙකු ලෙස නොසැලකෙන්නේය. එවැනි නිලධාරියෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පත් කිරීමත් සමගම ඔහු රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ දරන ලද තනතුර අහෝසි වන්නේය.

එසේ වුවද එවැනි යම් තැනැත්තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කළ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදී ඔහු රාජ්‍ය නිලධාරියකු හෝ අධිකරණ නිලධාරියකුව සිටියේ නම් එකී නිලධාරියා එම සේවා වලින් විශ්‍රාම ගැනීමට නියමිත වසරට එළඹීම එම තැනැත්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටියදී සිදු වුවහොත් එකී සේවය වෙනුවෙන් ඔහු වෙත ප්‍රධානය කෙරෙන විශ්‍රාම වැටුප් හා වෙනත් පාරිතෝෂික දීමනා ලැබීම සඳහා ඔහු රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි ධුරයක් දරන තැනැත්තෙකු ලෙස සැලකෙන්නේය.

(4) කොමිෂන් සභාවේ සමාජිකයකු මෙම ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ යම් නුසුදුසුකමකට භාජනය වුවහොත් හෝ අග්‍රාමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් නියමිත දිනට පෙර ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාවේ 117 ව්‍යවස්ථාවට යටත්ව ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් මත අධිකරණය විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවයකට පත්කළ යුතු බවට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් කොට ඇත්නම් මිස හෝ ධූරය අතහැර යන ලද සේ සලකනු ලැබුවහොත් මිස ඔහු පත්කරනු ලැබූ දින සිට වසර තුනක් ධුරය දැරිය යුත්තේය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු එහි සාමාජිකයකු ලෙස නැවත පත් කිරීමට සුදුසුකම් ලබන්නේය. එසේ වුවද කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් අනතුරුව රජයේ නිලධාරියෙකු

ලෙස හෝ අධිකරණ නිලධාරියෙකු ලෙස නැවත පත් කිරීමට සුදුසුකම් නොලබන්නේය.

කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු අවස්ථා දෙකකට වඩා එහි සාමාජිකයකු ලෙස ධුරය දැරීමට නුසුදුසු වන්නේය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයකු එහි සභාපතිවරයාගෙන් පූර්ව අවසරය නොලබා අනුක්‍රමික රැස්වීම් වාර තුනකට නොපැමිණ සිටි අවස්ථාවකදී එම තුන්වන රැස්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදී ඔහු දුරය අත්හැර ගොස් ඇතැයි සැලකෙන්නේය. එවැනි සාමාජිකයකු ඉන් අනතුරුව කොමිසමේ සාමාජිකයකු ලෙස පත් කිරීමට සුදුකම් නොලබන්නේය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයකුට මාස දෙකක කාලයක් නොඉකමවන කාලයක් සඳහා නිවාඩු අනුමත කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේය. එම කාලය තුල ඔහුගේ ධුරයේ වැඩ බැලීමට ව්‍යවස්ථාදායක සභාව විමසා තාවකාලික සාමාජිකයකු පත් කිරීමට අග්‍රාමාත්‍යවරයා ක්‍රියාකළ යුත්තේය.

(8) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පරිශ්‍රමික ගෙවිය යුත්තේය. එය රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. ධුර කාලය තුල එම පරිශ්‍රමික අඩු නොකළ යුත්තේය.

(9) කොමිෂන් සභාවේ යම් ධුරයක් හිස්ව තිබුනද, කොමිෂන් සභාවට ක්‍රියාකිරීමට එය බාධාවක් නොවන්නේය. තවද යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් පසු අනාවරණය වුවද එයින් කොමිෂන් සභාව විසින් එළඹෙන තීරණ වලට කිසිදු හානියක් නොවන්නේය.

(10) කොමිෂන් සභාවට ලේකම්වරයෙක් වන්නේය. ඔහු කොමිෂන් සභාව විසින් පත්කළ යුත්තේය.

(11) කොමිෂන් සභාවේ සාමාජිකයන් දණ්ඩනීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකෙන්නේය.

126. (1) රජයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු වීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු සියලුම ප්‍රතිපත්තිමය කාරනා සම්බන්ධව රාජ්‍ය සේවා කොමිසම විසින් විධි විධාන සැලැස්විය යුත්තේය.

(2) ව්‍යවස්ථාවෙන් විශේෂ විධිවිධාන සලසා නොමැති සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධව ඔවුන් පත් කිරීම, උසස් කිරීම, ස්ථානමාරු වීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු, සියලුම ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව ව්‍යාවස්ථාදායක සභාව විසින් විධිවිධාන සැලැස්විය යුත්තේය.

(3) ව්‍යවස්ථාදායක සභාව මගින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා නොමැති රජයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථානමාරු වීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු, සියලුම ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිසම විසින් විධිවිධාන සැලැස්විය යුත්තේය.

(4) කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය ඉටුකිරීම සම්බන්ධව කොමිෂන් සභාව එක් එක් ලිත් වර්ෂය තුල සිදුකරන කටයුතු වල වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුත්තේය.

127 (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන රාජ්‍ය සේවයේ යම් සේවාවකට අයත් නිලධාරීන්ගේ පත්

කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු වීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම ඇතුළු, සියලුම ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව තිදෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය සේවා කොමිසම විසින් පත් කරන කමිටුවක් වෙත බලය පැවරිය හැක්කේය.

(2) එවැනි කමිටුවක් රාජ්‍ය සේවා කොමිසම විසින් පත් කරනු ලැබූ අවස්ථාවක ඒ පිළිබඳව ගැසට් පත්‍රයේ දැන්වීමක් පලකල යුත්තේය.

(3) එවැනි කමිටුවක රැස්වීම් සම්බන්ධ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම් සඳහා සනපුර්ණය කොමිෂන් සභාව විසින් තත් කාර්ය සඳහා සම්පාදනය කරන රීති වලින් නිශ්චය කලයුත්තේය.එම රීතිද ගැසට්පත්‍රයේ දැන්වීමක් පලකල යුත්තේය.

(4) ඒ එක් එක් කමිටුව සඳහා කමිෂන් සභාව පත් කරන ලේකම්වරයකු වන්නේය.

128. යම් නිශ්චිත ගනයක රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ඔවුන්ගේ පත් කිරීම්, උසස්කිරීම, ස්ථානමාරු වීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු, සියලුම ප්‍රතිපත්තිමය කාරනා සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන කොන්දේසි හා කාර්ය පටිපාටි වලට යටත්ව එහි බලය රාජ්‍ය නිලධාරියකු වෙත පැවරිය හැක්කේය.

129. (1) කොමිෂන් සභාව විසින් එසේ වෙනත් රාජ්‍ය නිලධරයකු වෙත කොමිෂන් සභාව සතු බලය පවරා ඇති අවස්ථාවක මාස හයක් ඇතුලත් තමන් සම්බන්ධව එම රාජ්‍ය නිලධාරියා විසින් නියම කරන තීරණයෙන් අතෘප්තියට පත්වන පාර්ශවයට ඊට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන්

සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේය. අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඇතුළුව අදාළ කාර්ය පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ගැසට් පත්‍රයේ පල කල යුත්තේය.

(2) එවැනි අභියාචනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක එය විමර්ශනය කර කොමිෂන් සභාව සුදුසු යැයි සලකන තීරණයක ප්‍රකාශයට පත් කල හැක්කේය.

130. ඉහත 129 වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නිලධාරියකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තම බලතල පවරා ඇතිවිට එම බලය පැවරීම වලංගුව පවතින තාක්කල්, එම බලතල පවරා ඇත්තේ රාජ්‍ය සේවයෙන් යම් නිලධාරීන් සම්බන්ධයෙන්ද ඔවුන්ගේ පත් කිරීම්, මාරුකිරීම්, උසස් කිරීම්, විනය පාලනය හා සේවයෙන් නෙරපා හැරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මැදිහත් නොවිය යුතුයි.

131. (1) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා සනපුර්ණය සාමාජිකයන් පස්දෙනෙකු වන්නේය.

(2) කොමිෂන් සභාවේ සියලුම තීරණ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේය. ඡන්දය සමාන වන අවස්තාවකදී පමණක් මුලසුන දරන සාමාජිකයාට තම ඡන්දය පාවිච්චි කල හැක්කේය.

(3) කොමිෂන් සභාවේ සභාපති සෑම විටම සභාවේ සියලු රැස්වීම් වල මුලසුන දැරිය යුත්තේය. ඔහු නොපැමිණි විට පමණක් සාමාජිකයින් අතුරින්

පත්කරගන්නා සාමාජිකයකු මුලසුන දැරිය යුත්තේය.

## පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය

132. (1) ව්‍යවස්ථාදායක සභාව විසින් පත්කරනු ලබන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියක් වන්නේය.

(2) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද යම් නියමයක් හෝ තීරණයක් ස්ථිර කිරීමට, වෙනස් කිරීමට හෝ බල රහිත කිරීමේ බලය පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඇත්තේය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කල හැකි කාලසීමාව ඇතුළුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියේ සංයුතිය බලතල හා කාර්ය පටිපාටිය නීතියෙන් නියම කල යුත්තේය.පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කෙරෙන අභියාචනයක් එම අභියාචනය දිරිපත් කල දින සිට මාස හයක් ඇතුලත විභාග කොට තීන්දු ප්‍රකාශ කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය බැඳී සිටින්නේය.

133. රජයේ නිලධාරියෙකු සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදය යටතේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරෙන අවසාන තීරණයකට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේය.

134. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලසන තෙක් රාජ්‍ය සේවයට අදාලව බලපවත්නා වූ සියලුම රීති හා කාර්ය පටිපාටිය අවශ්‍ය වෙනස්කිරීම් වලට යටත්ව තවදුරටත් බලාත්මක වන්නේය.

135. කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් මේ පරිච්ඡේදය යටතේ බලය පවරනු ලැබූ එහි අනු කමිටුවක හෝ රජයේ නිලධාරියකු විසින් ප්‍රකාශයට පත් කරන ලද තීරණයකට එරෙහිව කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් බලපෑමක් කිරීම හෝ බලපෑමක් කිරීමට තැත් කිරීම වරදක් වන්නේය. එසේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය හෝ බන්ධනාගාර ගතකිරීම යන දඬුවම් දෙකටම යටත් වන්නේය. මෙම ව්‍යවස්ථාව යටතේ වන වරදක් විනිශ්චය කිරීමේ අධිකරණ බලය මහාධිකරණය වෙත පැවරෙන්නේය.එවැනි නඩුවක් පවරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුලත විභාග කොට තීන්දු ප්‍රකාශ කිරීමට මහාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

136. මේ පරිච්ඡේදය යටතේ කවර හෝ ධුරයකට පත්කරනු ලබන තැනැත්තෙකුම ජනතාව සතුවන ජනතා පරමාධිපත්‍ය බලයට සහ නීතියේ ආධිපත්‍ය ගරු කිරීමට බැඳී සිටින්නේය. ඔවුන් සියලුදෙනාම තමන් පත් කරන ලද ධුරයන්හි වැඩ භාර ගැනීමට ප්‍රථම ව්‍යවස්ථාවේ iv උපලේඛනය ප්‍රකාර හෘද සාක්ෂියට එකඟව, අවංකව ජනතාව තමන් කෙරෙහි තබා ඇති විශ්වාසය ගරු කරමින් රටේ නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන අනුගමනය කරන බවට ප්‍රතිඥාවක් දිය යුත්තේය.

137. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා “රජයේ නිලධාරියා” යන්නට ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කරන නිලධාරීන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන උපලේඛනගත නිලධාරීන්, විගණන සේවයේ නිලධාරීන් අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, විගණකාධිපති, රේගු අධ්‍යක්ෂ ජනරාල්, ආදායම් බදු කොමසාරිස් ජනරාල්, සුරාබදු කොමසාරිස් ජනරාල්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස්, පාර්ලිමේන්තු මහලේකම් සහ නීතියෙන් පත් කරන ලද කොමිෂන් සභා වල සාමාජිකයින් ඇතුලත් නොවන්නේය.

## VIII වන පරිච්ඡේදය

## අධිකරණය

138. ජනතා පරමාධිපත්‍යයේ වැදගත්ම අංගයක් වන අධිකරණ බලය බලගැන්වීමේ, ආරක්ෂා කිරීම, තහවුරු කිරීමේ සහ යුක්තිය පසිඳළන ආයතනය, අධිකරණය වන්නේය. ජනතාව සතු අත්හල නොහැකි, උදුරාගත් නොහැකි පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීම විශ්වාසය මත පවරා ඇති ව්‍යවස්ථාදායකය සහ විධායකය ජනතා පරමාධිපත්‍ය බලය ගරු කරන බව වගබලා ගැනීම අධිකරණයේ වගකීම වන්නේය. අධිකරණය ජනතා පරමාධිපත්‍ය බලය ප්‍රවර්ධනය කල යුතු වන්නේය, ආරක්ෂා කල යුත්තේය. අධිකරණය හමුවේ පවරන කිසිම නඩුකරයක්, නඩුවේ හරය නොසලකා තාක්ෂණික හේතු මත ප්‍රතික්ෂේප නොකළ යුත්තේය.

139. ශ්‍රේෂ්ඨාධිකරණය 15 දෙනෙකුට නොවැඩි විනිසුරු සංඛ්‍යාවකින්ද, අභියාචනාධිකරණය 15 දෙනෙකුට නොවැඩි විනිසුරු සංඛ්‍යාවකින්ද, සමන්විත වන්නේය. එම විනිසුරන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 65 වන්නේය. ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට විනිසුරුන් පත් කිරීම සඳහා යෝජනා කරන නම්, තීරණය කිරීම අග්‍රාමාත්‍යවරයාගේ වගකීම වන්නේය. අග්‍රාමාත්‍යවරයා යෝජනා කරන නම් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ව්‍යවස්ථාදායක සභාව සතු වන්නේය. ව්‍යවස්ථාදායක සභාව විසින් පිලිගෙන අනුමත කරන ලද තැනැත්තන් පමණක් ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරන් ලෙස අග්‍රාමාත්‍යවරයා විසින් පත් කල යුත්තේය.

140. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන සෑම නීතියක්ම, පුද්ගල නීති සහ වෙනත් ලිඛිත නොවූ නීති හා චාරිත්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන බවට පරීක්ෂා කිරීම සහ අනුකූල නීති අවලංගු කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන්නේය.

141. ජනතාව සතු වන අධිකරණ බලය වගකීමෙන් බලගන්වන බවට වගකීම සහ ඒ සඳහා අවශය ක්‍රමවේදය සම්පාදනය කිරීමේ වගකීම අග්‍රවිනිශ්චයකාරවරයාගේ වගකීම වන්නේය. ව්‍යවස්ථාවේ ii හා iii වන පරිච්ඡේදයෙන් පිළිගෙන ව්‍යවස්ථා ගත කොට ඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ බල ගැන්වීම සඳහා පවරන නඩුකර සම්බන්ධව කඩිනමින් යුක්තිය පසිඳලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර කාර්යක්ෂම හා විධිමත් ක්‍රමවේදයක් සම්පාදනය කිරීම අග්‍රවිනිශ්චයකාරවරයාගේ වගකීම වන්නේය.

142. ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හමුවේ පවරන ලද ඕනෑම නඩුකරයක් මාස 6 තුල විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

143. තිර ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ පවරන ලද මුලික අයිතිවාසිකම් නඩුකර, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් නීතිය යටතේ පවරන නඩුකර,මුල්‍ය අපරාධ සම්බන්ධ පවරන නඩුකර ඇතුලත් සියලුම නඩු මාස 6 ක් තුල විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

144. මහාධිකරණය හමුවේ පවරන ලද නඩුකරයක් මාස 12 ක් තුල විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

145. දිස්ත්‍රික් අධිකරණය හමුවේ පවරන ලද නඩුකරයක් මාස 12 ක් තුල විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

146. මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ වෙනත් ඕනෑම විනිශ්චය අධිකාරයක් හමුවේ පවරන ලද හෝ විභාග වන නඩුකරයක් හෝ පරීක්ෂණයක් මාස 12 ක් තුල විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

147. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 142, 143, 144, 145, 146 ව්‍යවස්ථා යටතේ යුක්තිය පසිඳලීම සඳහා පනවා ඇති කාල සීමා අනුගමනය කරන බවට අධිකරණය සෘජු වගකීමට බැඳී සිටින්නේය. ව්‍යවස්ථාපිත වගකීම පැහැරහරින විනිසුරන් නීතිය ක්‍රියාත්මක වීමෙන් අකාර්යක්ෂමතාව, දක්ෂතාව සහ වගකීම පැහැර හැරීම මත අධිකරණ සේවයෙන් ඉවත් කෙරෙන්නේය.

148. අධිකරණ සේවයේ නියුතු කිසිදු විනිසුරුවරයෙකු නීතියෙන් නියම කර ඇති වැටුප් හා පාරිතෝශිත වලට අමතරව වෙනත් කිසිදු රජයේ දේපලක් පරිත්‍යාගයක් ලෙස ලැබීමට නුසුදුසු වන්නේය. විශ්‍රාම යාමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරන් වැටුප් හෝ වෙනත් දීමනා ගෙවනු ලබන රජයේ කිසිදු තනතුරකට පත් කිරීමට නුසුදුසු වන්නේය.

149. අධිකරණ සේවයේ නියුතු සියලුම විනිසුරන්ගේ උසස්වීම් කාර්යක්ෂමතාව සහ කුසලතා මත පමණක් සිදුවිය යුත්තේය, අධිකරණ සේවයේ පත්වීම් සහ උසස් වීම් තරයේ අධිකරණ සේවයේ නියුතු විනිසුරන්ට පමණක් සීමා වන්නේය.

150. අග්‍රවිනිශ්චයකාරවරයාට අධිකරණ කටයුතු විධිමත්ව පරිපාලනය කිරීම සඳහා ව්‍යවස්ථාවේ 177 ව්‍යවස්ථාවෙන් පවරා ඇති රීති පැනවීමේ බලය යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීම සඳහා සහ අධිකරණ කටයුතු විධිමත්ව

පවත්වා ගැනීමට රීති පැනවීමට පමණක් සීමා වන්නේය. අධිකරණයට වෙනම නිවාඩු ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා රීති පැනවීමේ බලය ඊට ඇතුලත් නොවන්නේ. අධිකරණ කාලය අධිකරණ කටයුතු නොවන කටයුතු සඳහා යොදා නොගත යුත්තේය.

151. අධිකරණ සේවයේ නියුතු විනිශ්චයකාරයකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා මත හෝ වෙනත් මූල්‍ය අපරාද චෝදනා සම්බන්ධව අධි චෝදනා මත මහාධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක වහාම ක්‍රියාත්මක වන පරිදී නීතිය ක්‍රියාත්මක වීමෙන් ඔහුගේ වැඩ තහනම් වන්නේය. එවැනි චූදිතයකු චෝදනා වලට වරදකරු වූ වහාම ධූරයෙන් නෙරපා හැරීමටත් දේපල රාජසන්තක කිරීමටත් වරදේ ස්වභාවය අනුව ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබීමට හෝ මරණ දණ්ඩනයට යටත් වන්නේය.

152. යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීම සඳහා නඩු කටයුතු පරිපාලනය කිරීමේ ක්‍රමවේද (Case Management System) සම්පාදනය කිරීමේ වගකීම අධිකරණ සේවා කොමිසම් සභාව වෙත පැවරෙන්නේය. සෑම අධිකරණයකම කටයුතු උදේ සහ සවස අවම වශයෙන් පැය 6 ක කාලයක් සඳහා දෙවරක් පැවැත්විය යුත්තේය. අධිකරණ කටයුතු සදහා ව්‍යවස්ථාවෙන් නියම කර ඇති කාලය අධිකරණ කටයුතු නොවන වෙනත් බාහිර කටයුතු සදහා පාවිච්චි කරන විනිසුරන්ට එරෙහිව නිසි විනය පියවර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීමේ බලය ජනතාව සතු වන්නේය.

153. අධිකරණයේ භාරයට ගනු ලබන දේපළ මසක් ඇතුලත නිදහස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම අනිවාර්ය වන්නේය. එම වගකීම පැහැර හරින

විනිසුරන්ගේ විනිසුරු ධුරය වගකීම නොපිරිහෙලා ඉටු කිරීමේ නොහැකියාව මත සහ අකාර්යක්ෂමතාව මත නීතිය ක්‍රියාත්මක වීමෙන් අහිමි වන්නේය. මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකරණ සේවා කොමිසම් සභාව වෙත පැවරෙන්නේය. නීතියෙන් නියම කර ඇති වගකීම පැහැර හරින විනිසුරන්ට එරෙහිව නිසි විනය පියවර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරිමේ බලය ජනතාව සතු වන්නේය.

154. ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරයේ විනිසුරන් ව්‍යවස්ථාවේ iv උප ලේඛනය ප්‍රකාර ජනතාව සතු වන උදුරාගත නොහැකි පරමාධිපත්‍ය බලයට අවනතව, හෘද සාක්ෂියට එකඟව, අවංකව, විශ්වාසවන්ත භාවයේ සිද්ධාන්තය ගරු කරමින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගෙන පිලිපදින බවට, යුක්තිය පසඳලීමේ වගකීම ඉටුකිරීමේදී විනිවිදභාවය ආරක්ෂා කරමින් ඉටු කරන බවට, දිවුරුමක් / ප්‍රතිඥාවක් දීමට නීතියෙන් බලය පවරා ඇති අයෙකු හමුවේ දියයුතු වන්නේය. අනෙකුත් සියලුම විනිසුරන් එම දිවුරුම / ප්‍රතිඥාව අධිකරණ සේවා කොමිෂන් සභාව හමුවේ දියයුතු යුත්තේය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

155. අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨම විනිසුරන් දෙදෙනාගේ සමන්විත අධිකරණ සේවා කමිෂන් සභාවක් වන්නේය. අග්‍ර විනිශ්චකාරවරයා කොමිසමේ සභාපතිවරයා වන්නේය. කොමිෂන් සභාවේ සාමාජිකයින් ජනතාව විසින් පත් කරන ලද ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව අග්‍රමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේය.

156 (1) අධිකරණ සේවා කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා සන පූර්ණය සාමාජිකයන් දෙදෙනෙකු වන්නේය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදී ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකු ලෙස ක්‍රියා කිරීම නතර වුවහොත් මිස පත්කරනු ලැබූ දින සිට වසර තුනක් සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කල හැක්කේය. ඔවුන් නැවත පත් කිරීමටද සුදුසු වන්නේය.

(3) කොමිෂන් සභාවේ රැස්වීම් වල සියලු තීරණ බහුතර ඡන්දයෙන් විය යුත්තේය. ඡන්ද සංඛයාව සමාන වූ අවස්ථාවක පමණක් එහි සභාපතිවරයාට ඡන්දය පාවිච්චිකළ හැක්කේය.

(4) කොමිෂන් සභාවේ ධුරයක් හිස්ව තිබුනද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේය.තවද එසේම යම් ධුරයක් හිස්ව තිබීම හෝ පත් කරන ලද සමාජියෙකුගේ යම් දෝෂයක් තිබීම මත කොමිෂන් සභාවේ තීරණ කිසිවක් බල රහිත නොවන්නේය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකුට නිවාඩු අනුමත කිරීම අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකල යුතු වන්නේය. එවැනි අවස්ථාවක තාවකාලිකව එම කාලය තුල වැඩ බැලීම සඳහා සුදුසු සාමාජිකයකු ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍ය වරයා විසින් පත්කළ යුත්තේය.

(6) අග්‍රාමාත්‍යවරයාට කොමිෂන් සභාවේ සාමාජිකයකු ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියෙන් ඉවත් කිරීමට හේතු දක්වා ඉවත් කල හැක්කේය.

157. පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පරිශ්‍රයක් කොමිෂන් සභාවේ සාමාජිකයන් වෙත ගෙවිය යුත්තේය. එය රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. තවද එම ගෙවීම එම සාමාජිකයන් දරන ස්ථිර ධුරයට අමතර ගෙවීමක් වන්නේය.

158. කොමිෂන් සභාවට ලේකම්වරයෙක් වන්නේය. ඔහු මුල් අවස්ථා අධිකරණයක ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධාරියකු විය යුත්තේය.

159.

(1) අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත

(අ) මුල් අවස්ථා අධිකරණ වල විනිසුරන් ජනතාවගේ අධිකරණ බලය නීතිය ආධිපත්‍ය හා අධිකරණයේ ස්වාධීනත්වය ගරු කරමින්, ජනතාව අධිකරණය වෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කරමින්, තම ධුරයන්හි වගකීම කාර්යක්ෂමව හා අපක්ෂපාතීව විනිවිදභාවයකින් ඉටුකරන බවට සෑහීමට පත් වීම සඳහා දිවයින පුරා ඇති සියලුම මුල් අවස්ථා අධිකරණ වල කටයුතු දැනුම්දීමකින් තොරව පරීක්ෂා කිරීමේ බලය.

(ආ) එම අධිකරණ වල විනිසුරන්ගේ පත්කිරීම් , මාරු කිරීම්, උසස් කිරීම්, විනය පාලනය සම්බන්ධ අවශ්‍ය කාර්ය පටිපාටිය සම්පාදනය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමේ බලය.

(ඈ) මහාධිකරණ විනිසුරන්ගේ ස්ථානමාරු වීම් පිලිබඳ ස්වාධීනව තීරණ ගැනීමේ බලය.

(ඉ) මහාධිකරණ විනිසුරන් සහ අනෙකුත් අධිකරණ නිලධාරීන් සහ උපලේඛන ගත රජයේ නිලධාරීන් බඳවා ගැනීම, පුහුණුකිරීම්, පත් කිරීම, උසස්කිරීමේ, සහ ස්ථාන මාරු කිරීමේ බලය.

(2) උපලේඛන ගත රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩි වීමක් සහිත ස්ථාන මාරුවක් නොවන සියලුම මාරුවීම් ක්‍රියාත්මක කිරීමේ බලයා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පල කරන දැන්වීමක් මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට පැවරිය හැක්කේය.

160. යම් අධිකරණ නිලධාරියෙකුට හෝ උප ලේඛනගත රජයේ නිලධාරියෙකුට කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා ස්වකීය අත්සනින් යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැක.

161. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ නිලධාරියකු ස්වකීය කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමෙහිලා සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරිය නොහැක්කේය.

162. (1) කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයකට සෘජුව හෝ අන්‍යාකාරයෙන් බලපෑමක් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම වරදක් කරන්නේය. එවැනි වරදකට වරදකරු වන තැනැත්තෙකු රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන සිර දඬුවමට හෝ එම දඩයට සහ සිර දඬුවමට යටත් වන්නේය.

(2) මෙම ව්‍යවස්ථාව යටතේ වන වරදක් සම්බන්ධ නඩුවක් විභාග කිරීමේ සහ තීරණය කිරීමේ අධිකරණ බලය මහාධිකරණය සතු වන්නේය. එවැනි නඩුවක් අධිකරණය හමුවේ පවරන ලද දින සිට මාස හයක් ඇතුලත විභාග කොට තීන්දු ප්‍රකාශ කිරීමට මහාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

163. (1) මෙම පරිච්ඡේදයේ,

යටතේ තනතුරක් සඳහා, “පත් කිරීම” යන්නෙන් කවර හෝ තනතුරක් සඳහා වැඩ බැලීම සඳහා පත් කිරීමක්ද ඇතුලත් වේ.

‘අධිකරණ නිලධාරියා’ යන්නෙන් යුක්තිය පසිදැලීම සඳහා යම් කම්කරු හෝ වෙනත් ආරවුලක් විනිශ්චය කිරීම සඳහා හෝ පිහිටුවන ලද මුල් අවස්ථා අධිකරණයක. විනිශ්චය අධිකාරියක හෝ ආයතනයක විනිශ්චකාරවරයා, මුලසුන දරන නිලධාරියා හෝ සාමාජිකයකු අදහස් කෙරෙන්නේය. නමුත් එයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු මහාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු හෝ සමථය කිරීමේ කර්තව්‍ය ඉටු කරන තැනැත්තෙකු හෝ තමාගේ ප්‍රධාන කාර්ය අධිකරණ ස්වභාවයේ කාර්යයක් ඉටු කරන අයකු අදහස් නොකෙරේ.

‘උපලේඛනගත රජයේ නිලධාරියා’ යන්නෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ටාර්වරයා, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ සහ කවර හෝ මුල් අවස්ථාවේ අධිකරණයක පිස්කල්වරයා හෝ නියෝජ්‍ය පිස්කල්වරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාධිකරණයේ,

මහාධිකරණයේ හෝ මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයේ කරන නිලධාරීන් සහ අධිකරණ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරන රජයේ නිලධාරියකු අදහස් වේ.

(2) යම් තැනැත්තෙකු අධිකරණ නිලධාරියකු වන්නේද එසේ නොවන්නේද යන ප්‍රශ්නයකදී එය තීරණය කිරීමේ බලය අධිකරණ කොමිෂන් සභාව වෙත පැවරෙන්නේය. ඒ පිළිබඳව අධිකරණ කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.

(3) යම් තැනැත්තකු විසින් කරන ලද ක්‍රියාවක් හෝ එවැනි තැනැත්තකු හමුවේ පවරන ලද නඩු කටයුත්තක් හෝ එම තීන්දු ප්‍රකාශය අධිකරණ කොමිෂන් සභාව විසින් ඔහු අධිකරණ නිලධාරියකු නොවන්නේ යැයි තීරණය කිරීමේ හේතුව මත බලරහිත නොවන්නේය.

## නීතිඥ නියාමන කොමිෂන් සභාව

164 (1) නීතිඥ වෘත්තීය නියාමනය කිරීම සඳහා විශිෂ්ඨත්වයෙන් හා අවංකභාවයෙන් යුත්, කීර්තිමත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත නීතිඥ නියාමන කොමිසමක් වන්නේය. එම කොමිසම අධිකරණ අමාත්‍යවරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතියෙන් පත්කල යුත්තේය. විධිමත් නීතිඥ වෘතියක් පවත්වාගන යාම සඳහා අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කිරීමේ බලය නීතිඥ නියාමන කොමිෂන් සභාව සතු වන්නේය. අධිකරණයට අපහාස කිරීමේ චෝදනා ඇතුළුව නීතිඥ වෘත්තීය අවභාවිත කිරීම, විෂමාචාරයේ යෙදීම පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ අධිකාරී බලය නීතිඥ

නියාමන කොමිෂන් සභාව වෙත පැවරෙන්නේය. නීතිඥ වෘත්තිය අවභාවිතා කිරීම සහ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ සියලුම චෝදනා නියාමන කොමිෂන් සභාව වෙත යොමුකළ යුත්තේය.

(2) නීතිඥ වෘත්තියේ යෙදෙන පුද්ගලික නීතිඥ සේවයේ නියුතු සියලුම නීතිඥයන් මෙන්ම රජයේ නීතිඥයන් සම්බන්ධ විනය පාලනය නීතිඥ නියාමන කොමිෂන් සභාවේ වගකීමට යටත් වන අතර යහපත් නීතිඥ වෘත්තියක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන වෘත්තීය හැසිරීම හා වෘත්තීය ආචාර ධර්ම මාලාවක් සම්පාදනය කිරීම හා රීති පැනවීම නීතිඥ නියාමන කොමිෂන් සභාවේ වගකීම වන්නේය. නියාමන කොමිසම පනවන සියලුම රීති සහ රෙගුලාසි ගැසට් පත්‍රයේ සහ නියාමන කොමිසමේ වෙබ් අඩවියේ පලකල යුත්තේය.

(3) නීතිඥ වෘත්තීය අවභාවිත කිරීම සම්බන්ධව මහජනයා විසින් සහ අධිකරණය විසින් යොමු කෙරෙන පැමිණිලි විභාග කිරීම සහ වරදකරුවන් වන නීතිඥයන් වෘත්තියෙන් නෙරපා හැරීම, සේවයේ අත්හිටුවීම හා දණ්ඩන පැනවීමේ අධිකාරී බලය නීතිඥ නියාමන කොමිෂන් සභාව සතු වන්නේය.

(4) නීතිඥ නියාමන කොමිෂන් සභාවවෙත යොමු කෙරෙන අධිකරණයට අපහාස කිරීමේ පිළිබඳ පැමිණිලි ඇතුලුව සියලු පැමිණිලි වාර්තා කිරීම , විමර්ශනය කිරීම, විභාග කිරීම සහ අවසාන තීන්දු ප්‍රකාශ කිරීම එවැනි පැමිණිල්ලක් ලැබී මාස හයක් ඇතුලත් සිදුකල යුත්තේය. නීතිඥ නියාමන කොමිෂන් සභාව විසින් පත්වන පරීක්ෂණ නියාමන කොමිසමේ සාමාජිකයන් තිදෙනා හමුවේ පැවැත්වෙන අතර නියාමන කොමිසමේ අවසාන තීන්දු ප්‍රකාශය මහජනයාගේ දැනගැනීම සඳහා නියාමන කොමිසමේ වෙබ් අඩවියේ පලකල යුත්තේය.

(6) නීතිඥ නියාමන කොමිෂන් සභාවේ ලේකම්වරයෙකු සහ කාර්ය මණ්ඩලයක් වන අතර ඔවුන් නීතිඥ නියාමන කොමිෂන් සභාව විසින් පත්කළ යුතු වන්නේය. ඔවුන්ගේ වැටුප් හා දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයන් සඳහා ගෙවන වැටුප් හා දීමනා පාර්ලිමේන්තුව විසින් තීරණය කල යුතු අතර එම වැටුප් නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයින් ධුරය දරන කාලය තුල අව ප්‍රමාණය කල නොහැකි වන්නේය. එම වැටුප් හා දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

## <u>ශ්‍රේෂ්ඨාධිකරණය</u>

165. ව්‍යවස්ථාව ප්‍රකාර ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කෙරෙන සියලුම විනිසුරන් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අග්‍රාමාත්‍ය වරයා විසින් පත් කල යුත්තේය. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය ජනරජයේ ජනතාවගේ අධිකරණ බලය ආරක්ෂා කරන්නා වූ, බලගන්වන්නා වූ සහ තහවුරු කරන්නා වූ ඉහලම සහ අවසාන ලේඛනොපගත අධිකරණය වන්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන වගකීම හා අධිකරණ බලය පහත සඳහන් පරිදි වන්නේය.

(1) ජනතා පරමාධිපත්‍ය බලය නීතියේ ආධිපත්‍ය හා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන අදිකරණය හමුවේ අභියෝග කෙරෙන පනත් හා පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකූල භාවය විමසීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන පනත් හා පනත් කෙටුම්පත් අවලංගු කිරීම.

(3) විධායකය සහ ව්‍යවස්ථාදායකය විසින් බලතල බෙදීමේ සිද්ධාන්තය උල්ලංඝනය කිරීමට උත්සාහ කරන අවස්ථා වලදී ජනතාව විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන පෙත්සමක් මත හෝ අධිකරණයේ අභිමතය මත නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වලට පටහැනි වන්නා වූ එවැනි අවස්ථා හඳුනා ගැනීම හා එවැනි ප්‍රයත්නයන් ව්‍යාර්ථ කිරීම.

(4) ජනතාව ව්‍යවස්ථාදායකය විධායක හා අධිකරණය වෙත විශ්වාසය මත පවරා ඇති වගකීම නොපිරිහෙලා ඉටු කරන බවට වග බලා ගැනීම.

(5) ජනරජයේ ස්වෛරීත්වයට, රාජ්‍ය ආරක්ෂාවට හා අනාගත අභිවෘධියට හානිදායක වන ජාත්‍යන්තර සම්මුතීන් පරීක්ෂා කිරීම හා ව්‍යවස්ථාවේ අරමුණු වලට පටහැනි සම්මුතීන් අවලංගු කිරීම.

(6) ජනරජයේ අවසානාත්මක අභියාචන අධිකරණය ලෙස ක්‍රියා කිරීම.

(7) පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකරණයට අපහාස කිරීම සඳහා පාවිච්චි නොකරන බවට වගබලා ගැනීම.

(8) යම් කරුණක් හෝ පනත් කෙටුම්පතක් සම්බන්ධව අධිකරණයේ මතය විමසා සිටින අවස්ථාවකදී එය විමසීම හා අධිකරණයේ මතය කඩිනමින් ප්‍රකාශ කිරීම.

(9) උපදේශක අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.

(10) ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණ පද්ධතිය යුක්තිය පසිඳලීම කාර්යක්ෂමව විනිවිදභාවයකින් යුතුව, කඩිනමින් ඉටු කරන බවට වග බලා ගැනීම.

166. ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාර ධුරයක් හිස්ව පැවතීම ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ කටයුතුවලට බාධාවක් නොවන්නේය. එසේම විනිශ්චයකාර වරයෙකුගේ පත් වීමක් දෝෂ සහිත වුවද එය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුතු සඳහා බාධාවක් නොවන්නේය.

167. (1) පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුලත් කල පනත් කෙටුපතක් ඒ බව කථානායකවරයා විසින් ජනතාවගේ අවධානය සඳහා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කල දින සිට දින 21 ක් ඇතුලත එම පනත් කෙටුම්පත ජනරජයේ ඕනෑම පුරවැසියකුට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කල හැක්කේය. එවැනි අවස්ථාවකදී කථානායක වරයා වෙත අධිකරණයේ රෙජිස්ටාර් වරයා විසින් අදාළ පනත් කෙටුම්පත අධිකරණය හමුවේ අභියෝග කර ඇති බව විධිමත්ව දැනුම් දිය යුත්තේය. එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධ අධිකරණය විසින් තම මතය ප්‍රකාශ කරමින් කතානායක වරයාට දැනුම් දෙන තුරු එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධව කිසිදු පියවරක් නොගැනීමට කථානායකවරයා වගබලා ගත යුත්තේය.

අධිකරණය හමුවේ අභියෝග කරන ලද එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධ අධිකරණය දින 14 ක් ඇතුලත විභාග කොට අධිකරණයේ නිගමනය කථානායක වෙත අධිකරණයේ රෙජිස්ටාර්වරයා මගින් නොපමාව වාර්තා කල යුත්තේය. ඒ සමග පනත් කෙටුම්පතක් සම්බන්ධ අධිකරණයේ නිගමනය ජනතාවගේ අවධානය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙබ් අඩවියේ පලකල යුත්තේය.

(2) එවැනි පනත් කෙටුම්පතක් හෝ එහි යම් කොටසක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන බව අධිකරණයේ නිගමනය වූ කල එය පිළිගෙන ගරු කිරීමට කථානායකවරයා නීතියෙන් බැඳී සිටින්නේය. පනත් කෙටුම්පතක් සම්පූර්ණයෙන්ම ව්‍යවස්ථාවට අනනුකූල බව අධිකරණ විසින් තීරණය කල අවස්තාවක ඒ සම්බන්ධව තවදුරටත් ක්‍රියාකිරීම අත්හැර දැමීමටත්, පනත් කෙටුම්පතක යම් කොටසක් පමණක් ව්‍යවස්ථාවට අනනුකූල බව අධිකරණයේ නිගමනය වූ විට එම නිගමනය ගරු කිරීමට පාර්ලිමේන්තුව නීතියෙන් බැඳී සිටින්නේය. ව්‍යවස්ථාවට පටහැනි නොවන පනත් කෙටුම්පතක් න්‍යාය පත්‍රයට ඇතුල් කර කාරක සභා අවස්ථාවේ ව්‍යවස්ථාවට පටහැනි සංශෝධන ඉදිරිපත් කර රටේ නීතිය ලෙස සම්මත කිරීම සපුරා තහනම් වන්නේය.

168. 71 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට පටහැනිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක බලය නොමැති හෙයින් එවැනි අවස්ථාවක ජනතා පරමාධිපත්‍ය බලය ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාවේ 165 වන ව්‍යවස්ථාව ප්‍රකාර ක්‍රියාකිරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ වගකීම වන්නේය.

169 (1) ශ්‍රේෂ්ඨාධිකරණය ඊට පහලින් ඇති සියලුම අධිකරණ විසින් කරනු ලබන සිද්ධිය පිළිබඳව හා නීතිය පිළිබඳව වැරදි නිවැරදි කිරීම සඳහා ඇති අවසාන අභියාචන අධිකරණයයි.

(2) එවැනි අභියාචනයක් විභාග කිරීමෙන් අනතුරුව ඕනෑම අවස්ථාවක අලුතින් නඩු විභාග කිරීම ඇතුළු වෙනත් ඕනෑම ආඥාවක් නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේය.

(3) ඕනෑම නඩු තීන්දුවකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය කිසිම අවස්ථාවක නඩු තීන්දුවක් බලාත්මක වීමට අත්හිටුවීමට හේතුවක් නොවන්නේය. මරණ දණ්ඩනය පැනවීමේ තීන්දු ප්‍රකාශයකට එරෙහිව ඉදිරිපත් කෙරෙන අභියාචනයකට මෙය අදාල නොවන්නේය.

170. පහලින් ඇති අධිකරණයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයට තම අභිමතය අනුව එවැනි නඩු කටයුත්තක අභියාචනය පිළිගත හැක්කේය. එවැනි නඩු කටයුත්තක් පොදු හෝ ජාතික වැදගත් කමක් ඇති නඩු කටයුත්තක් වන අවස්ථාවක එවැනි අභියාචනයකට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර දිය යුත්තේය.

171. යම් කටයුත්තක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම යෝග්‍ය වන්නේ යයි අග්‍රාමාත්‍යවරයා විසින් සලකන අවස්ථාවක ඒ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසිය හැක්කේය. එවැනි කරුණක් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය සති දෙකක් ඇතුලත ප්‍රකාශයට පත්කළ යුත්තේය. එවැනි කරුණක් සම්බන්ධව අධිකරණයේ මතය ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙබ් අඩවියේද සමගාමීව පලකල යුත්තේය.

172. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම අභියෝග කරන ඕනෑම නඩු නිමිත්තක් සහ ජනමත විචාරණයක් අභියෝග කරන නඩු කටයුත්තක් යටත් පිරිසෙන් අග්‍ර විනිශ්චයකාර වරයා ඇතුළුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන් පස් දෙනෙකු විසින් විභාග කර තීන්දු ප්‍රකාශ කල යුත්තේය.

173. (1) ශ්‍රේෂ්ඨාධිකරණය සාමාන්‍යයෙන් කොළඹදී ක්‍රියාත්මක වන්නේය. සියලු අවස්ථාවල විනිසුරන් තිදෙනෙකු හමුවේ නඩු කටයුත්තක් පැවැත්විය යුතු අතර එකම කරුණක් සම්බන්ධ නඩු කිහිපයක් ඇති අවස්ථාවකදී එම නඩු එකම අවස්ථාවක විභාග කල හැක්කේය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ඒකමතික තීරණයක් නොවන විට සෑම විටම එය බහුතර තීරණය විය යුත්තේය.

(3) යම් නඩු කටයුත්තක් ජාතික වැදගත්කමක් ඇති නඩුකටයුත්තක් වන්නේ යයි අග්‍ර විනිශ්චයකාර වරයා තීරණය කරන ලද අවස්තාවක සහ එවැනි නඩු කටයුත්තක පාර්ශවකරුවකු තීරණය කරන ලද අවස්තාවක එවැනි නඩු කටයුත්තක් විභාග කිරීම සඳහා පස් දෙනෙකුගෙන් හෝ ඊට වැඩි විනිශ්චය මණ්ඩලයක් පත්කළ යුත්තේය.

174. යම් නඩු කටයුත්තක් විභාග කිරීමට අවශ්‍ය විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවක් නොමැති බව අග්‍රවිනිසුරුවරයාට පෙනී යන්නේ නම් ඒවා අග්‍රාමාත්‍යවරයාට දැනුම් දිය යුතු අතර එවැනි හදිසි අවස්ථාවක ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍යවරයාට අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට තාවකාලිකව පත් කල හැක්කේය. අභියාචනාධිකරණයෙන් පත්කරනු ලබන එවැනි විනිශ්චයකාරවරයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණය විනිශ්චයකාරවරයෙකුට ඇති අධිකරණ බලය සහ වරප්‍රසාද හිමි වන්නේය.

175. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ හෝ වෙනත් ඕනෑම අධිකරණයක පැවැත්වෙන නඩු කටයුත්තක් නඩුවක පාර්ශවකරුවකුට පෞද්ගලිකව හෝ නීතීඥයකු මගින් ඉදිරිපත් කල හැක්කේය. එසේ නඩුවක පාර්ශවකරුවකු නඩු කටයුත්තක් ඉදිරිපත් කරන අවස්ථාවක ඒ සඳහා සියලු පහසුකම් සහ සාධාරණ නඩු විභායක් පැවැත්වීම අග්‍රවිනිශ්චයකාරවරයාගේ වගකීම වන්නේය.

176. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා යනුවෙන් හඳුන්වනු ලබන නිලධාරියකු වන්නේය. ඔහු අග්‍රවිනිශ්චයකාරවරයාගේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේය.

177. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව අග්‍රවිනිශ්චයකාරවරයා සහ ඔහු විසින් නම් කරන විනිශ්චකාරවරුන් තිදෙනෙකු විසින් ;

(අ) ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හමුවේ නඩු පැවරීම, අභියාචන භාර ගැනීම, නඩු කටයුතු පවත්වාගෙනයාම හා විභාග කිරීම, නඩු කටයුතු පැවරීමේදී සහ පවත්වාගෙන යාමේදී පාර්ශවකරුවන් විසින් අනුගමනය කිරීමට බැඳී සිටින නිශ්චිත කාල සීමා හා අදාලවන කාර්ය පටිපාටිය සම්බන්ධ රීති

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හමුවේ පවරන නඩු කටයුත්තක් නිස්සාර පීඩාකාරී හෝ යුක්තිය පසිඳලීම ප්‍රමාද කිරීමේ චේතනාවෙන් පවරන ලද නඩු කටයුත්තක් බව පෙනී යන්නේ නම් එවැනි නඩු කටයුත්තක් ලඝු ලෙස තීරණය කිරීම පිළිබඳ රීති

(ඇ) ඇප දීම පිළිබඳ රීති

(ඈ) නඩු කටයුත්තක් අවසන් කිරීම සහ බහාලීම පිළිබඳ රීති

(ඉ) නීතිඥයන් පිළිගැනීම හා බඳවා ගැනීම පිළිබඳ රීති

(ඊ) පිස්කල් නිලධාරීන් සහ වෙනත් විධායක නිලධාරීන් සහ ඔවුන් වෙත පැවරෙන කාර්ය හා කර්තව්‍ය පිළිබඳ රීති

(උ) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු සහ නිගමන වල අනුගම්‍ය බලය

(ඌ) විනිශ්චයකාරවරුන්ගේ නීතිඥවරුන්ගේ සහ අධිකරණ නිලධාරීන්ගේ නිළ ඇඳුම්

(එ) ජූරි සභා සඳහා සභිකයන් කැඳවීම, තේරීම සහ සභිකයන් පිළිබඳ විරෝධය පෑමේ ක්‍රමවේදය

(ඒ) නඩු ගාස්තු වල ස්වභාවය, ප්‍රමාණය, එය තක්සේරු කිරීම, ලේඛන වල මුද්දර ගැසීම.

(ඔ) ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය සහ මුල් අවස්ථා අධිකරණවල පරිචය සහ කාර්ය පටිපාටිය සම්බන්ධ නීතියකින් හෝ නීතියක් යටතේ විධිවිධාන සලසා නොමැති වෙනත් සියලු කාරණා සම්බන්ධව රීති,

සම්පාදනය කළ හැක්කේය.

එම රීති සෑම වසර දෙකකටම වරක් සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සහිතව අලුතින් සම්පූර්ණයෙන් ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුත්තේය.

## අභියාචනාධිකරණය

178. අභියාචනාධිකරණයට පත් කරන සියලුම විනිසුරන් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ වලට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කළ යුත්තේය.

179. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (3) වන ව්‍යවස්ථාව ප්‍රකාර, ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගේ විධායක බලය විශ්වාසය මත ව්‍යවස්ථාවේ (4) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාත්මක කරන ඕනෑම පුද්ගලයෙක් හෝ ආයතනයක් එම බලය අවභාවිත කරන්නේ දැයි පරීක්ෂා කිරීම.

(2) ව්‍යවස්ථාවේ (5) වන ව්‍යවස්ථාව ප්‍රකාර ජනතාවගේ අධිකරණ බලය නීති ප්‍රකාරව, ස්වාධීනව ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ඕනෑම මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරියක් හෝ වෙනත් ආයතනයක් එම බලය අවභාවිත කරන්නේ දැයි පරීක්ෂා කිරීම.

(3) එම ආයතන විසින් පවත්වාගෙන යන වාර්තා ගෙන්වා පරීක්ෂා කිරීම.

(4) සහ නීතියේ ආධිපත්‍ය ගරු කිරීම සහතික කිරීම සඳහා නීතිය අනුව සර්ටියෝරාරි තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩාමූස් සහ ක්වො වොරොන්ටෝ යන කවර ස්වභාවයේ හෝ ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය අභියාචනාධිකරණය සතු වන්නේය.

180. (1) නීතියෙන් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇති විට මහාධිකරණයේ නඩු කටයුත්තක් සම්බන්ධව හෝ වෙනත් ඕනෑම මුල් අවස්ථා අධිකරණ බලය ක්‍රියාත්මකත්මක කරන අධිකරණයක්, විනිශ්චය අධිකාරියක් හෝ පරිපාලන අධිකාරියක් විසින් සිදුකරන ලද නීතිය පිළිබඳ ව හෝ සිද්ධිය පිළිබඳ වරදක් නිවැරදි කිරීමේ අභියාචන අධිකරණ බලය අභියාචනාධිකරණය සතු වන්නේය.

(2) එකී අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් හෝ පරිපාලන අධිකාරියක් විසින් යුක්තිය පසිඳලන නඩු කටයුත්තක් සම්බන්ධ අභියාචන අයදුම්පතක් විභාග කිරීමේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත් ව, අභියාචනාධිකරණය වෙත පැවරෙන්නේ ය. එසේ වුවද එවැනි අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් හෝ පරිපාලන අධිකාරියක් විසින් පසිඳලන නඩු කටයුත්තක දී එහි පාර්ශවකරුවන්ට නඩු විභාගයකදී සිදුවී ඇති අවිධිමත් බව හෝ දෝෂයක් නිසා ඔවුන්ගේ අයිතිවාසිකම් වලට හානියක් හෝ අගතියක් සිදු වී නොමැති අවස්ථාවක එවැනි තීන්දුවක් හෝ නියෝගයක් අභියාචනාධිකරණය විසින් වෙනස් නොකළ යුත්තේ ය.

(3) එසේම නීතියෙන් කලින් කළ අභියාචනාධිකරණය වෙත පවරනු ලබන අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුත්තේය.

181. (1) අභියාචනාධිකරණය ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී මහාධිකරණයේ නඩු කටයුත්තක් සම්බන්ධව හෝ වෙනත් ඕනෑම මුල් අවස්ථා අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විනිශ්චය අධිකාරියක් හෝ පරිපාලන අධිකාරියක් විසින් නිකුත් කරන ආඥාවක් තීන්දුවක් දණ්ඩන නියමයක් හෝ වෙනත් ඕනෑම නියෝගයක් ස්ථිර කිරීම, අවලංගු කිරීම, නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අභියාචනාධිකරණය සුදුසු යැයි සලකන ආඥාවක් නිකුත් කළ හැක්කේය.

(2) සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධව අභියාචනයක දී යුක්තිය පසිඳලීම සඳහා අලුතින් සාක්ෂි කැඳවිය යුතුය යන්න අභියාචනාධිකරණයේ මතය වන අවස්ථාවක දී අලුතින් සාක්ෂි කැඳවීමට අභියාචනාධිකරණයට බලය ඇත්තේය.

182. (1) යුක්තිය පසිඳලීම සඳහා යම් බන්ධනාගාරයක රඳවා තබා ඇති සිරකරුවකු නීතියෙන් නියම කර ඇති පරිදි යම් යුද්ධාධිකරණයක් හමුවේ විභාග වෙමින් පවත්නා යම් පරීක්ෂණයක් හමුවේ සාක්ෂි විමසීම සඳහා ඉදිරිපත් කිරීම යෝග්‍ය වන්නේ යයි අභියාචනාධිකරණයේ මතය වන්නේ නම් පමණක් සිරකරුවකු එවැනි පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කිරීම සඳහා අභියාචනාධිකරණය ට සුදුසු ආඥාවක් නිකුත් කළ හැක්කේය.

(2) එවැනි පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කරන සිර සිරකරුවෙකු වෙනත් බන්ධනාගාරයක භාරයට පත් කිරීම සුදුසු වන්නේ යයි අධිකරණයේ මතය වන්නේ නම් පමණක් ඒ සඳහා සුදුසු ආඥාවක් අභියාචනාධිකරණය විසින් නිකුත් කළ හැක්කේය.

183. යම් මුල් අවස්ථා අධිකරණයක නඩු කටයුත්තක් පැවරීමෙන් වැළැක්විය නොහැකි අනර්ථයක් හෝ හානියක් වැළැක්වීම සඳහා අභියාචනාධිකරණයට ඉන්ජන්ෂන් තහනම් ආඥාවක් නිකුත් කිරීමේ අධිකරණ බලය ඇත්තේ ය. එසේ වුවද අභියාචනාධිකරණයේ හෝ වෙනත් අධිකරණයක නඩු කටයුත්තක් වැළැක්වීම සඳහා ඉන්ජන්ෂන් තහනම් ආඥාවක් නිකුත් කළ නොහැක්කේය යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් අධිකරණ දෙකක වෙන් වෙන් වශයෙන් නඩු දෙකක් පවරා ඇති අවස්ථාවක එයින් එක් නඩුවක් වැළැක්වීම සඳහා අභියාචනාධිකරණයට ඉන්ජන්ෂන් තහනම් ආඥාවක් නිකුත් කළ හැක්කේය.

184. (1) යම් පුද්ගලයකු අස්ථානගත වී ඇති බව වාර්තා වන විට හෝ යම් පුද්ගලයකු එසේ අස්ථානගත වූයේ කෙසේදැයි අනාවරණය නොවන විට හෝ අත්අඩංගුවේ පසුවන හෝ රඳවා ගෙන සිටින පුද්ගලයකු අධිකරණය හමුවට ඉදිරිපත්

කරන ලෙස හෙබියස් කෝපුස් ආඥාවක් අභියාචනාධිකරණයට නිකුත් කළ හැක්කේය.

(2) එසේ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තැනැත්තෙකු වහාම නිදහස් කරන ලෙස හෝ බන්ධනාගාර ගත කරන ලෙස හෝ නීති ප්‍රකාර අන්‍යාකාරයෙන් ක්‍රියාකරන ලෙස හෝ නියම කළ හැක්කේය.

(3) අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයකු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට අධිකරණය විසින් නියෝග කළ අයෙකු එම තැනැත්තා ඉදිරිපත් කිරීමට අසමත් වන අවස්ථාවකදී අධිකරණය සුදුසු යයි සලකන වන්දි ප්‍රදානයක් එම පුද්ගලයාට එරෙහිව ඔහුගේ පෞද්ගලික ධනයෙන් ගෙවීමට හෝ රජයෙන් ගෙවීමට හෝ දෙපාර්ශ්වයෙන්ම ගෙවීමේ නියෝගයක් නිකුත් කිරීමේ අධිකරණ බලය අභියාචනාධිකරණය සතු වන්නේය.

(4) බාලවයස්කාර ළමයින්ගේ භාරය පිළිබඳ ගැටළුවකදී අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර එවැනි ළමයකුගේ භාරය සම්බන්ධව සුදුසු පරිදි ආඥාවක් අභියාචනාධිකරණය විසින් නිකුත් කළ යුත්තේය.

185. පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ ඡන්ද පෙත්සම් සත්කාරයේ පවත්නා නීතියට අනුව විභාග කිරීමේ අධිකරණ බලය අභියාචනාධිකරණය වෙත පැවරෙන්නේ ය. එවැනි නඩු කටයුත්තක් පැවරුම් දින සිට දින 14 ක් ඇතුලත විභාග කොට තීන්දු ප්‍රකාශ කළ යුත්තේය.

186. අභියාචනාධිකරණය විසින් ම ගන්නා තීරණයක් මත හෝ නඩු කට කටයුත්තක පාර්ශ්වකරුවකු විසින් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක නඩු

වාර්තා ගෙන්වා පරික්ෂා කිරීමේ අධිකරණ බලය අභියාචනාධිකරණය වෙත පැවරෙන්නේය.

187\. (1) අභියාචනාධිකරණය ස්වකීය අධිකරණ බලය කොළඹ දී හෝ විශේෂ නඩු කටයුත්තක් විභාග කිරීම සඳහා අග්‍රවිනිශ්චයකාරවරයාගේ අභිමතය පරිදි වෙනත් අධිකරණ කලාපයක ක්‍රියාත්මක කළ හැක්කේය.

(2) අභියාචනාධිකරණය නඩු කටයුතු විනිශ්චකාරවරුන් දෙදෙනකු විසින් පසඳලිය යුතු වන්නේය. විශේෂ මහාධිකරණයක් විසින් විභාග කර තීන්දු ප්‍රකාශ කර නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ අභියාචනයක් සම්බන්ධයෙන් වූ අග්‍ර විනිශ්චකාරවරයා ගේ නිර්දේශය මත ත්‍රිපුද්ගල විනිශ්චය සභාවක් විසින් එය විභාග කළ යුත්තේ ය.

(3) අභියාචනාධිකරණ සභාපතිවරයා එහි යම් නඩු කටයුතු විභාග කිරීම් තනි විනිශ්චකාර විනිශ්චකාරවරයෙකු විසින් සිදුකළ යුතුයැයි තීරණය කරන්නේ නම් ඒ සඳහා තනි විනිශ්චයකාරවරයකු ගෙන් සමන්විත අධිකරණයක් පත් කළ හැක්කේය.

(4) අභියාචනාධිකරණ නඩු කටයුත්තක තීන්දුව ඒකමතික තීන්දුවක් නොවන අවස්ථාවක එය බහුතර තීන්දුවක් විය යුත්තේය.

188\. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයෙක් සහ රෙජිස්ට්‍රාර් කාර්යාලයක් වන්නේය. අභියාචනාධිකරණය සභාපතිවරයාගේ අධීක්ෂණය හා විධානය සහ පාලනය යටතේ එහි රෙජිස්ට්‍රාර්වරයා ක්‍රියා කළ යුතු වන්නේය.

## IX වන පරිච්ඡේදය

## රාජ්‍ය මූල්‍ය

189. රාජ්‍ය මූල්‍ය සම්බන්ධ සම්පූර්ණ බලය හා අධිකාරිය පාර්ලිමේන්තුව සතු වන්නේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යම් නීතියක් යටතේ මිස් යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරියක් විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් කිසිම බද්දක්, වරිපනම් බද්දක් හෝ වෙනත් බදු විශේෂයක් පැනවිය නොහැක්කේය. රාජ්‍ය ආදායම කිසිම විෂමතාවයකින් තොරව සෑම පළාතකටම ජන අනුපාතය අනුව ඒ ඒ පළාතේ අභිවෘද්ධිය සඳහා බෙදී යා යුත්තේ ය.

190. (1) විශේෂ කාර්යයක් සඳහා නීතියෙන් වෙන් නොකරනු ලැබුවා වූ රජය සතු සියලුම අරමුදල් රජයේ ඒකාබද්ධ අරමු දලට බැර කළ යුත්තේය. සියලුම අයබදු, තීරුබදු, වරිපනම් ගාස්තු වලින් ලැබෙන සියලුම ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුත්තේය.

(2). රාජ්‍ය ණය පොලිය, නිදන් අරමුදලට කරන ගෙවීම්ද, ඒකාබද්ධ අරමුදලට එකතු කිරීම, පාලනය කිරීම සඳහා වන පිරිවැය, ගාස්තු සහ වියදම් ද, පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වෙනත් වියදම් ද, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුත්තේය.

191. (1) ඒකාබද්ධ අරමුදලෙන් කිසිම මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අත්සනින් යුත් බලපත්‍රයක අධිකාරිය අනුව මිස ඉවත් කරගත නොහැක්කේ ය.

(2) ඒකාබද්ධ අරමුදලෙන් කිසියම් මුදලක් ඉවත් කරගැනීමේ දී ඒ මුදල් ඉවත් කරගන්නා මුදල් වර්ෂය

තුළදීම රජයේ නියමිත සේවාවක් සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතියකින් හෝ වෙනත් නීතියකින් එවැනි මුදලක් වෙන්කොට දී ඇත්නම් මිස එසේ නැතහොත් එවැනි ගෙවීමක් ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබූ ලැබීම නීතියෙන් අනුමත කර ඇත්නම් මිස මුදල් අමාත්‍යවරයා විසින් ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කරගැනීම සඳහා කිසිදු බලපත්‍රයක් නිකුත් නොකළ යුත්තේ ය.

(3) කිසියම් වර්ෂයක විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට පත්වීමට පෙර අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාර ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසිරුවා හරිනු ලැබූ අවස්ථාවක, රජයේ සේවාවන් සඳහා පාර්ලිමේන්තුව විසින් මුදල් ප්‍රතිපාදන සලසා නැත්තේ නම් අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියමිත දින සිට මාස තුනක් ඉකුත් වන තෙක් රජයේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

(4) පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා දින නියම කරන අවස්ථාවක, පාර්ලිමේන්තුව විසින් මැතිවරණය සඳහා ප්‍රතිපාදන සලසා නැතිනම් ඒ සඳහා අරමුදල් මැතිවරණ කොමිසම විමසා ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමට අග්‍රාමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

192. (1) අනපේක්ෂිත හදිසි වියදම් දැරීම සඳහා මුදල් සැපයීම සඳහා අවිනිශ්චිත අවස්ථා අරමුදලක් පිහිටුවීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේය.

(2) එවැනි අනපේක්ෂිත වියදමක් දැරීම සඳහා ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවක අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රකාශිත අවසරය ඇතිව අවිනිශ්චිත අවස්ථා අරමුදලෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමට මුදල් අමාත්‍යවරයාට බලය ඇත්තේය.

(3) අත්තිකාරම් වශයෙන් එවැනි මුදලක් ගෙවන ලද අවස්ථාවකදී ඉන් සති දෙකක් ඇතුළත ඒ මුදල් ආපසු අවිනිශ්චිත අවස්ථා අරමුදලට බැර කිරීම සඳහා නොපමාව පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුත්තේය.

**<u>ජාතික විගණන සේවා කොමිසම් සභාව</u>**

193. (1) ජාතික විගනන සේවා කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වන කොමිෂන් සභාවක් වන්නේය. එහි සභාපතිවරයා විගණකාධිපතිවරයා වන්නේය. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් හතර දෙනාගෙන් සහ විගණකාධිපතිවරයාගෙන් විගණක සභාව සමන්විත වන්නේය.

(අ) නියෝජ්‍ය විගණකාධිපති හෝ ඉහළ ශ්‍රේණියක් උසුලන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙක්

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙක්

(2). (අ) කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තෙකු

(i) අග්‍රාමාත්‍යවරයා අමතා යවන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වුවහොත්

(ii) 117 වන ව්‍යවස්ථාව ප්‍රකාර ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත්

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වුවහොත් මිස අවුරුදු 3ක් ධූරය දරන්නේ ය. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කරනු ලැබූ අයකුට ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත ධූරයට නැවත පත්කිරීමට සුදුසුකම් ඇත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ එහි සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පරිශ්‍රයක් ගෙවිය යුත්තේ ය. එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර කොමිසමේ සාමාජිකයකුගේ ධූර කාලය තුළදී එය අඩු නොකළ යුත්තේ ය.

(4) කොමිසමේ සාමාජිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ ix පරිච්ඡේදය අනුව රජයේ සේවකයින් ලෙස සැලකෙන්නේ ය.

(5) කොමිෂන් සභාවට කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු වන්නේය.

194. (1) කොමිෂන් සභාවේ රැස්වීමට ගණපූර්ණය සාමාජිකයින් තිදෙනෙකු වන්නේය.

(2) පාර්ලිමේන්තුව විසින් ශ්‍රී ලංකා විගණන සේවයක් ස්ථාපිත කිරීම සඳහා ද ඊට අනුශාංගික වූ වෙනත්

කාරණා සඳහා ද අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසිය යුත්තේය.

195. (1) නීතිය මගින් පැවරෙන වෙනත් බලතල වලට අමතරව ශ්‍රී ලංකා විගණක සේවයට අයත් සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීමේ බලය සම්බන්ධ රීති සම්පාදනය කිරීම සහ එම රීති බලගැන්වීම සහ විගණක සේවයේ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ බලය විගණන කොමිෂන් සභාව සතු වන්නේය.

(2) විගණන කොමිෂන් සභාව විසින් සාදන රීති ගැසට් පත්‍රයේ පලකළ යුතු වන්නේය. එකී රීති එසේ ප්‍රසිද්ධ කළ දින සිට හෝ එම රීති මගින් නිශ්චිතව දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන්නේය.

(3) එම රීති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ දින සිට මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුත්තේය. පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද රීති එසේ අනුමත නොකරන ලද දිනයේ සිට අවලංගු වන්නේ ය. එසේ වුවද ඒ දක්වා ඒ රීති ක්‍රියාත්මක කරමින් ගන්නා ලද කිසිම පියවරකට එයින් අගතියක් හෝ හානියක් නොවන්නේ ය.

196. විගණන කොමිෂන් සභාව කටයුතු වලට මැදිහත් වීම, බලපෑමක් කිරීම, බලපෑමක් කිරීමට තැත් කිරීම වරදක් වන්නේය, එවැනි වරදකට වරදකරු වන අයකු රුපියල් දස ලක්ෂයක දඩයකට හෝ වසර තුනකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම හෝ එම දඬුවම් දෙකටම යටත් වන්නේය.

197. එවැනි වරදක් සම්බන්ධව විභාග කොට මාස 03 ක් ඇතුලත තීන්දු ප්‍රකාශ කිරීමේ අධිකරණ බලය මහාධිකරණය සතු වන්නේය.

198. මෙම පරිච්ඡේදය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II සහ III පරිච්ඡේද මගින් පිළිගෙන ඇති අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව විභාග කර තීන්දු ප්‍රකාශ කිරීමට ත්‍රිපුද්ගල මහාධිකරණය වෙත අධිකරණ බලය ඇත්තේ ය.

199. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. විගණක කොමිසමේ සාමාජිකයන් හා නිලධාරීන් සම්බන්ධව තම කාර්ය හා කර්තව්‍ය ඉටු කරමින් විගණක කොමිසම විසින් එළඹෙන තීරණවලින් අතෘප්තියට පත් පාර්ශවයට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය හමුවේ එය අභියෝග කළ හැක්කේය. ඒ අභියාචන සම්බන්ධව සුදුසු පරිදි විභාග කොට සුදුසු පරිදි බැහැර කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

200. කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්ය ඉටුකිරීම සම්බන්ධව පාර්ලිමේන්තු ස්ථාවර නියෝග වලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ශයක් අවසාන වී මාස තුනක් ඇතුළත කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳව කොමිසම පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේය.

## X වන පරිච්ඡේදය

## විගණකාධිපති

201. අග්‍රාමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ඇතිව පත් කරනු ලබන තම ධූරයේ කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීමට නීතියෙන් බැඳී සිටින වෘත්තීය සුදුසුකම් ලත් විගණකාධිපතිවරයකු වන්නේය.

202. (1) රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අධිකරණ සේවය, විගණකාධිපතිවරයාගේ අභිමතය පරිදි ඔහුගේ අධීක්ෂණයට හා විගණනයට යටත් වන්නේය.

(2) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධව පිළිගත හැකි, ස්වාධීන විගණනයක් කිරීමට නීතියෙන් බලය පවරා ඇති විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී එම කටයුතු කිසිදු බාධාවකින් හෝ මැදිහත්වීමකින් තොරව ඉටු කිරීමට විගණකාධිපතිට බලය ඇත්තේය.

(3) ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් රජයේ ටෙන්ඩර් සම්බන්ධව පනවා ඇති නියමයන් හා ප්‍රමිතීන් අනුගමනය කිරීමට සියලුම රාජ්‍ය ආයතන නීතියෙන් බැඳී සිටින අතර මූල්‍ය අගය රුපියල් මිලියන 10 ඉක්මවන ඕනෑම ටෙන්ඩරයක් විගණකාධිපතිගේ අධීක්ෂණයට යටත් වන්නේය. රජයේ අනුමැතිය ලබන සෑම ටෙන්ඩරයක් සඳහාම විගණකාධිපතිවරයා විසින් අනුමත කරන රක්ෂණ සමාගමකින් වසර 20ක කාලයක් සඳහා වලංගු වගකීමෙන් නිදහස් කිරීමේ රක්ෂණ අනාවරණයකට යටත් කිරීමේ අභිමතය විගණකාධිපති සතු වන්නේය.

(4) මූල්‍ය අගය රුපියල් මිලියන 10 ඉක්මවන සෑම රජයේ ව්‍යාපෘතියක්ම විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත් වන්නේය. මූල්‍ය අගය රුපියල් මිලියන 10 ඉක්මවන එවැනි ඕනෑම ව්‍යාපෘතියක් සඳහාම විගණකාධිපතිවරයා විසින් අනුමත කරන ජාත්‍යන්තර රක්ෂණ සමාගමකින් වසර 20 ක කාලයක් සඳහා වලංගු වන වගකීමෙන් නිදහස් කිරීමේ රක්ෂණ ආවරණයකට යටත් කිරීමේ අභිමතය විගණකාධිපති සතු වන්නේය.

(5). විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර එය රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. විගණකාධිපතිවරයාගේ ධූර කාලය තුළ ඔහුගේ වැටුප් කපා හැරිය නොහැක්කේ ය.

(6). විගණකාධිපති ධූරය,

(අ). විගණකාධිපතිවරයා මිය යාමෙන්

(ආ). ප්‍රකාශිතව ජනාධිපතිවරයා අමතා තනතුරින් ඉල්ලා අස්වීමේ දැන්වීමකින්

(ඇ). වයස අවුරුදු 65 සම්පූර්ණ වීමෙන්.

(ඈ). ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු නොකළ හැකි පරිදි මානසික හෝ ශාරීරික වශයෙන් නුසුදුසු තත්ත්වයට පත්ව ඇති බව පිළිගත් වෛද්‍ය වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් හිස් වන්නේය.

(ඉ). විගණකාධිපතිට තාවකාලිකව ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු නොකළ හැකි අවස්ථාවකදී ව්‍යවස්ථාදායක සභාවේ ලිඛිත අනුමැතිය ඇතිව

විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා අන් අයකු අග්‍රාමාත්‍යවරයා විසින් පත් කළ යුත්තේය.

203. ජනාධිපති අරමුදල ඇතුළුව රජයේ ඕනෑම අරමුදලක්, ගිණුමක්, භාරයක් විගණය කිරීමට ද අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් පවත්වාගෙන යන ගිණුම්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගිණුම්, ව්‍යවස්ථාදායක සභාවේ ගිණුම්, රජය විසින් ස්ථාපිත කරන ලද සියලුම කොමිෂන් සභාවල ගිණුම්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස්ගේ ගිණුම්, පාර්ලිමේන්තුවේ මහලේකම් වරයාගේ ගිණුම්, සියලුම රජයේ දෙපාර්තමේන්තු වල පළාත් පාලන ආයතන වල රජයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම්, අනෙකුත් රජයේ ව්‍යවස්ථාපිත ආයතනවල ගිණුම්, කොළඹ ආර්ථික කොමිෂන් සභාවේ ගිණුම්, රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනය 50% ඉක්මවන වෙනත් ඕනෑම ආයතනයක ගිණුම් සහ විගණනය කිරීමට විගණකාධිපතිට බලය ඇත්තේය.

204. ඉහත 203 ව්‍යවස්ථාවේ කෙසේ සඳහන් වුවද විගණකාධිපතිට නීතියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා විගණකාධිපති අවශ්‍ය යැයි තීරණය කරන අවස්ථාවල වෙනත් වරලත් විගණකවරුන්ගේ සහය ලබාගැනීමට විගණකාධිපතිට බලය ඇත්තේය. විගණකාධිපති විසින් විධිමත්ව බලය පවරන ලද එවැනි විගණකවරුන්ගේ කටයුතු විගණකාධිපතිගේ සෘජු අධීක්ෂණයට යටත් විය යුත්තේය.

205. රජයේ විගණන කටයුතු ඉටු කිරීම සඳහා වෙනත් ඕනෑම නීතියකින් විගණකාධිපතිට බලය පවරා ඇති අවස්ථාවක විගණකාධිපති එම නීතිය ප්‍රකාර ක්‍රියා කළ යුත්තේය.

206. විගණන කටයුතු විධිමත්ව ඉටුකිරීම සඳහා විගණකාධිපතිට වෙනත් තාක්ෂණික සහය ලබාගැනීම අවශ්‍ය වන්නේ යැයි තීරණය කළ අවස්ථාවක

(අ). විගණකාධිපතිගේ විගණනයට භාජනය වූ ආයතනයේ සේවය නොකරන

(ආ). විගණකාධිපතිගේ විගණනයට භාජනය වූ ආයතනය හා යම් ආකාරයකින් සම්බන්ධතාවයක් නොමැති ආයතනයකින් අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගත හැක්කේ ය.

207. විගණන කටයුතු සඳහා විගණකාධිපතිට හෝ ඔහුගේ බලය ලත් අයකුට පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීමේදී

(අ). විගණනය සඳහා අවශ්‍ය කරන සියලුම ලේඛන ලබාගෙන පරීක්ෂා කිරීමට සහ ඕනෑම ගුදමකට හෝ වෙනත් දේපළකට ප්‍රවේශවීමට බලය ඇත්තේ ය.

(ආ). විගණකාධිපති ඉල්ලා සිටින සහාය සහ පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවලදී එම සහාය සහ පැහැදිලි කිරීම් නොපමාව ලබාදීමට විගණනයට යටත්වන ආයතනයක සෑම අයෙකුම නීතියෙන් වගකීමට බැඳී සිටින්නේ ය.

විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී ඊට බාධා පැමිණවීම, අවහිර කිරීම හෝ අවශ්‍ය සහයෝගය නොදැක්වීම වසර දෙකක සිර දඬුවමට යටත් වන ඇප දිය නොහැකි වරදක් වන්නේය. එවැනි වරදක් කරන ඕනෑම අයකු අත්අඩංගුවට ගැනීමට සහ මහේස්ත්‍රාත්වරයකු හමුවට පැමිණවීමට විගණකාධිපතිවරයාට බලය පැවරෙන්නේ ය.

එවැනි සැකකරුවකු විශේෂ අවස්ථානුගත හේතු මත පමණක් ඇප මත නිදහස් කිරීමට මහාධිකරණයට අධිකරණ බලය ඇත්තේ ය.

208. ගිණුම් වර්ෂය ඉකුත් වී මාස (10) ක් ඇතුළත විගණකාධිපති විසින් රාජ්‍ය මූල්‍ය පිළිබඳ බලධරයා වන පාර්ලිමේන්තුව වෙත තම ධුරයේ කාර්ය හා කර්තව්‍ය හා වගකීම විධිමත්ව ඉටුකිරීම පිළිබඳ වාර්තා කළ යුතු වන්නේය. ඒ සමගම විගණකාධිපතිවරයා නිකුත් කරන සියලුම විගණන වාර්තා ජනතාවගේ අවධානය සඳහා නොපමාව විගණකාධිපතිගේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කළ යුත්තේය.

209. විගණකාධිපති වරලත් විගණකවරුන්ගේ සහය ලබාගන්නා ලද අවස්ථාවක එම ආයතනය හෝ වරලත් විගණකවරයා නීති ප්‍රකාර විගණකාධිපතිවරයා වෙත නියමිත පරිදි තමන් විසින් විගණනය කරන ලද ආයතනය පිළිබඳ විගණන වාර්තාව භාරදිය යුත්තේ ය.

210. මෙම පරිච්ඡේදයේ වරලත් විගණකවරයකු යන අර්ථ නිරූපණයට වරලත් ගණකාධිකාරී ආයතනය හෝ වෙනත් වරලත් ගණකාධිකාරී ආයතනයකින් විගණකවරයකු වශයෙන් ක්‍රියා කිරීමට නීතියෙන් බලය ලත් අයෙකු ද එවැනි වරලත් විගණක ආයතනයක සේවය කරන බලයලත් විගණකවරයකු ද ඇතුළත් වන්නේය.

## XI වන පරිච්ඡේදය

## මහජන ආරක්ෂාව

211. ජනතාව විසින් සම්මත කළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව බලගැන්වීමට පෙර ක්‍රියාත්මක වූ මහජන ආරක්ෂක ආඥා පනත පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් ලෙස මෙහි දැක්වෙන සීමාවලට යටත්ව තවදුරටත් ක්‍රියාත්මක වන්නේය.

(2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ඕනෑම නීතියක් යටපත් කිරීමේ, අත්හිටුවීමේ බලය මහජන ආරක්ෂක ආඥා පනත යටතේ හෝ ඒ යටතේ හදිසි අවස්ථා නියෝග පැනවීමේ බලයට ඇතුළත් වන අතර එම බලය ක්‍රියාත්මක කිරීම අග්‍රාමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේය. අග්‍රාමාත්‍යවරයා විසින් නිකුත් කරන ප්‍රකාශනයක් මගින් එම බලය ක්‍රියාත්මක කරනු ලැබූ අවස්ථාවක හැර මහජන ආරක්ෂක ආඥා පනත බලාත්මක නොවන්නේය.

(3). එවැනි ප්‍රකාශනයක් අග්‍රාමාත්‍යවරයා විසින් නිකුත් කළ වහාම මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ඒ බව අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව දැනුවත් කළ යුත්තේය ය. එවැනි අවස්ථාවක,

(අ) පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇත්නම් ප්‍රකාශනය ක්‍රියාත්මක වන දිනයේ සිට දින තුනක් ඇතුළත පාර්ලිමේන්තුව රැස්විය යුත්තේය. එසේ කැඳවන හෝ රැස්වන පාර්ලිමේන්තුව එම ප්‍රකාශනය බලපැවැත්වෙන කාල සීමාව සඳහා හෝ පාර්ලිමේන්තු මැතිවරණය දක්වා බල පැවැත්වන්නේය.

(ආ) එවැනි ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත දී පාර්ලිමේන්තුව රැස්වීම කල් තැබීමක් නිසා හෝ වාර අවසාන කිරීමක් නිසා පාර්ලිමේන්තුව විසංයුක්තව තිබුණේ නම් එම ප්‍රකාශනයේ දින සිට දින දහයක් ඇතුළත පාර්ලිමේන්තුව රැස්වීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාර ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් නිකුත් කළ යුත්තේය.

(4) අග්‍රාමාත්‍යවරයා විසින් නිකුත් කරන ප්‍රකාශනයක් මගින් මහජන ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක මසක කාල සීමාවකට ප්‍රථම අග්‍රාමාත්‍යවරයා විසින් එම ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ප්‍රකාශනයක් නිකුත් නොකරන්නේ නම්, හදිසි අවස්ථාවක් පැනවීමේ ප්‍රකාශනයක් එක් මසක උපරිම කාල සීමාවකට පමණක් වලංගු වන්නේය.

(5). අග්‍රාමාත්‍යවරයා විසින් මහජන ආරක්ෂක ආඥා පනත යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක් මගින් යම් නීතියක්, විධිවිධානයක් හෝ රෙගුලාසියක් ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක එම ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් සම්මත නොකරන්නේ නම් එය නිකුත් කරන ලද දින සිට දින 14 ක් ඇතුලත බලරහිත වන්නේය.

එසේ වුවද,

(අ). එම ප්‍රකාශනය කරන ලද දිනයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබේ නම් හෝ

(ආ). මෙම ව්‍යවස්ථාවේ (3) (ආ) අනු අවස්ථාවේ 3 (අ) හෝ (ආ) අනු ව්‍යවස්ථා ප්‍රකාර පාර්ලිමේන්තුව කැඳවා ඇති අවස්ථාවක පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම් පාර්ලිමේන්තුව නැවත රැස්වී එම ප්‍රකාශනය අනුමත

නොකරන ලද්දේ නම් එය නිකුත්කළ දින සිට දින 10 අවසානයේ බලරහිත වන්නේය.

6. මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක්, විධිවිධානයක් හෝ රෙගුලාසියක් ක්‍රියාත්මක කරන ලද දින සිට දින 14 ක් ඇතුළත ඉහත 5 වන අනු ව්‍යවස්ථාව පරිදි බලරහිත වූ විට එසේ එම ප්‍රකාශනය බලරහිත වූ දින සිට එළඹෙන දින 30 ක් ඇතුළත නැවත එවැනි ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසින් යෝජනාවකින් සම්මත නොකරන ලද්දේ නම් එය බලාත්මක නොවන්නේය.

(7) මෙම ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව අනුව නිකුත් කරන ලද ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසින් සම්මත නොකරන ලද්දේ නම් වහාම ක්‍රියාත්මක වන පරිදි එම ප්‍රකාශනය සහ ඒ යටතේ පනවන ලද යම් නීතියක්, විධිවිධානයක් හෝ රෙගුලාසියක් බලරහිත වන්නේය. එම බල රහිත වීම එම අවස්ථාව දක්වා එම ප්‍රකාශනය යටතේ ක්‍රියාත්මක කරන ලද නීතියක් විධිවිධානයක් හෝ රෙගුලාසියක්යක් යටතේ ගන්නා ලද ක්‍රියාමාර්ග වලට හානියක් නොවන්නේ ය

(8) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාර ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් කැඳවන ලද පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම් හෝ ඉන් අනතුරුව රැස්වන පාර්ලිමේන්තුවේ අනුමැතිය එම ප්‍රකාශනය යටතේ ගන්නා ක්‍රියාත්මක කරන ලද යම් නීතියක් විධිවිධානයක් හෝ රෙගුලාසියක් ප්‍රතික්ෂේප කරන්නේ නම් එම අවස්ථාව දක්වා එම ප්‍රකාශනය යටතේ ගන්නා ලද පියවරට හානියක් නොවන පරිදි එම ප්‍රකාශනය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු වන්නේය.

## XII වන පරිච්ඡේදය

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

212\. (1) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීම සඳහා නීතියෙන් පිහිටුවන ලද කොමිෂන් සභාවේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි වන්නේය.

(අ). අග්‍රාමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියෙන් සාමාජිකයින් තිදෙනෙකු ගෙන් සමන්විත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පත් කළ යුත්තේය. කොමිසමේ සාමාජිකයින් වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් යෝජනා කරන පුද්ගලයන් විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, කීර්තිමත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන වයස අවුරුදු (50) ට නොවැඩි පුද්ගලයන් විය යුතු අතර ඔවුන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීම සඳහා කොමිසම වෙත පැවරෙන වගකීම කඩිනම්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමට සමත් අල්ලස් හා දූෂණ මැඩලීම සඳහා විශේෂ ප්‍රාගුණ්‍යය හා කැපවීමක් ඇති අය බවට ව්‍යවස්ථාදායක සභාව එම පුද්ගලයන්ගේ නම් අනුමත කිරීමට ප්‍රථම සෑහීමකට පත් විය යුත්තේය. ඒ සඳහා අවශ්‍ය සියලු තොරතුරු ව්‍යවස්ථාදායක සභාව වෙත ඉදිරිපත් කිරීම අග්‍රාමාත්‍යවරයාගේ වගකීම වන්නේය.

(ආ). අල්ලස් හෝ දූෂණ මැඩලීමේ වගකීම ක්‍රියාත්මක කිරීම සහ සැකකරුවන්ට එරෙහිව විමර්ශනය කටයුතු ආරම්භ කිරීම සහ ප්‍රමාණවත් සාක්ෂි ඇති සැකකරුවන්ට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කිරීම සහ කොමිසම වෙත පුරවැසියන් විසින් ඉදිරිපත් කෙරෙන අල්ලස් හා දූෂණ අපරාධ චෝදනා සම්බන්ධව පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම සහ නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇති සැකකරුවන්ට එරෙහිව ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ අධිචෝදනා ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ වගකීම වන්නේය.

(ඇ) කොමිෂන් සභාව වෙත නීතියෙන් පැවරී ඇති වගකීම පැහැර හරින්නේ නම්, ඕනෑම පුරවැසියෙකුට ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ අල්ලස් හෝ දූෂණ අපරාධ චෝදනා මත චූදිතයෙකුට එරෙහිව නඩු පැවරිය හැක්කේය.

(ඈ) අල්ලස් හා දූෂණ මැඩලීම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ඇති දූෂණ ප්‍රඥප්තිය පිළිගෙන නීතිගත කිරීම පාර්ලිමේන්තුවේ වගකීම වන්නේය. එම ප්‍රඥප්තිය රටේ නීතිය ලෙස පිළිගෙන සම්මත කරන තුරු එය අල්ලස් හා දූෂණ අපරාධ වැරදි මැඩලීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතිය වශයෙන් ක්‍රියාත්මක විය යුත්තේ ය. පාර්ලිමේන්තුව ඒ සඳහා නෛතික ප්‍රතිපාදන සම්මත කරන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා පනත අවශ්‍ය වෙනස් කිරීම්වලට යටත්ව, කොමිසම විසින් ක්‍රියාත්මක කළ යුත්තේය.

## XIII වන පරිච්ඡේදය

## ඡන්ද බලය සහ මැතිවරණය

213. ලියාපදිංචි සෑම දේශපාලන පක්ෂයක්ම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිගෙන ගරු කළ යුත්තේය. කිසිම දේශපාලන පක්ෂයක් ආගමක් හෝ ජන වර්ගයක් පදනම්ව හඳුන්වා නොගත යුත්තේය. එවැනි දේශපාලන පක්ෂ තම පක්ෂ ව්‍යවස්ථා සුදුසු පරිදි සංශෝධනය කර නොපමාව මැතිවරණ කොමිසම වෙත භාරදිය යුත්තේ ය. මැතිවරණ කොමිසම සෑහීමට පත්වන අයුරින් මෙම අවශ්‍යතාව ඉටු කිරීමට අසමත්වන දේශපාලන පක්ෂවල ලියාපදිංචිය ඒ සමඟම අවලංගු වන්නේය.

214. පාර්ලිමේන්තු මැතිවරණයට නාමයෝජනා ඉදිරිපත් කරන සෑම දේශපාලන පක්ෂයක්ම නාමයොජනා පත්‍ර වල නම සඳහන් නොවන කීර්තිමත්, විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, ඒ ඒ විෂය ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති (20) දෙනෙකුගෙන් සමන්විත, අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය, ඒ ඒ අමාත්‍යවරයාට පැවරෙන අමාත්‍යාංශයේ නම ඇතුළත්ව ජනතාවගේ අනුමැතිය සඳහා මැතිවරණ කොමිසම වෙත ඉදිරිපත් කළ යුත්තේය. එම ලේඛනයට අමාත්‍යාංශ වල නම් ප්‍රකාශිතව සඳහන් නොකළ මෙම ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම්ලත් අමතර නම් පහක් ද ඇතුළත් විය යුත්තේය. විසිපස් දෙනෙකුගෙන් සමන්විත එම ලේඛනය පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ නාම යෝජනා ප්‍රසිද්ධ කිරීමට සමගාමීව ඔවුන්ගේ සුදුසුකම් සහිතව මැතිවරණ කොමිසම විසින් ගැසට් පත්‍රයේ සහ මැතිවරණ කොමිසමේ වෙබ් අඩවියේ ජනතාවගේ දැන ගැනීම සඳහා

ප්‍රසිද්ධ කළ යුත්තේය. අමාත්‍ය මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් ඇතිවූ අවස්ථාවක අග්‍රාමාත්‍යවරයාගේ නිර්දේශ මත එම පුරප්පාඩුව පිරවීම සඳහා ජනතාව විසින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල නාම ලේඛණයේ සඳහන් අමතර නම් පහෙන් අයකු එම පුරප්පාඩුව සඳහා මැතිවරණ කොමිසම විසින් පත් කළ යුත්තේය.

(ආ) ඒ ඒ දේශපාලන පක්ෂය විසින් ව්‍යවස්ථාදායක සභාව ලෙස පත්කිරීම සඳහා ජනතාවට යෝජනා කරන 15 දෙනෙකුගෙන් සමන්විත විශිෂ්ටත්වයෙන් හා අචල අවංක භාවයෙන් යුත්, කීර්තිමත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන ලේඛනයක් ජනතාවගේ අනුමැතියට තම නාමයෝජනා පත්‍ර සමඟ මැතිවරණ කොමිසම වෙත ඉදිරිපත් කළ යුත්තේය. මැතිවරණයේ නාමයෝජනා ප්‍රසිද්ධ කිරීම හා සමගාමීව එම නාමලේඛනය ද ගැසට් පත්‍රය මගින් සහ මැතිවරණ කොමිසමේ වෙබ් අඩවියේ ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කළ යුත්තේය. මැතිවරණයෙන් පසුව රජයක් පිහිටුවන දේශපාලන පක්ෂය 10 දෙනෙකුගෙන් සමන්විත ව්‍යවස්ථාදායක සභාව 115 ව්‍යවස්ථාව ප්‍රකාර ජනතාව විසින් සම්මත කළ ලේඛනයේ නම් සඳහන් අනුපිළිවෙළට පත් කළ යුත්තේය.

(ඇ). සභාග රජයක් පිහිටුවන ලද අවස්ථාවක සභාග රජයක් පිහිටුවීමට එක්වන පක්ෂවල එකඟතාවයෙන් ඒ ඒ පක්ෂය විසින් ජනතාවගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ලේඛනයෙන් 20 දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලය පත් කළ යුත්තේය.

(ඈ). සභාග රජයක් පිහිටුවන අවස්ථාවකදී ව්‍යවස්ථාදායක සභාව පත් කිරීමේදී ඉහත (ඇ) ඡේදය අවශ්‍ය වෙනස් කිරීම් වලට යටත්ව අදාළ වන්නේය.

215. (අ) මැතිවරණ කොමිසම විසින් යම් මැතිවරණයක් සඳහා නාමයෝජනා කැඳ වූ අවස්ථාවක ඒ ඒ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් මැතිවරණය සඳහා ඉදිරිපත් කරන නාම යෝජනා වලින් 1/3 ක් කාන්තා නියෝජනය සඳහා වෙන් කල යුතු වන්නේය. ඒ සමගම මැතිවරණය සඳහා යෝජිත අයවැය ලේඛනයක් ඒ ඒ පක්ෂයේ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් සහතික කර මැතිවරණ කොමිසම වෙත භාරදිය යුතු වන්නේ ය. මැතිවරණ කොමිසම මැතිවරණය සඳහා නාමයෝජනා ප්‍රසිද්ධ කිරීමත් සමඟ ඒ ඒ පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය ද ජනතාවගේ දැන ගැනීම සඳහා මැතිවරණ කොමිසමේ වෙබ් අඩවියේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුත්තේය.

(ආ) මැතිවරණ කොමිසම විසින් පවත්වන ඕනෑම මැතිවරණයක් සඳහා නාමයෝජනා ඉදිරිපත් කරන අපේක්ෂකයින් නීතී ප්‍රකාරව තම වත්කම් හා බැරකම් පිළිබඳව සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් මැතිවරණ කොමිසම වෙත භාර දීම අනිවාර්ය වන්නේය. අපේක්ෂකයින්ගේ නාම යෝජනා ප්‍රසිද්ධ කිරීම හා සමගාමීව අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ වත්කම් හා බැරකම් පිළිබඳව මැතිවරණ කොමිසම වෙත ඉදිරිපත් ලද ප්‍රකාශ ජනතාවගේ අවධානය සඳහා මැතිවරණ කොමිසම විසින් කොමිසමේ වෙබ් අඩවියේ පලකළ යුතු වන්නේය.

(ඇ). අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ඕනෑම පුරවැසියෙකුට අධිකරණය හමුවේ අභියෝග කළ හැක්කේය. එවැනි නඩුකරයක් අභියාචනාධිකරණයේ පැවරිය යුතු අතර මාස 03 ක් ඇතුළත එවැනි නඩුවක් විභාග කොට තීන්දු ප්‍රකාශ කිරීමට අභියාචනාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේ ය. අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශය දොස් සහිත සාවද්‍ය ප්‍රකාශයක් බව අධිකරණය විසින් තීන්දු ප්‍රකාශ කළ අවස්ථාවක එවැනි අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය අහිමි වන්නේ ය. තවද එවැනි අපේක්ෂකයකු මන්ත්‍රී ධූරයකට පත් කරනු ලැබූ අවස්ථාවක ඔහුගේ මන්ත්‍රී ධූරය එවැනි තීන්දුවක් ප්‍රකාශයට පත් කිරීමත් සමගම නීතිය ක්‍රියාත්මක වීමෙන් අහෝසි වන්නේය.

(ඈ). මැතිවරණ කටයුතු සඳහා කිසිම දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් මුදලින් ආධාර ලබා ගැනීම තහනම් වන අතර මැතිවරණ කටයුතු සඳහා ලැබෙන සියලුම ආධාර පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ බැංකු ගිණුමට පමණක් බැර කළ යුතු වන්නේය. මැතිවරණයක් අවසන් වී මාස තුනක් ඇතුළත මැතිවරණයට තරග කළ සෑම දේශපාලන පක්ෂයක්ම සහ ස්වාධීන කණ්ඩායමක් විසින් ම වරලත් විගණකවරයකු විසින් විගනණය කර සහතික කරන ලද මැතිවරණ ගිණුම් වාර්තාවක්, ආදායම් හා වියදම් ඇතුළත් බැංකු ප්‍රකාශනයක් ඇතුළුව විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව මැතිවරණ කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම නෛතික විධිවිධාන නීති ප්‍රකාරව ඉටු කිරීමට යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් අසමත් වුවහොත් රුපියල් දස ලක්ෂයක දඩයකට සහ පක්ෂ තහනමකට ලක් වන්නේය. ඒ

දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ගිණුම් වාර්තා පරීක්ෂාකර විගණකාධිපතිවරයා විසින් එම ගිණුම් සම්බන්ධ ඔහුගේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව ජනතාවගේ අවධානය සඳහා තම වෙබ් අඩවිය මගින් මැතිවරණ අවසන් වී මාස 9 ක් ඇතුළත ප්‍රසිද්ධ කළ යුතු වන්නේ ය.

216. ඡන්ද හිමි නාම ලේඛණයේ ලියාපදිංචි විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන් සියළු දෙනා ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබන්නේ ය. ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය සහ ප්‍රකාශ කරන ලද ඡන්ද ගණනය කර ප්‍රතිඵල ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන මැතිවරණයේ ඡන්ද ප්‍රකාශ කිරීම අවසන් වූ වහාම ඒ ඒ විදේශ තානාපති කාර්යාල තුළදීම ගණන් කර ප්‍රතිඵල නිකුත් කිරීමටත් ඉන් අනතුරුව එම ප්‍රතිඵල ඡන්දය අවසන් ප්‍රතිඵල සමඟ ගණන් කිරීමට මැතිවරණ කොමිසම වෙත විද්‍යුත් මාධ්‍යයෙන් භාරදිය යුතු වන්නේය. එම ක්‍රමවේදය බලපැවැත්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සම්පාදනය කිරීම මැතිවරණ කොමිසමේ වගකීම වන්නේය.

217. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් ඇලවීම, කට් අවුට් භාවිතය සහ ප්‍රසිද්ධ ස්ථානවල මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පැවැත්වීම සපුරා තහනම් වන්නේය. එවැනි ක්‍රියාවක් කිරීම රුපියල් දස ලක්ෂයක දඩයකට සහ අවුරුද්දක සිරදඬුවමකට යටත් වන වරදක් වන්නේය. මැතිවරණයකට ඉදිරිපත් වන අපේක්ෂකයකුට සහයෝගය දක්වන පුරවැසියෙකුට තම දේපළ තුල පමණක් A3 ප්‍රමාණය නොඉක්මවන දැන්වීමක් ප්‍රදර්ශනය කළ හැක්කේය. මැතිවරණ කටයුතු සඳහා මගී ප්‍රවාහන සේවා යොදා ගැනීම රුපියල් දස ලක්ෂයක දඩයකට සහ අවුරුද්දක සිර දඬුවමකට යටත් වන වරදක් වන්නේය. මැතිවරණ ප්‍රචාරක කටයුතු

විද්‍යුත් සහ මුද්‍රිත ජනමාධ්‍යයන්ට පමණක් සීමා වන අතර සෑම අපේක්ෂකයෙකුටම සමාන අවස්ථාවක් ලැබෙන පරිදි මැතිවරණ ප්‍රචාරක කටයුතු නියාමනය කිරීම සහ නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමේ වගකීම මැතිවරණ කොමිසම වෙත පැවරෙන්නේය.

218. ජනරජය පරම අධිකාරිය වන ජනතාවට දෙන මැතිවරණ පොරොන්දු නීතිය හමුවේ බලාත්මක කළ හැකි නෛතික ගිවිසුම් වන්නේය. එම පොරොන්දු අපේක්ෂකයාගේ නම සහ අත්සන සහිතව මුද්‍රණය කිරීම අනිවාර්ය වන්නේය. ජනතාවට ව්‍යාජ පොරොන්දු දී ඉන් අනතුරුව එම පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් වන සහ ජනතාව වංචා කරමින් ඡන්දයෙන් බලයට පත්වන තැනැත්තන්ගේ ධූරය අහිමි වීමට අමතරව රුපියල් දස ලක්ෂයක දඩයකට හෝ වසර 3 ක සිර දඬුවමකට යටත් වන්නේය. මෙම ව්‍යවස්ථාවේ සහ ඉහත 215 සහ 217 ව්‍යවස්ථාවල සඳහන් වැරදි සම්බන්ධ අධිකරණ බලය ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය සතු වන අතර අධිකරණය හමුවේ පවරන ලද එවැනි නඩුවක් විභාග කිරීම සහ තීන්දු ප්‍රකාශ කිරීම නඩු පැවරූ දින සිට මාස 3 ක් තුල සිදුවිය යුත්තේ ය.

219. 1.) ද්විත්ව පුරවැසිභාවය සහිත පුරවැසියකු, අපරාධ නඩුවක චූදිතයකු හෝ අපරාධ වරදකට වරදකරු වූ තැනැත්තෙකු මැතිවරණයක් සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබන්නේය.

2.) ආරක්ෂක හමුදාවල, පොලීසියේ නිත්‍ය සේවයේ හෝ එම සේවාවල විශ්‍රාමික සේවකයින් මැතිවරණයක් සඳහා නාමයෝජනා දීමට සුදුසුකම් නොලබන්නේය.

220. ව්‍යවස්ථාවේ (68) ව්‍යවස්ථාව ප්‍රකාර තමන් හෝ තම 'පවුලේ සාමාජිකයෙකු' රජයේ ව්‍යාපාරයක් හා යම් ආකාරයක සම්බන්ධයක් ඇත්නම් ඔහු හෝ ඇය කිසිදු මැතිවරණයකට නාමය නාමයෝජනා දීමට නුසුදුසු වන අය වන්නේ අපේක්ෂකයාගේ සහ ඔහුගේ බිරිඳගේ/ස්වාමිපුරුෂයාගේ මව, පියා සහෝදර සහෝදරියන් ද, දූ දරුවන් ද ඔවුන්ගේ සහකරුවන් වන්නේය.

## **සීමා නිර්නය කිරීමේ කොමිෂන් සභාව**

221. (1) ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ වහාම මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කිරීම සඳහා දේශපාලන කටයුතුවල නිරත නොවූ විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, කීර්තිමත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාව ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කළ යුත්තේය. අග්‍රාමාත්‍යවරයා විසින් ඔවුන් අතුරින් එක් තැනැත්තෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කළ යුත්තේය.

(2). සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජිකයකු මියගියහොත් නැතිනම් ඉල්ලා අස් වුවහොත්, එසේත් නැතිනම් යම් සාමාජිකයකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කළ නොහැකි යැයි අග්‍රාමාත්‍යවරයා තීරණය කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ සුදුසුකම් වලට යටත්ව සහ සාමාජිකයන් පත්කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්

අග්‍රාමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කළ යුත්තේය.

222\. (1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව, ව්‍යවස්ථාවේ 1 වන උපලේඛනය ප්‍රකාර පරිපාලන දිස්ත්‍රික්ක 25 කට බෙදිය යුත්තේ ය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත පරිපාලන දිස්ත්‍රික්ක එකකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේ ය.

(3) පළාතක් පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවක්දී, හැකිතාක් දුරට ඒ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ එකකට හෝ ඊට වැඩි ගණනක් එකතු වන බවට වගබලා ගනු පිණිස, සීමා නිර්ණය සභාව විසින්, එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේ ය. එක්ව ගත්කල මන්ත්‍රීවරුන් 60 දෙනෙකු පත් කළ හැකි වන පරිදි නව මැතිවරණ කොට්ඨාශ වල නම් සහිතව සීමා නිර්ණය විය යුත්තේය.

(4) සීමා නිර්ණය කිරීමේ සභාවේ සාමාජිකයින් අතර මත භේදයක් ඇති වුවහොත් සාමාජිකයින් අතුරින් වැඩි දෙනාගේ මතය කොමිෂන් සභාවේ මතය සේ බලපැවැත්විය යුත්තේය. සීමා නිර්ණය කිරීමේ සභාවේ සාමාජිකයින් සියලු දෙනා එකිනෙකට වෙනස් මත දරන්නේ නම්, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මතය කොමිෂන් සභාවේ මතය වන්නේය. එම තීරණයට එකඟ නොවන සාමාජිකයින්ට එම තීරණය හා එකඟ නොවීමට හේතු දැක්විය හැක්කේය.

(5) සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද, ඒ තීරණය හා එකඟ නොවන සාමාජිකයකු වේ නම් ඔහුගේ මතය ද අග්‍රාමාත්‍යවරයා වෙත දැන්විය යුත්තේය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ දී තීරණයට අනුකූලව, මැතිවරණ කොට්ඨාශ වල නම් හා සීමාවන් ද, අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශනයක් මගින් ජනතාවට ප්‍රසිද්ධ කළ යුත්තේය. ඒ ප්‍රකාශනයේ නිශ්චය කොට දක්වා ඇති මැතිවරණ කොට්ඨාශ එම ප්‍රකාශනයෙන් ඉක්බිතිව එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී මන්ත්‍රීවරුන් පත් කිරීම සඳහා ක්‍රියාත්මක විය යුත්තේ ය. ඉන්පසු සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබූ මැතිවරණ කොට්ඨාශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණය හා සම්බන්ධව තත්කාලයේ පවත්නා කවර හෝ නීතියක ද සියලු කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාශ ලෙස බලපැවැත්වෙන්නේය.

223. මෙම ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ‘ඡන්ද හිමි නාම නාමලේඛනය’ යනුවෙන් යම්කිසි මැතිවරණයක් පවත්වනු ලබන්නේ තත්කාලයේ බල පවත්නා යම් ඡන්ද හිමි නාම ලේඛනයක් පදනම් කරගෙනද, එම ඡන්ද හිමි නාමලේඛනය අදහස් වන්නේය.

224. පාර්ලිමේන්තුව විසින්

(අ) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම,

(ආ) යම්කිසි මැතිවරණ කොට්ඨාශයක ඡන්ද හිමි නාමලේඛනයේ යම් තැනැත්තෙකුගේ නම ඇතුළත් කිරීම සඳහා, ඒ තැනැත්තා එම මැතිවරණ කොට්ඨාශයේ පදිංචි වී සිටීම පිළිබඳ සුදුසුකම ලැබීමේ දිනය සහ වයස අවුරුදු 18 සම්පූර්ණ වන දිනය තීරණය කිරීම,

(ඇ). ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම සහ සංශෝධනය කිරීම,

(ඈ). පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම කාර්ය පටිපාපටිපාටිය තීරණය කිරීම,

(ඊ). මැතිවරණ වැරදි හා දඬුවම් තීරණය කිරීම,

(උ). මැතිවරණයක් නිෂ්ප්‍රභා කිරීමට අදාළ හේතු සහ එවැනි අවස්ථාවක අලුතින් මැතිවරණයක් පැවැත්වීම,

(ඌ). මන්ත්‍රීධුරයක් සඳහා 73 වන ව්‍යවස්ථා ප්‍රකාරව හෝ වෙනත් හේතුන් මත යම් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක මැතිවරණයක් පැවැත්වීම,

(එ). මැතිවරණ ආරවුල් සම්බන්ධ තීරණය කිරීම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කරගැනීම පිළිබඳ අනුශාංගික කරුණු සම්බන්ධයෙන් නීතියෙන් විධිවිධාන සැළසිය යුත්තේය.

(2). එවැනි කාරණා සම්බන්ධව පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සලසන තුරු ලංකා පාර්ලිමේන්තු මැතිවරණ රාජ්‍ය සභා ආඥාව අවශ්‍ය වෙනස් කිරීම් වලට යටත්ව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් ව අදාළ වන්නේය.

225. රාජ්‍ය නිලධාරියකු හෝ රාජ්‍ය සංස්ථා සේවකයෙකු යම් මැතිවරණයක අපේක්ෂකයකු වන විට, ඔහුගේ නාමයෝජනා භාරගනු ලැබුවේ යම් දිනකද, ඒ දිනයේ සිට මැතිවරණය අවසන් වන තෙක් ඔහු නිවාඩු පිට සිටින්නේ යයි සැලකිය යුත්තේය. එම කාලය තුළ එවැනි නිලධාරියකු තම ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නොකළ යුත්තේය.

## මැතිවරණ කොමිෂන් සභාව

226. යම් වෘත්තියක හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍ර වල විශිෂ්ඨතාව හිමිකරගෙන සිටින තැනැත්තන්ගෙන් සමන්විත ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාවක් වන්නේය. එහි එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධූරයක් උසුලනු ලැබූ මැතිවරණ කොමිසමේ විශ්‍රාමලත් නිලධරයකු විය යුත්තේය. ඔවුන් අතුරෙන් එක් අයකු අග්‍රාමාත්‍යවරයා විසින් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේය.

(2). නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ මූලික වගකීම වන්නේය.

(3). යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු හෝ එවැනි තනතුරකට පත් කරනු ලැබුවේ නම් හෝ අධිකරණ නිලධාරියෙකු හෝ රජයේ වෙනත් නිලධාරියකු වශයෙන් පත් කරනු ලැබුවේ නම් හෝ කවර හෝ තත්ත්වයකින් රජයේ සේවයේ වෙනත් ධූරයක යෙදී සිටින්නේ නම් එවැනි කිසිම තැනැත්තෙකු මැතිවරණ කොමිසමේ සාමාජිකයෙකු වශයෙන් පත්කිරීම හෝ එහි සාමාජිකයෙකු ලෙස තවදුරටත් ක්‍රියා නොකළ යුත්තේ ය.

(4). කොමිෂන් සභාවේ සාමාජිකයකු, කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය නොමැතිව, කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත් එසේ නොපැමිණි තුන්වන රැස්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු ධූරය අත්හැර ගියා සේ සැලකෙන්නේ ය.

(5). කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ යම් නුසුදුසුකමකට පාත්‍ර වුවහොත් හෝ අගමැතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින් ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ව්‍යවස්ථාවෙ (4) වන අනු ව්‍යවස්ථාව යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ චෝදනා මත අධිකරණයක් විසින් වරදට වරදකරු කරනු ලැබුවහොත් හෝ 117 වන ව්‍යවස්ථාව ප්‍රකාර ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු පත් කරනු ලැබූ දින සිට වසර 5 ක් කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ධූරය දරන්නේ ය.

(6).අග්‍රාමාත්‍යවරයාගේ අභිමතය පරිදි කොමිෂන් සභාවේ සාමාජිකයකුට මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා තාවකාලික නිවාඩු දිය හැක්කේය.කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීමට සුදුසුකම් ඇති තැනැත්තෙකු එම නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු

වශයෙන් පත් කළ හැක්කේය. ඒ සෑම පත්කිරීමක්ම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත සිදුකල යුත්තේය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන යම් පරිශ්‍රමික ගෙවනු ලැබිය යුත්තේය. එම පරිශ්‍රමික රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ ධුර කාලය තුළ එම පරිශ්‍රමික අඩු නොකළ යුත්තේ ය.

(8). කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් තිදෙනෙකු වන අතර කොමිෂන් සභාවේ සභාපතිවරයා රැස්වීම් වල මුලසුන ගත යුත්තේය. කොමිෂන් සභාවේ තීරණ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේය.

227. (1) කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත නීතියෙන් පවරා දී ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේය. ජනමත විචාරණ සහ වෙනත් මැතිවරණ සඳහා ඡන්ද හිමි නාමලේඛන පිළියෙල කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ද, එම ඡන්ද පැවැත්වීම ද, එකී බලතල හා කාර්ය හා කර්තව්‍ය වල්ට ඇතුළත් වන්නේය.

(2). ඡන්ද විමසීම් සම්බන්ධ අදාල සියලුම නීති බලාත්මක කිරීම කොමිෂන් සභාවේ වගකීම වන අතර ඒ සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය සහයෝගය ලබාදීම රජයේ සියලු බලධරයන්ගේ වගකීම වන්නේය.

(3) කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියා ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුක්‍රමිකව

කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු වන්නේය. එක් එක් ලිත් වර්ෂයේදී කොමිෂන් සභාව විසින් සිදුකරන ලද කාර්යය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ වගකීම් වන්නේය.

(4). (අ) මැතිවරණයක් පවත්වන කාල පරිච්ඡේදය තුළදී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්.

(i) ඡන්ද විමසීමකදී තරඟ කරන අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම හෝ එසේ පත්කර ගැනීම වළක්වාලීමේ කාර්යය සඳහා භාවිතා කිරීම.

(ii) ඡන්දය විමසීමකදී තරග කරන අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් භාවිතා කිරීම කොමිෂන් සභාවේ උපදෙස් මත මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින් තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේය.

(ආ). එවැනි විධානයකට අවනත වීම සහ එය ක්‍රියාත්මක කිරීමට තත්කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළ පාලනය කරන සෑම තැනැත්තෙකුගේම සහ සෑම නිලධාරියෙකුගේම වගකීම වන්නේය.

(5).(අ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයෙහිලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යැයි කොමිෂන්

සභාව විසින් සලකනු ලබන විධාන සහ උපමාන සියලුම ගුවන්විදුලි, විද්‍යුත් මාධ්‍යය වෙත සහ මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතු වන්නේය. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධාන සහ උපමාන පිළිපැදීම සහ එම විධාන සහ උපමාන අනුව ක්‍රියා කිරීම සියලුම ගුවන්විදුලි විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍යවල වගකීම වන්නේය.

(ආ). (i) මැතිවරණ කොමිෂන් සභාව විසින් (4) වන අනු ව්‍යවස්ථාව සහ (5) වන අනු ව්‍යවස්ථාව ප්‍රකාර නිකුත් කරනු ලබන විධාන සහ උපමාන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් පලවන පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක පත් කළ යුත්තේය.

(ii) එකී විධාන සහ උපමාන ජනතාවගේ අවධානය සඳහා මැතිවරණ කොමිසම විසින් ගැසට් පත්‍රයේ පලකළ යුතු අතර එකී විධාන සහ උපමාන මැතිවරණ කොමිසම විසින් තීරණය කරනු ලබන නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක විය යුත්තේය.

(iii) මැතිවරණ කොමිසම විසින් නිකුත් කරන සෑම විධානයක්ම සහ උපමානයක්ම ගැසට් පත්‍රයේ පලකළ දිනයේ සිට මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුත්තේය. එකී විධාන හා උපමාන යටතේ ගන්නා ලද පියවර අනුමත කිරීමේ සහ ප්‍රතික්ෂේප කිරීමේ බලය පාර්ලිමේන්තුව සතු වන්නේය. එමගින් එම විධාන හා උපමාන යටතේ

මැතිවරණ කොමිසම විසින් ගන්නා ලද කිසිදු පියවරකට හානියක් නොවන්නේය.

228. (1). ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම සඳහා නියමයක් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි ඒ ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය සාමකාමීව පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණදැයි කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට දැනුම් දිය යුත්තේය.

(2). මෙම ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිසම විසින් කරනු ලැබූ දැනුම්දීමක් ප්‍රකාර පොලිස්පතිවරයා විසින් අවශ්‍ය පහසුකම් සහ පොලිස් නිලධාරීන් මැතිවරණ කොමිසමට සැපයිය යුත්තේ ය.

(3). කොමිෂන් සභාව වෙත සපයන පොලිස් නිලධාරීන් සහ පහසුකම්, නිදහස් සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම තහවුරු කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි මැතිවරණ කොමිසම විසින් යෙදවිය යුතු වන්නේය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත සපයන සෑම පොලිස් නිලධාරියෙකුම, ඡන්ද විමසීම් කාලසීමාව තුළ මැතිවරණ කොමිෂන් සභාවේ නියෝග පිළිපැදිය යුතු අතර එම සෑම පොලිස් නිලධාරියකුම කොමිෂන් සභාවේ විධි විධාන සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු වන්නේය.

(5). මේ ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත සපයන ලද යම් පොලිස් නිලධාරියෙකු විසින් කොමිෂන් සභාවේ විධානයන් ප්‍රකාර කර්තව්‍යය ඉටු කිරීමේදී ඔවුන් සද්භාවයෙන් ඉටු කරන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධව එම පොලිස් නිලධාරීන්ට එරෙහිව යම් නඩු කටයුත්තක් පැවරිය නොහැක්කේය.

229. ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම සඳහා නියමයක් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම ජනමත විචාරණය සාමකාමීව පැවැත්වීමට හානිදායක යම් ක්‍රියා හෝ සිද්ධීන් වැලැක්වීම හා පාලනය කිරීම සඳහා ආරක්ෂක හමුදා යෙදවීම යෝග්‍ය වන්නේ යැයි මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් ඒ සඳහා ආරක්ෂක හමුදාව යෙදවීමට අග්‍රාමාත්‍යවරයාට නිර්දේශ කළ හැක්කේය.

## මැතිවරණ කොමසාරිස් ජනරාල්

230. (1). මැතිවරණ කොමිසම විසින් පත් කරන, එම කොමිසම විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි වලට යටත්ව ක්‍රියා කරන මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් වන්නේය.

(2). මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සම්බන්ධව සලකා බලන අවස්ථාවල හැර කොමිසමේ රැස්වීම් වලට සහභාගි වීමට මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද කොමසාරිස් ජනරාල්වරයාට කොමිසම ගන්නා තීරණ සම්බන්ධව ඡන්දය භාවිතා කිරීමට හිමිකම නැත්තේය.

(3). මැතිවරණ කොමිසමේ නිර්දේශ මත කොමිසමේ තීරණයන් හා කොන්දේසි මත මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට කොමිෂන් සභාවේ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධාරීන් හා සේවකයන්යින් පත් කළ හැක්කේය.

(4). මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධාරීන්ගේ වැටුප්, කොමිෂන් සභාව විසින් තීරණය කළ යුත්තේ ය. ඔවුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

(5). මැතිවරණ කොමසාරිස් ජනරාල් ජනරාල්වරයා මැතිවරණ කොමිසමේ තීරණ හා විධාන වලට සහ පාලනයට යටත්ව ක්‍රියා කළ යුත්තේය. සභාවේ නිලධාරීන්ට පැවරෙන විෂයන් අධීක්ෂණය කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙත පැවරෙන්නේ ය.

(6). මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමිෂන් සභාවේ වෙනත් නිලධාරියකු වෙත පැවරිය හැක්කේ ය. කොමිෂන් සභාවේ විධානයන්ට හා පාලනයට යටත්ව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාවරයා සහ අනෙකුත් නිලධාරීන් ඔවුනට පැවරෙන කාර්ය හා කර්තව්‍ය ඉටු කළ යුත්තේය.

(7). මැතිවරණ කොමසාරිස් ජනරාල් ධූරය,

(අ). මිය යාමෙන්

(ආ). කොමිෂන් සභාව අමතා ඉදිරිපත් කරන ලියවිල්ලක් මගින් ධූරයෙන් ඉල්ලා අස්වීමෙන්

(ඈ). වයස අවුරුදු 65 සම්පූර්ණ වීමෙන්

(ඇ). ශාරීරික හෝ මානසික රෝගී භාවය හෝ දුර්වලතා මත මැතිවරණ කොමිසම විසින් ඔහුව ධූරයෙන් ඉවත් කිරීමෙන්,

(ඉ). විෂමාචාර චෝදනා මත හෝ අබලතා හේතු මත මැතිවරණ කොමිසම විසින් විධිමත්ව පරීක්ෂණයක් පවත්වා එම චෝදනා ඔප්පු වීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් ඉවත් කිරීමෙන් හිස් වන්නේය.

231. (1). කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින්, එක් එක් මැතිවරණ කොට්ඨාශය සඳහා තේරීම් භාර නිලධාරියකු වශයෙන් නමින් හෝ නිල නාමයෙන් තැනැත්තෙකු කලින් පත් කළ යුත්තේය. තේරීම් භාර නිලධාරීන්ගේ කාර්ය ඉටුකිරීමේදී ඔවුන්ට සහාය දීම පිණිස තැනැත්තන් නමින් හෝ නිල නාමයෙන් පත් කළ යුත්තේය.

(2). ඉහත (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ සෑම නිලධාරියකු වෙතම පවරන ලද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී, කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධිවිධාන වලට ඔහු යටත් විය යුත්තේය. කොමිෂන් සභාව වෙත ඔහු වගකිව යුත්තේය.

232. යම් ඡන්ද විමසීමක දී හෝ ජනමත විචාරණයක දී මැතිවරණ කොමිසම විසින් සේවයට කැඳවන ලද සියලුම රාජ්‍ය නිලධාරීන් ඒ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරන විධාන හා නියෝග වලට යටත්ව ක්‍රියා කළ යුත්තේය. ඔවුන් කොමිෂන් සභාව වෙත වගකිව යුත්තේය.

233\. (1). කිසිදු සාධාරණ හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව යම් ඡන්ද විමසීමක් පැවැත්වීමට හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාල යම් නීතියක් බලාත්මක කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව සමග සහයෝගයෙන් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීමට අපොහොසත් වන සෑම අයකුම වරදකට වරදකරු වන අතර, රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අවුරුදු තුනකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩයට සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුත්තේය.

(2). 227 වන ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයක් හා උපමාන වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තෙකුම සහ සෑම ආයතනයක්ම වරදකට වරදකරු වන අතර, රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අවුරුදු තුනකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඬුවමට සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුත්තේය.

(3). ඉහත (1) අනු ව්‍යවස්ථාව යටතේ සහ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ පවරන ලද නඩුවක් විභාග කර තීරණය කිරීමට සෑම මහාධිකරණයකටම අධිකරණ බලය ඇත්තේය. එවැනි නඩුවක් පවරා මාස දෙකක් ඇතුලත විභාග කර තීන්දු ප්‍රකාශ කිරීමට මහාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

(4). මැතිවරණ කොමිෂන් සභාව වෙත නීතියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මැතිවරණ කොමිසමට එරෙහිව ඉදිරිපත් කරන සෑම පැමිණිල්ලක්ම මාසයක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වන්නේය. එවැනි ඉල්ලීමක් මාස

දෙකක් ඇතුලත විභාග කර තීන්දු ප්‍රකාශ කිරීමට අභියාචනාධිකරණය නීතියෙන් බැඳී සිටින්නේය.

234. මේ පරිච්ඡේදය යටතේ 'ඡන්ද විමසීම් පැවැත්වෙන කාලසීමාව' යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණයක් හෝ වෙනත් ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව අවස්ථාවෝචිත පරිදි ඒ ජනමත විචාරණය හෝ ඡන්ද විමසීමේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන දිනය අවසන් වන කාලසීමාව අදහස් වන්නේය.

## XIV වන පරිච්ඡේදය

## ජනමත විචාරණය

235.(1) ජනතාවට තම නීති පැනවීමේ බලය සෘජුව ක්‍රියාත්මක කරමින් නව ජනරජ ව්‍යවස්ථාවක් බහුතර ජනතාවගේ මනාපයෙන් පිළිගෙන සම්මත කළ හැක්කේය. ජනතාව වෙත ඉදිරිපත් කර සම්මත කිරීමට යෝජිත නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී සෑම විටම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, බලතල බෙදීමේ සිද්ධාන්තය, කිසිවකුට උදුරාගත නොහැකි ජනතාව සතු පරමාධිකාරී බලය, මූලික අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය, විනිවිදභාවය, විශ්වාසවන්ත භාවයේ සිද්ධාන්තය සහ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය ජනතාවට වගකීම් තහවුරු කරන සහ ප්‍රවර්ධනය කරන ප්‍රතිපාදන යෝජිත ව්‍යවස්ථාවක ඇතුළත් වීම අනිවාර්ය වන්නේය.

(2) නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා වූ ඡන්ද විමසීමකදී ජනතාව ප්‍රකාශ කරන ඡන්ද ප්‍රමාණය ලියාපදිංචි ඡන්ද ප්‍රමාණයෙන් 2/3 ඉක්මවිය යුත්තේය. එසේ නොවන අවස්ථාවක, නව ව්‍යවස්ථාව සම්මත කරමින් ප්‍රකාශ කරන ඡන්ද ප්‍රමාණය ලියාපදිංචි ඡන්ද ප්‍රමාණයෙන් 1/3 කට නොඅඩු විය යුත්තේය.

(3) ජනතාව වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යවස්ථා කෙටුම්පතක් ජනතාව විසින් පිළිගෙන සම්මත කිරීමෙන් අනතුරුව ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව විසින් නව ව්‍යවස්ථාව පිළිගෙන විධිමත්ව සම්මත කර ජනරජයේ උත්තරීතර නීතිය ලෙස පනවන ලද බවට අග්‍රාමාත්‍යවරයා විසින් සහතික කළ යුත්තේය.

236. (1) ජනතාව විසින්ම ජනමත විචාරණයක දී පිළිගෙන තම ව්‍යවස්ථාදායක බලය සෘජුවම ක්‍රියාත්මක කරමින් සම්මත කළ යුතු පනත් කෙටුම්පතක් බව අග්‍රාමාත්‍යවරයා විසින් සහතික කරන ලද සෑම පනත් කෙටුම්පතක්ම සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එසේ තීන්දු කරන ලද සෑම පනත් කෙටුම්පතක්ම ජනතාවගේ අනුමැතිය සඳහා ජනමත විචාරණයකට ඉදිරිපත් කළ යුත්තේය.

(2). එවැනි පනත් කෙටුම්පතක් නීතිගත වීම සඳහා ජනතාව ප්‍රකාශ කරන ඡන්ද ප්‍රමාණය ලියාපදිංචි ඡන්ද ප්‍රමාණයෙන් 2/3 ඉක්ම විය යුත්තේය. එසේ නොවන අවස්ථාවක නව ව්‍යවස්ථාව සම්මත කරමින් ප්‍රකාශ කරන ඡන්ද ප්‍රමාණය ලියාපදිංචි ඡන්ද ප්‍රමාණයෙන් 1/3 කට නොඅඩු විය යුත්තේය.

(3). ජනතාව වෙත ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතක් ජනතාව විසින් පිළිගෙන සම්මත කිරීමෙන් අනතුරුව ජනරජයේ පරම අධිකාරිය වන ජනතාව විසින් නව පනත් කෙටුම්පත පිළිගෙන විධිමත්ව සම්මත කර ඇති බව අග්‍රාමාත්‍යවරයා විසින් සහතික කළ යුත්තේය.

237. (1) ජනමත විචාරණයක් ව්‍යවස්ථාව ප්‍රකාර විධිමත්ව පැවැත්වීම සහ එහි ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමේ වගකීම මැතිවරණ කොමිසම වෙත පැවරෙන්නේ ය.

(2). ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධ කාර්ය පටිපාටිය, භාවිතා කළ යුතු ඡන්ද නාමලේඛනය, හා ජනමත විචාරණය අවභාවිතා කිරීම සම්බන්ධ වැරදි සහ දඬුවම්, ඊට අදාළ අනෙකුත් අනුශාංගික කරුණු පිළිබඳව පාර්ලිමේන්තුව විසින් නීති සම්පාදනය කළ යුත්තේය.

## XV වන පරිච්ඡේදය

## නීතිපති

238. ජනතාව පරමඅධිකාරිය වන ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිගේ වගකීම ජනතාව නීතිපති ධූරය කෙරෙහි තබා ඇති විශ්වාසය ආරක්ෂා කරමින් ජනතාව වෙනුවෙන් පෙනී සිටීම හා ක්‍රියාකිරීම වන්නේය.

(i) ජනරජ ව්‍යවස්ථාවේ අරමුණු හා අපේක්ෂා බල ගැන්වීම වෙනුවෙන් පෙනී සිටීමේදී ස්වාධීනව පෙනී සිටීම හා ක්‍රියා කිරීම නීතිපතිගේ ව්‍යවස්ථාපිත වගකීම වන්නේය.

(ii) නීතිපතිගේ වගකීම රජය නියෝජිතයකු වශයෙන් පෙනී සිටීම නොව යුක්තිය පසිඳලීම සඳහා වෛෂයිකව, තාර්කිකව සහ ඕනෑකමින් ස්වාධීනව පෙනී සිටීම වන්නේය.

(iii) අධිකරණයට යුක්තිය කඩිනම්ව සාධාරණව පසිඳලීම සඳහා සහාය වීමට නීතිපති වගබලා ගත යුත්තේය.

239. නීතිපති ධූරය තමන්ට හෝ වෙනත් අයකුට වාසියක් හෝ ලාභයක් සිදු කිරීම සඳහා අවභාවිතා කිරීමේ චෝදනා මත නීතිපති පුද්ගලිකව වගඋත්තරකරු කරමින් මූලික අයිතිවාසිකම් නඩුකරයක් හෝ නීතිපතිට එරෙහිව රිට් ආඥාවක් ඉල්ලා පවරා ඇති නඩුකරයක අධිකරණය විසින් නීතිපතිට එරෙහිව ධූරය අවභාවිත කිරීම සම්බන්ධව තීන්දු ප්‍රකාශයක් කල අවස්ථාවක නීතිය ක්‍රියාත්මක වීමෙන් නීතිපතිවරයා වහාම ධූරයෙන් ඉවත් කෙරෙන්නේය. ධූරය අවභාවිත කිරීමේ බරපතලකම මත නීතිපති ජීවිතාන්තය

දක්වා සිර දඬුවමකට සහ දේපළ රාජසන්තක කිරීමට යටත් වන්නේය.

240. මෙම පරිච්ඡේදයේ නීතිපති යනුවෙන් නීතිපතිවරයා සහ යුක්තිය පසිඳලීමට අධිකරණයට සහාය වන නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකු අදහස් වන්නේය.

## XVI වන පරිච්ඡේදය

## ස්වාධීන පොලිස් කොමිෂන් සභාව

241. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත් කීර්තිමත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන ස්වාධීන පුද්ගලයින් හත් දෙනකුගෙන් සමන්විත ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් වන්නේය. කොමිසමේ සාමාජිකයින් විසින් එහි සභාපතිවරයා පත් කල යුත්තේය.

242. පොලිස් කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයින් තිදෙනෙකු වන්නේය.

243. කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සහ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි වලට යටත්ව අවශ්‍ය අනෙකුත් නිලධාරීන් කොමිෂන් සභාව විසින් පත්කළ යුත්තේය.

244. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

245. කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරන කරුණු කාරණා සම්බන්ධව කොමිෂන් සභාව විසින් නීති සම්පාදනය කළ යුත්තේය. එම සෑම රීතියක්ම ජනතාවගේ අවධානය සඳහා ගැසට් පත්‍රයේ පලකළ යුත්තේය.

246. කොමිෂන් සභාවේ හෝ එහි කමිටුවක තීරණ සඳහා කිසිදු ආකාරයකින් මැදිහත්වීම වරදක් වන්නේය. එවැනි වැරදි විභාග කිරීම සහ ඒ පිළිබඳ තීන්දු ප්‍රකාශ කිරීමේ අධිකරණ බලය ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය වෙත පැවරෙන්නේය. එවැනි වරදකට වරදකරු වන තැනැත්තෙකු රුපියල් දස

ලක්ෂය නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන දණ්ඩනයට හෝ එම දඩය සහ දණ්ඩනය යන දෙකටම යටත් වන්නේය.

247. (1) පොලිස්පතිවරයා හැර අනෙකුත් පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු වීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් නෙරපා හැරීම ඇතුළුව පොලිස් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ විනය පවත්වාගෙන යාමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරෙන්නේය.

(2) පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බලය අවභාවිත කිරීම සම්බන්ධව ඔවුන්ට එරෙහිව ජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි භාර ගැනීම හා එම පැමිණිලි විභාග කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරෙන්නේය. එම පැමිණිලි විභාග කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කිරීම කොමිෂන් සභාවේ වගකීම් වන්නේය. එම රෙගුලාසි ජනතාවගේ අවධානය සඳහා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සහ ගැසට් පත්‍රයේ පලකළ යුත්තේය.

(3) ජනතාව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිලි සම්බන්ධව මාස තුනක් ඇතුළත ස්වාධීන පරීක්ෂණයක් පවත්වා තීන්දු ප්‍රකාශ කලයුතු අතර කොමිෂන් සභාවේ අවසන් නිගමනය ජනතාවගේ අවධානය සඳහා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකළ යුත්තේය. කොමිෂන් සභාවේ අවසන් නිගමනය ප්‍රකාර වන්දි ප්‍රදානය කිරීමේ බලය කොමිෂන් සභාව සතු වන අතර පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව ප්‍රදානය කෙරෙන වන්දි චෝදනාවලට වරදකරු

වූ පොලිස් නිලධාරීන් විසින් තම පුද්ගලික දේපලින් ගෙවිය යුතු වන්නේය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය ගරුකරන නිදහස් පොලිස් සේවයක් පවත්වාගෙන යාම පිළිබඳ වගකීම ස්වාධීන පොලිස් කොමිෂන් සභාව වෙත පැවරෙන්නේය.

248. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයෙන් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අධිකරණ බලයට යටත්ව, කිසිදු අධිකරණයකට පොලිස් කොමිෂන් සභාවේ තීන්දු ප්‍රකාශයක් අභියෝග කළ නොහැක්කේය.

249. ස්වාධීන පොලිස් කොමිෂන් සභාව විසින් තීරණය කරන රෙගුලාසි හෝ කොන්දේසි වලට යටත්ව ව්‍යවස්ථාවේ 247 වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීම එහි අනු කමිටුවකට හෝ පොලිස්පතිවරයාට පැවරිය නොහැක්කේය.

250. ස්වාධීන පොලිස් කොමිෂන් සභාව විසින් පත්කරන අනු කමිටුවකට හෝ පොලිස්පතිවරයාට කොමිෂන් සභාවේ බලතල පවරා ඇති අවස්ථාවක එසේ පත්කරන ලද අනු කමිටුවේ හෝ පොලිස්පතිවරයාගේ තීරණයක් සම්බන්ධව අභියාචනාවක් විභාග කිරීම හැර හෝ එසේ පවරන ලද බලය විධිමත්ව ක්‍රියාත්මක නොකරන්නේ යයි කොමිසම සෑහීමකට පත් වන්නේ නම් හැර අන්‍යාකාරයකින් ස්වාධීන පොලිස් කොමිෂන් සභාව මැදිහත් නොවිය යුත්තේය.

251. ව්‍යවස්ථාවේ 247 වන වගන්තිය ප්‍රකාර ස්වාධීන පොලිස් කොමිෂන් සභාව ප්‍රකාශයට පත්කරන නියෝගයකින් හෝ තීන්දු ප්‍රකාශයකින් අතෘප්තියට පත් පාර්ශවයකට එම නියෝගයට හෝ තීන්දු ප්‍රකාශයට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත මසක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේය.

252. අවශ්‍ය වන්නේ නම් පමණක් පොලිස්පතිවරයාගේ අදහස් විමසා විනයගරුක, සාධාරණ හා කාර්යක්ෂම පොලිස් සේවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය රීති සහ විනය කාර්ය පටිපාටියක් ස්වාධීන පොලිස් කොමිෂන් සභාව විසින් සම්පාදනය කළ යුත්තේය.

253. ස්වාධීන පොලිස් කොමිෂන් සභාව වෙත පොලිස් දෙපාර්තමේන්තුව පරිපාලනය කිරීම සඳහා පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවශ්‍ය රීති, රෙගුලාසි හා ක්‍රමවේද සම්පාදනය කරන තුරු පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධව දැනට ක්‍රියා ක්‍රියාත්මක වන රීති, රෙගුලාසි හා ක්‍රමවේද කොමිෂන් සභාව විසින් පරිශීලනය කළ හැක්කේය.

254. ස්වාධීන පොලිස් කොමිෂන් සභාව එහි කටයුතු සම්බන්ධව පාර්ලිමේන්තුවට වගකිව යුතු වන්නේය. කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව වාර්ෂිකව වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේය.

## XVII වන පරිච්ඡේදය

## ස්වාධීන ප්‍රසම්පාදන කොමිෂන් සභාව

255. (1). අමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත පත් කරන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත (මෙම පරිච්ඡේදයේ මින් මතු සභාව නමින් හඳුන්වන) ප්‍රසම්පාදන සභාවක් වන්නේය. එම සාමාජිකයන් අතුරින් අවම වශයෙන් තිදෙනෙක් ප්‍රසම්පාදනය, විගණනය, නීතිය හෝ රාජ්‍ය පාලනය පිළිබඳ මනා අත්දැකීම් ඇති තැනැත්තන් විය යුත්තේය. එක් සාමාජිකයෙක් අග්‍රාමාත්‍යවරයා විසින් එහි සභාපති ලෙස පත් කළ යුත්තේය.

(2). සභාවේ සාමාජිකයින් අග්‍රාමාත්‍යවරයා අමතා යවන ලිපියකින් ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර ඉවත් කරනු ලැබුවහොත් මිස එම සාමාජිකයින් වසර පහක කාලයක් සඳහා ධූරය දරන්නේය.

(3). සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයෙකුටම පාර්ලිමේන්තුව මගින් යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන පරිශ්‍රයක් ගෙවිය යුතු වන්නේය. එය රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර සාමාජිකයන්ගේ ධූර කාලය තුළ එය අඩු නොකළ යුත්තේය.

256. (1). කොමිෂන් සභාව වෙත පැවරෙන කර්තව්‍ය ඉටු කිරීම සඳහා පැවැත්වෙන රැස්වීම් පිළිබඳ පටිපාටිය සභාව විසින් තීරණය කළ යුත්තේය. සභාවේ රැස්වීම් වල මූලාසනය සභාවේ සභාපතිවරයා විසින් දැරිය යුත්තේය.

සභාවේ සභාපති සහභාගී නොවන රැස්වීමක් සභාවේ සාමාජිකයෙකු විසින් මෙහෙය විය යුත්තේය.

(2). සභාව විසින් පවත්වන රැස්වීම් සඳහා ගණපූරණය තිදෙනෙකු වන්නේය. සභාවේ දී තීරණය බහුතර ඡන්දයෙන් විය යුතු අතර ඡන්දය සමාන වන විට සභාපතිවරයා හෝ සභාවේ මූලාසනය කරන සාමාජිකයාගේ ඡන්දය තීරක ඡන්දය වන්නේය.

257. සභාවේ කාර්ය මණ්ඩලයට ලේකම්වරයෙකු සහ සභාව තීරණය කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත වන්නේය. සභාවේ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ සභාවේ වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

258. සභාවේ සාමාජිකයෙකු හෝ වෙනත් නිලධාරියකු විසින් තම ධුරයට පැවරෙන කාර්යය හෝ කර්තව්‍ය ඉටු කිරීමේදී ස්වභාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරිය නොහැක්කේය.

259. (1). රජයේ සියලුම ආයතන විසින් භාණ්ඩ සහ සේවා, උපදේශක සේවා, තොරතුරු පද්ධති සම්පාදනය කිරීමේදී සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙන සුළු තරගකාරී, ඒ සඳහා දරන ලද වියදමට උපරිම ඵල ලැබෙන, ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපමාන සම්පාදනය කිරීම, එම උපමාන ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා එම උපමාන ඉදිරිපත් කිරීම සභාවේ වගකීම් වන්නේය.

**(2). ඉහත (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව;**

(අ). රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ සහ සේවා, උපදේශක සේවා, තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කිරීමේදී සභාව විසින් සම්පාදනය කරන ලද ක්‍රමවේද සහ උපමාන වලට අනුව ක්‍රියා කර ඇත්දැයි නියාමනය කිරීම.

(ආ). රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ සහ සේවා, උපදේශක සේවා, තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කිරීමේදී සැපයුම්කරුවන්ට විනිවිද පෙනෙන ආකාරයෙන් සමාන අවස්ථාවක් ලබා ඇත්දැයි පරික්ෂා කර බැලීම.

(ඇ). රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ සහ සේවා, උපදේශක සේවා, තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කිරීමේදී අනුගමනය කරන ලද ටෙන්ඩර් පටිපාටිය හා කොන්ත්‍රාත්කරුවන් තේරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය සහ විනිවිදභාවය පරීක්ෂා කිරීම.

(ඈ). ප්‍රසම්පාදනයට සම්බන්ධ සැපයුම් කමිටු වල සහ තාක්ෂණික ඇගයීම් කමිටු වල සාමාජිකයන්ගේ යෝග්‍යතාව ඔවුන් නිසි සුදුසුකම් ලත් තැනැත්තන් දැයි පරික්ෂා කිරීම.

(ඉ). ප්‍රසම්පාදන සභාව විසින් නියමු කරන ලද උපමාන වලට පටහැනිව ක්‍රියා කර ඇත්දැයි විමසිලිමත් වීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සහ සභාවේ තීරණ විගණකාධිපතිවරයාට වාර්තා කිරීම සහ ගැසට් පත්‍රයේ පළ කිරීම සභාවේ වගකීම වන්නේය.

260. (1) රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ සහ සේවා, උපදේශක සේවා, තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කිරීමට තීරණය කරන සෑම අවස්ථාවකම සභාව වෙත විධිමත්ව දැනුම් දියයුතු වන්නේය. රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විධිමත් විමර්ශනයක් කිරීමට සභාවට කිසිදු සීමාවකින් තොරව බලතල ඇත්තේය. එම බලතල ප්‍රකාරඃ

(අ). විධිමත් විමර්ශනයක් කිරීම සඳහා අවශ්‍ය යැයි සභාව තීරණය කරන ඕනෑම අයකු කැඳවීමට

(ආ). සභාව තීරණය කරන ඕනෑම වාර්තාවක්, ලිපියක් හෝ ලිපිගොනුවක් හෝ වෙනත් ඕනෑම ලේඛනයක් කැඳවීමට සභාවට බලය ඇත්තේය.

(2). අ). සභාව විසින් නිකුත් කරන ලද නොතීසියක් ප්‍රකාර කැඳවන ලද අයකු සභාව ඉදිරියේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම.

(ආ). සභාව විසින් කැඳවන ලද වාර්තාවක්, ලිපියක් හෝ ලිපිගොනුවක් හෝ වෙනත් ඕනෑම ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන්නේය.

(ඇ). එවැනි වරදකට වරදකරු වන තැනැත්තෙකු වසර 10 දක්වා සිර සිරදඬුවමකට හෝ වගකීම පැහැර හැරීමෙන් රජයට සිදු කරන ලද අලාභය දඩයක් වශයෙන් ගෙවීමට හෝ එම දඬුවම් දෙකටම යටත් වන්නේය.

(ඈ). එවැනි චූදිතයෙකුට එරෙහිව ජාතික ප්‍රසම්පාදන කොමිසමේ නිර්දේශ මත ප්‍රමාණවත් සාක්ෂි ඇත්නම් නීතිපතිවරයා විසින් මහාධිකරණයේ අධිචෝදනා මත මසක් තුළ නීතිපති නඩු පැවරීම යුත්තේය. එවැනි නඩුවක් විභාග කිරීමට අධිකරණයට අධිකරණ බලය පැවරෙන අතර එවැනි නඩුවක් මසක් තුළ විභාග කර තීන්දු ප්‍රකාශ කළ යුත්තේය.

261. මෙම පරිච්ඡේදයේ 'රාජ්‍ය ආයතන' යන්නෙන් සියලුම අමාත්‍යාංශ ඇතුළුව අග්‍රාමාත්‍ය කාර්යාලය, සියලුම රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද රජය 50% කට වැඩි කොටස් ප්‍රමාණයක් දරන්නා වූ සමාගමක් අදහස් වන්නේය.

## XVIII වන පරිච්ඡේදය

## පොදු විධිවිධාන

262. (1) ශ්‍රී ලංකා ජනරජය සහ වෙනත් විදේශ රාජ්‍යයක් අතර ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට, ජනතාව සතු පරමාධිකාරී බලයට සහ ජාතික ආරක්ෂාවට බලපෑමක් වන සෑම අන්තර්ජාතික ගිවිසුමක් පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන් ද සහිතව තුනෙන් දෙකකට නොඅඩු මන්ත්‍රී ප්‍රමාණයකින් අනුමත කරන යෝජනා සම්මතයක් මගින් සහ ව්‍යවස්ථාවේ (43) ව්‍යවස්ථාව අනුව ජනමත විචාරණයකින් ජනතාවගේ මතය ඊට පක්ෂව ලබා ගැනීමෙන් පමණක් ශ්‍රී ලංකාව තුළ බලාත්මක වන්නේය.

(2). එවැනි ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධ ක්‍රමවේදය 43 (2) ව්‍යවස්ථාවේ සඳහන් පරිදි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල වන්නේය.

263. (1). ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීම හෝ ජාතීන් අතර සමගිය බිඳීමට අනුබල දෙන ආකාරයේ කිසිම ක්‍රියාවක්, අනුබල දීමක් හෝ එවැනි අරමුණකින් ජනතාව පෙළඹවීමක්, මුදල් යෙදවීමක් හෝ ආධාර එකතු කිරීමක් නොකළ යුත්තේය.

(2). එවැනි අරමුණකින් කිසිම දේශපාලන පක්ෂයක් හෝ සංවිධානයක් ක්‍රියා නොකළ යුත්තේය.

(3). මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කරමින් නීති විරෝධීව ක්‍රියා කරන සෑම තැනැත්තෙකුම;

(අ). වරදක් කරන අතර එවැනි අරමුණකින් ක්‍රියා කරන සෑම තැනැත්තෙකුට හෝ කණ්ඩායමකට එරෙහිව අධි චෝදනා මත නඩු පැවරිය යුතු වන්නේය. එවැනි වරදකට වරදකරු වන අයකු;

(i) වසර 7 කට නොඅඩු වසර 10 කට නොවැඩි කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවයකට පත්වන්නේය.

(ii) ඔහුගේ සහ ඔහුගේ පවුලේ ජීවිකාව පවත්වාගෙන යාම සඳහා අධිකරණය විසින් තීරණය කරනු ලබන දේපල හැර ඔහුගේ සියලු දේපළ රාජසන්තක වන්නේය.

(iii) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නේ නම් හෝ වෙනත් මහජන නිලයක් දරන්නේ නම් හෝ වෙනත් සේවාවකට ඔහු අයත් වන්නේ නම් හෝ රජයේ වෙනත් ධූරයක් දරන්නේ නම්, එවැනි චෝදනාවකට වරදකරු වූ සැණින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහු දරන ධූරය අහිමි වන්නේය.

මෙම ව්‍යවස්ථාව යටතේ පනවන දණ්ඩනයක් වහාම ක්‍රියාත්මක වන අතර එවැනි තීන්දු ප්‍රකාශයට එරෙහිව අභියාචනා කිරීම එම දණ්ඩනය අත්හිටු වීමට හේතුවක් නොවන්නේය.

(4). ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීම හෝ ජාතික සමගියට හානි පැමිණෙන ක්‍රියාවන්හි යෙදීම හා එවැනි ක්‍රියා දිරිමත් කිරීම යම් දේශපාලන පක්ෂයක හෝ සංවිධානයක අරමුණක් වන්නේ නම් ජනරජය ඕනෑම පුරවැසියෙකුට එම දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයට එරෙහිව එම පක්ෂය හෝ සංවිධානයේ ප්‍රධානියා හෝ ලේකම්වරයා

වගඋත්තරකරුවකු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා එම දේශපාලන පක්ෂයේ හෝ සංවිධානයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී අරමුණු පවතින බව තහවුරු කිරීමේ තීන්දු ප්‍රකාශයක් ලබා ගත හැක්කේය.

(5). ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එවැනි තීන්දු ප්‍රකාශයක් කළ අවස්ථාවක

(අ). එම දේශපාලන පක්ෂය සහ සංවිධානය වහාම ක්‍රියාත්මක වන පරිදි තහනම් වන්නේය. එය දේශපාලන පක්ෂයක් වන්නේ නම් එම පක්ෂය සියලුම මන්ත්‍රීවරුන්ගේ ධුර අහෝසි වන්නේය. එවැනි පක්ෂයක හෝ සංවිධානයකට අයත් අයකු මැතිවරණයට නාමයෝජනා දී ඇත්නම් එම නාමයෝජනා වහාම අවලංගු වන්නේය.

(6). දිවුරුමක් මත ධූරයක් දැරීමට නීතියෙන් බැඳී සිටින සෑම නිලධාරියෙකුම, නීතීඥයකුම වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ අරමුණින් ක්‍රියා කිරීම වරදක් වන්නේය. අධි චෝදනා මත නඩු පැවරීමෙන් අනතුරුව එවැනි වරදකට වරදකරු වන අයකු;

(i). වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවයකට යටත් වන්නේය.

(ii). ඔහුගේ සහ ඔහුගේ පවුලේ ජීවිකාව පවත්වාගෙන යාම සඳහා අධිකරණය විසින් තීරණය කරනු ලබන දේපල හැර ඔහුගේ සියලු දේපළ රාජසන්තක වන්නේය.

(iii). ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නේ නම් හෝ වෙනත් මහජන නිලයක් දරන්නේ නම් හෝ වෙනත් ඔහු සේවාවකට අයත් වන්නේ නම් හෝ රජයේ වෙනත් ධූරයක් දරන්නේ නම් එවැනි චෝදනාවකට

වරදකරු වූ සැණින් ඔහු දරන ධූරය වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුට අහිමි වන්නේය.

මෙම ව්‍යවස්ථාව යටතේ පනවන දණ්ඩනයක් වහාම ක්‍රියාත්මක වන අතර එවැනි තීන්දු ප්‍රකාශයකට එරෙහිව අභියාචනා කිරීම එම දණ්ඩනය අත්හිටුවීමට හේතුවක් නොවන්නේය.

(7). මෙම ව්‍යවස්ථාව යටතේ ප්‍රජා අයිතිවාසිකම් යන්නෙන්

(අ). විදේශ ගමන් බලපත්‍රයක් දැරීමේ අයිතිය

(ආ). රජය පවත්වන යම් විභාගයට පෙනී සිටීමේ අයිතිය

(ඇ). යම් නිශ්චල දේපලක් දැරීමේ අයිතිය

(ඈ). යම් නීතියක් යටතේ ලියාපදිංචි වීමක් හෝ බලපත්‍රයක් අවශ්‍ය වන ඕනෑම ධූරයක් දැරීමේ අයිතිය අහිමිවීම අදහස් වන්නේය.

(8). යම් බලයක් හෝ අධිකාරියක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් නීතියක් යටතේ වෙනත් තැනැත්තකුට පැවරීමට යම් තැනැත්තෙකුට බලය පැවරී ඇති අවස්ථාවක ප්‍රජා අශක්නුතාවයකට පත් අයකුට හෝ පත් අයෙකු විසින් පවරන එවැනි බලයක් අවලංගු වන්නේය. මෙම ව්‍යවස්ථාව යටතේ වරදකට වරදකරු වන අයකුට පුද්ගලයකු මෙන්ම පුද්ගල මණ්ඩලයක් හෝ යම් අධිකාරියක් ද ඇතුළත් වන්නේය.

## XIX වන පරිච්ඡේදය

## අන්තර්කාලීන විධිවිධාන.

264. අ) ජනරජයේ පරමාධිකාරී බලධරයා වන ජනතාව වෙත ඔවුන්ගේ අත්හළ නොහැකි පරමාධිකාරී බලය ඍජුවම බලගන්වා සම්මත කිරීම සඳහා තම මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය සමග ඉදිරිපත් කරන ලද නව ජනසම්මත ජනරජ ව්‍යවස්ථාව ඉදිරිපත් කළ ජනාධිපති අපේක්ෂකයාගේ අයැදීම පිලිගෙන ජනතාව විසින් එම ජනරජ ව්‍යවස්ථාව ජනරජයේ උත්තරීතර නීතිය ලෙස සම්මත කිරීමත් සමගම විධායක ජනාධිපති ධූරයට ජනතාව විසින් ඡන්දයෙන් පත් කරන අපේක්ෂකයා විසින් එම ජන සම්මත ජනරජ ව්‍යවස්ථාව ජනතාව විසින් ඍජුවම තම ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරමින් ජනරජයේ උත්තරීතර නීතිය ලෙස පිළිගෙන විධිමත්ව සම්මත කළ බව සහතික කළ යුත්තේය.

ආ) එසැණින්ම ඔහු ජනතාව විසින් සම්මත කරන ලද එම ශ්‍රී ලංකා ජනරජයේ නව ජනරජ ව්‍යවස්ථාවේ IV උපලේඛනය ප්‍රකාරව ජනරජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් අධිකරණ සංවිධාන පනතින් බලය පවරා ඇති අයකු හමුවේ දිවුරුම් දිය යුත්තේය.

ඇ) ජනතාව විසින් තම ව්‍යවස්ථාදායක බලය ඍජුව ක්‍රියාත්මක කරමින් සම්මත කරන ලද නව ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස පිළිගෙන සහතික කිරීම ජනතාව තම ඡන්දයෙන් පත්කල අපේක්ෂකයා අසමත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් එම අපේක්ෂකයා තම ජනසම්මත ජනරජ ව්‍යවස්ථාව සමඟ තම මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය

මගින් ජනතාවට ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල නාම ලේඛනයේ දෙවන ස්ථානයේ නම් කර ඇති අමාත්‍යවරයා අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දෙනු ලබන්නේය. ඒ සමගම මැතිවරණ කොමිසම විසින් ජනාධිපති මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කල දින සිට නීතිය ක්‍රියාත්මක වීමෙන් නව ජන සම්මත ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස බලාත්මක වන්නේය. ජන සම්මත ජනරජ ව්‍යවස්ථාවේ 218 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් වලට යටත්ව එම අපේක්ෂකයාට අදාල වන්නේය.

265. ජනතාව විසින් තම උත්තරීතර නීතිය වශයෙන් පිළිගෙන නව ජනරජ ව්‍යවස්ථාව සම්මත කිරීමත් සමගම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) සහ එහි සංශෝධන සියල්ල වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු වන්නේය.

266. ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස බල ගැන්වීමෙන් අනතුරුව ජනාධිපති මැතිවරණයේදී ජනතාව විසින් පිළිගෙන පත් කල ජනාධිපති අපේක්ෂකයා ජනරජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් නව ජන සම්මත ජනරජ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වා නව අග්‍රාමාත්‍යවරයෙකු පත් කරන තෙක් අග්‍රාමාත්‍ය ධූරය දරනු ලබන්නේය.

267. නව ජනරජ ව්‍යවස්ථාව ජනතාව විසින් පිළිගෙන සම්මත කිරීමත් සමගම විධායක ජනාධිපති ධූරය සහ පළාත් සභා ක්‍රමය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු වන්නේය. පාර්ලිමේන්තුව වහාම විසිර යන්නේය.

268. අග්‍රාමාත්‍යවරයා විසින් ජන රජයේ විධායක බල රහිත ජනාධිපතිවරයෙකු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව පත් කළ යුත්තේය. ඔහුගේ ධූර කාලය 99 (1) වන ව්‍යවස්ථාව පරිදි වන්නේය.

269. (1). අමාත්‍ය මණ්ඩලය වශයෙන් පත් කිරීම සඳහා යෝජිත විසිහතර දෙනකුගෙන් සමන්විත නාමලේඛනයක් ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන ජනරජ ව්‍යවස්ථාව සමග ඉදිරිපත් කරන මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 1 වන ඇමුණුම වශයෙන් ඒ ඒ අමාත්‍යාංශයේ විෂය පථය සහිතව ජනතාවගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන නාමලේඛනය ජනතාව විසින් පිළිගෙන අනුමත කිරීමෙන් අනතුරුව අග්‍රාමාත්‍යවරයා ඇතුළුව 20 දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලය ජන රජයේ අමාත්‍ය මණ්ඩලය වශයෙන් පත්වන්නේය.

(2). අමාත්‍ය මණ්ඩලය අග්‍රාමාත්‍යවරයා ඉදිරිපිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (iv) උපලේඛනය ප්‍රකාරව දිවුරුම් දිය යුත්තේය. ඉන් අනතුරුව පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනතාව විසින් නව අමාත්‍ය මණ්ඩලය තෝරා පත් කිරීමෙන් පසුව (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද අමාත්‍ය මණ්ඩලය විසිර යන්නේය.

270. (1) ජනතාව විසින් නව ජනරජ ව්‍යවස්ථාව බලගන්වන අවස්ථාවේ ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක සභාව නව ජනසම්මත ජනරජ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ වහාම විසිර යන්නේය. ජනරජයේ පරම අධිකාරිය වන ජනතාවගේ

අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන ජනරජ ව්‍යවස්ථාව සමග ඉදිරිපත් කරන මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ (ii) වන ඇමුණුම වශයෙන් ජනතාවගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද යෝජිත ව්‍යවස්ථාදායක සභාව ජනතාව විසින් පිළිගෙන අනුමත කිරීමෙන් අනතුරුව එම ලේඛනයේ නම්වල අනුපිළිවෙලට 10 ගෙන් සමන්විත වන ව්‍යවස්ථාදායක සභාව පත් වන්නේය.

(2). එහි සභාපතිවරයා ව්‍යවස්ථාදායක සභාව විසින්ම පත් කරනු ලබන අතර ව්‍යවස්ථාවේ IV උපලේඛනය ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා ඉදිරිපිට ඔවුන් දිවුරුම් දිය යුත්තේය. ඉන් අනතුරුව පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනතාව විසින් නව ව්‍යවස්ථාදායක සභාව තෝරා පත් කිරීමෙන් පසුව 1 වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත්කරන ලද ව්‍යවස්ථාදායක සභාව විසිර යන්නේය.

271. නව ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස බල ගැන්වීමේ දින සිට වසරකට නොවැඩි කාලයක් තුළ 222 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාර පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්විය යුත්තේය.

272. පාර්ලිමේන්තු මැතිවරණය පවත්වා නව පාර්ලිමේන්තුව කැඳවන තුරු ජන රජයේ මූල්‍ය පාලන බලතල 269 (1) අනු අවස්ථාව ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේය.

273. ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස ජනතාව විසින් බල ගැන්වීමත් සමගම පාර්ලිමේන්තු සභාව විසින් අනුමත කරන ලද සියලුම ධූරයන් සඳහා 270 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරන ලද නව ව්‍යවස්ථාදායක සභාව විසින්

නොපමාව අලුතින් පත් කල යුත්තේය. ඒ සමගම එම ධූරයන් දරන ලද තැනැත්තන්ගේ සියලුම පත්වීම් අවලංගු වන්නේය.

274. ජනරජ ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය ලෙස ජනතාව විසින් බල ගැන්වීමත් සමගම ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සියලුම විනිසුරු ධූර අවලංගු වන්නේය. එම ධූරයන් සඳහා නව පත්වීම් ජනතාව අනුමත කරන ලද ව්‍යවස්ථාදායක සභාව විසින් වහාම පත්කල යුත්තේය. නව විනිසුරන් ජනරජ ව්‍යවස්ථාවේ iv වන උපලේඛනය ප්‍රකාර දිවුරුම් දිය යුත්තේය.

275. නව ජනරජ ව්‍යවස්ථාව බල ගැන්වීමත් සමගම ඊට අනනුකූල ජනරජය තුළ එම අවස්ථාව දක්වා ක්‍රියාත්මක වූ සියලුම උඩරට, තේසවලාමේ සහ මුස්ලිම් නීති, චාරිත්‍ර සහ සම්ප්‍රදායන් අවලංගු වන්නේය. එම අවලංගු කිරීම අතීතයට බල නොපාන්නේය. ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ජන වර්ගය මත හෝ ආගම හෝ සම්ප්‍රදායන් මත වෙන් කොට දැක්වීම සම්පූර්ණයෙන් නීති විරෝධී වන්නේය. නීතිය හමුවේ සෑම පුරවැසියෙකුම ශ්‍රී ලාංකිකයකු වශයෙන් පමණක් පිළිගනු ලබන්නේය.

## XX වන පරිච්ඡේදය

## අර්ථ නිරූපණය

276. 'පවත්නා නීතිය' සහ 'පවත්නා ලිඛිත නීතිය' යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ බලපැවැත්වූද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නා වූද, නීතියක් අදහස් වන්නේය.

'උපලේඛනගත රජයේ නිලධාරියා' යන්නෙන් සියලුම අධිකරණ වල රෙජිස්ට්‍රාර්වරු, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරු, පිස්කල්වරු නියෝජ්‍ය පිස්කල්වරු අධිකරණ සේවයේ නියුතු වෙනත් රජයේ නිලධාරියකු අදහස් වන්නේය.

'රජයේ නිලධාරියා' යන්නෙන් අධිකරණ නිලධාරියෙකු හැර රජයේ වැටුප් හෝ පරිශ්‍රමික ලබන සෑම තැනැත්තෙක් ම අදහස් වේ. 'දේශීය ජල තීරය' යන්නෙන් ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය අදහස් වන්නේය.

'පළාත් පාලන ආයතනය' යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන කාර්ය හා කර්තව්‍ය කරන කවර හෝ වෙනත් අධිකාරියක් ද ඊට ඇතුලත් වන්නේය.

'රාජ්‍ය සංස්ථාව' යන්නෙන් සමාගම් නීතිය හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද රජය විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ප්‍රදානය කරන ලද ණයක් හෝ ප්‍රාග්ධනයක් සපයන සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වන්නේය.

'රාජ්‍ය ආරක්ෂාවට අවදානමක් නොවන තොරතුරු' යනුවෙන් ජාතික ආරක්ෂාවට බලනොපාන එසේම ප්‍රසිද්ධ කිරීම

නීතියෙන් තහනම් නොකරන ලද හෝ සීමා නොකරන ලද තොරතුරු අදහස් වන්නේය.

'පිළිගත් දේශපාලන පක්ෂය' මැතිවරණ කොමිසම විසින් පිළිගත් දේශපාලන පක්ෂයක් අදහස් වන්නේය.

'වයෝප්‍රාප්තියට පත්වීම' යන්නෙන් වයස අවුරුදු දහ අට සම්පූර්ණ වී තිබීම අදහස් වන්නේය.

# පලවන උපලේඛනය

# පරිපාලන දිස්ත්‍රික්කවල නාම ලේඛනය

1. කොළඹ
2. ගම්පහ
3. කළුතර
4. මහනුවර
5. මාතලේ
6. නුවරඑළිය
7. ගාල්ල
8. මාතර
9. හම්බන්තොට
9. යාපනය
11. කිලිනොච්චිය
12. මන්නාරම
13. වවුනියාව
14. මුලතිව්
15. මඩකලපුව
16. අම්පාර
17. ත්‍රිකුණාමලය
18. කුරුණෑගල
19. පුත්තලම
20. අනුරාධපුරය
21. පොළොන්නරුව
22. බදුල්ල
23. මොනරාගල
24. රත්නපුර
25. කෑගල්ල

# දෙවන උපලේඛනය

# ජාතික කොඩිය



# තුන්වන උපලේඛනය

# ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී .... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනි සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්තී පූජා
නමෝ නමෝ මාතා

අප ශ්‍රී .... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබමය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින් රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා

நமதோர் ஒளி வளமே
நறிய மலர் என நிலவும் தாயே
யாமெல்லாம் ஒரு கருணை அனைபயந்த
எழில்கொள் சேய்கள் எனவே
இயலுறு பிளவுகள் தமை அறவே
இழிவென நீக்கிடுவோம்
ஈழ சிரோமணி வாழ்வுறு பூமணி

ප්‍රේම වඩා සැම භේද දුරැර දා නමෝ නමෝ මාතා
අප ශ්‍රී..... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා


# හතරවන උපලේඛනය

# දිවුරුම් ප්‍රකාශය

.................................................. වන මම .................................. ධූරයේ කාර්ය හා කර්තව්‍ය ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ රටේ නීතියට අනුකූලවත්, අවංකවත්, නීති ගරුකවත් ජනතාව මා කෙරේ තබා ඇති විශ්වාසය ආරක්ෂා කරමින් ඉටු කරන බවටත්, නීතියේ ආධිපත්‍ය සහ අධිකරණයේ ස්වාධීනත්වය ගරු කරන බවටත්, ජන රජයේ පරම අධිකාරිය වන ජනතාව සතු ඔවුන්ගේ පරම අධිකාරී බලය පිළිගෙන ගරු කිරීමටත්, ජනරජයට පක්ෂපාතී වන බවටත් මෙයින් ගෞරව අභිමානයෙන් යුතුව ප්‍රතිඥා දෙමි / දිවුරුම් දෙමි.

# පස්වන උපලේඛනය

# ශ්‍රී ලංකාවේ පළාත් දහය





ලෝකයේ කිසිම රටකට නොදෙවෙනි ආකාරයේ ස්වභාවික සම්පත් වලින් අනූන ශ්‍රී ලංකාවේ අභාග්‍ය වන්නේ 1948 න් පසුව රටේ ප්‍රගමනය සහතික කිරීමට සමත් ප්‍රබල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බල ගැන්වීමට කිසිවෙකු හෝ අසමත් වීමය. එමගින් රටේ නීතියේ ආධිපත්‍ය දුර්වල වීමට ඉඩ හැරීමය. ශ්‍රී ලංකාව මේ වන විට නීතියේ ආධිපත්‍ය, නීතිය හමුවේ සමාන රැකවරණය හා අධිකරණයේ ස්වාධීනත්වය ඇතුලු බලතල බෙදීමේ සිද්ධාන්තය යන සිද්ධාන්ත තව දුරටත් ක්‍රියාත්මක නොවන රටක් බවට පත්ව ඇත.

දැනට ක්‍රියාත්මක වන ජනරජ ව්‍යවස්ථාවෙන්ම අධිකරණය, ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ ග්‍රහණයට පත්කර මුළුමනින්ම අඩපණ කර ඇති අතර, දූෂණයට ඇති සීමා බන්ධන ඉවත් කොට ඇත. රාජ්‍ය යාන්ත්‍රණයේ විවිධ ධූර දරන තැනැත්තන් තමන්ට පැවරී ඇති බලතල අවභාවිතා කරන විට, ජනතාවගේ අධිකරණ බලය බලගැන්වීමේ වගකීම පැවරී ඇති අධිකරණය මෙම තත්වය යටතේ අකර්මන්‍ය වී ඇත.

මෙම තත්වය යටතේ සම්පත් බෙදී යාමේ අසමතුලිතතාව තවදුරටත් පාලනය කළ නොහැකි තත්වයක් වර්ධනය වී ඇත. දූෂිත පාලකයින් රටේ පොදු සම්පත් රිසි සේ මංකොල්ල කයි. ජනතාව දරිද්‍රතාවයේ පත්ලටම ඇද දමමින් ඔවුන්ගේ ආත්ම ගරුත්වය හා ආත්ම අභිමානය අහිමි කර ඇත. ජනතාව තමන් සතු පරම අධිකාරී බලය ක්‍රියාත්මක කරන ආයතන කෙරෙහි තබා ඇති විශ්වාසය මුළුමනින්ම බිඳ වැටී ඇත. ඔවුන් දූෂණය අනුමත කරන තැනට තල්ලු වී ගොස්, අඩුවෙන් දූෂණයෙහි යෙදෙතියි තමන් කල්පනා කරන තැනැත්තන් වෙත ඇදී යන ස්වභාවයක් පැහැදිලිව දක්නට ඇත.

ත්‍රිවු වෙමින් පවතින සමාජ අසහනය යටපත් කිරීමට ජාති, ආගම් භේද ප්‍රබල අවි ලෙස භාවිතා කෙරෙයි. රාජ්‍ය යාන්ත්‍රණය තුළ අවනීතිය රජ කරන පසුබිමක සංවිධානාත්මක අපරාධ, ත්‍රස්තවාදය, අන්තවාදය මෙන්ම වසංගත රෝග, ගබ්සා කිරීම් වැනි සමාජ පිළිලයන් ඉතා වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මත්ද්‍රව්‍ය උවදුර පාසල්, උසස් අධ්‍යාපන ආයතන, වැඩබිම් හා පෞද්ගලික කුටුම්බයක් ආක්‍රමණය කරමින් පවතී. ළමා අපචාර හා ස්ත්‍රී දූෂණ එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය සිද්ධීන් බවට පත්ව ඇත. මේ අනූව නීතියේ අධිපත්‍යය බිඳ වැටීම රටේ ස්වාධීනත්වය සහ ජාතික ආරක්ෂාවට එල්ල කර ඇත්තේ මරු පහරකි. එමෙන්ම දැරිය නොහැකි විදේශ ණය බර හේතුවෙන් රටේ ස්වෛරීත්වය අහිමිවීමේ බරපතල තර්ජනයකට මුහුණ දී සිටී.

මෙම ව්‍යවසනයන්ගෙන් මාතෘ භූමිය රැක ගැනීමට නව ප්‍රායෝගික විසඳුම් ගවේෂණය කල යුතු වේ. ඒ සඳහා නාගානන්ද පිළිගන්නා එකම ක්‍රමවේදය වන්නේ ජනතාව විසින්ම තම පරම අධිකාරී බලය ක්‍රියාත්මක කරමින් සම්පාදනය කර එම ජනතාව විසින්ම බලගන්වනු ලබන නව ජන සම්මත ජනරජ ව්‍යවස්ථාවක් කෙරෙහි විශ්වාසය තැබීම පමණය.